YUGATHARA

# යුගතර

## ශාස්ත්‍රීය සංග්‍රහය

(තෙවන වෙළුම)

## උරුම අධ්‍යයන කේන්ද්‍රය

කැලණිය විශ්වවිද්‍යාලය

# යුගතර

## ශාස්ත්‍රීය සඟරාව

### තෙවන වෙළුම

2021

උරුම අධ්‍යයන කේන්ද්‍රය

කැලණිය විශ්වවිද්‍යාලය

**යුගතර ශාස්ත්‍රීය සඟරාව**

ප්‍රකාශන අයිතිය © 2021

උරුම අධ්‍යයන කේන්ද්‍රය, කැලණිය විශ්වවිද්‍යාලය

යුගතර ශාස්ත්‍රීය සඟරාව - තෙවන වෙළුම 2021

**ISSN 2827-7430** (විද්‍යුත්)

**ISSN 2682-7123** (මුද්‍රිත)

**කංචුක නිර්මාණය :** රුමල් වින්දුල බණ්ඩාර

**පරිගණක පිටු සැකසුම :** සිතුමි දිල්ෂා බොතේජු

**ප්‍රකාශනය :** උරුම අධ්‍යයන කේන්ද්‍රය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

යුගතර ශාස්ත්‍රීය සඟරාව තුළ පළකෙරෙන සියලුම ශාස්ත්‍රීය ලිපිවල වගකීම කර්තෘවරුන් සතුවන අතර යුගතර ශාස්ත්‍රීය සඟරාවෙහි සංස්කාරකවරුන් විසින් එම ලිපි තුළ අන්තර්ගත කරුණු සහ දෝෂ පිළිබඳව කිසිඳු වගකීමක් නොදරයි.

# යුගතර ශාස්ත්‍රීය සඟරාව

# YUGATHARA

**උරුම අධ්‍යයන කේන්ද්‍රය**

**කැලණිය විශ්වවිද්‍යාලය**

**ශ්‍රී ලංකාව**

---

*තෙවන වෙළුම* *2021*

---

කැලණිය විශ්වවිද්‍යාලයෙහි උරුම අධ්‍යයන කේන්ද්‍රය මඟින් ප්‍රකාශයට පත්කරනු ලබන වාර්ෂික ශාස්ත්‍රීය සඟරාව ලෙස යුගතර ශාස්ත්‍රීය සංග්‍රහය ගෙන දැක්විය හැක. ද්විභාෂා සඟරාවක් වන මෙය උරුමය හා සම්බන්ධ වූ ඕනෑම විෂය ධාරාවක් යටතේ පර්යේෂකයින්, විද්‍යාර්ථීන් සහ නොයෙක් විද්වතුන් විසින් ඉදිරිපත් කරනු ලබන ශාස්ත්‍රීය ලිපි වෙත විවෘත වූවකි. යුගතර ශාස්ත්‍රීය සංග්‍රහය වෙත ඉදිරිපත් කරනු ලබන ශාස්ත්‍රීය ලිපි එකී විෂය පථයන්හි ප්‍රවීණයින් ලවා විමර්ශනයට ලක්කරනු ලබන අතර ඉහළ ශාස්ත්‍රීය අගයකින් යුතු ඵලදායී ලිපි පෙළක් යුගතර ශාස්ත්‍රීය සංග්‍රහය හරහා ඉදිරිපත් කිරීමට සැමවිටම කටයුතු කරනු ඇත.

**ආචාර්ය මංගල කටුගම්පොළ**

ප්‍රධාන සංස්කාරක - යුගතර ශාස්ත්‍රීය සංග්‍රහය,

අධ්‍යක්ෂක,

උරුම අධ්‍යයන කේන්ද්‍රය, කැලණිය විශ්වවිද්‍යාලය

**අනුශාසකවරු**

**මහාචාර්ය නිලන්ති ද සිල්වා**

උපකුලපති, කැලණිය විශ්වවිද්‍යාලය

**උපදේශකවරු**

**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එන්. ඒ. කේ. පී. ජේ. සෙනෙවිරත්න**
පීඨාධිපති, පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

**මහාචාර්ය එම්. එම්. ගුණතිලක**
පීඨාධිපති, සමාජීයවිද්‍යා පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

**ආචාර්ය සුදත් සෙනරත්**

පීඨාධිපති, මානව ශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

**උපදේශක සංස්කාරකවරු**

**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ගාමිණී අධිකාරි**
අධ්‍යක්ෂක, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, කැලණිය විශ්වවිද්‍යාලය

**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය මාලිංග අමරසිංහ**
පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

**ප්‍රධාන සංස්කාරක**

ආචාර්ය මංගල කටුගම්පොළ

අධ්‍යක්ෂක, උරුම අධ්‍යයන කේන්ද්‍රය, කැලණිය විශ්වවිද්‍යාලය

**සංස්කාරකවරු**

**සිතුමි දිල්ෂා බොතේජු**

පර්යේෂණ සහකාර, උරුම අධ්‍යයන කේන්ද්‍රය, කැලණිය විශ්වවිද්‍යාලය

**ඩී. එස්. අනුශාන් මුණසිංහ**

සහකාර කථිකාචාර්ය, පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

# පටුන


1. Restudy of Kotahalu Yaagaya at Anuradhapura in Sri Lanka .......01
2. උරුම සන්නිවේදනයට වෙබ් මාධ්‍යයේ ඇති දායකත්වය (මධ්‍යම සංස්කෘතික අරමුදලේ නිල වෙබ් අඩවියට විශේෂිතව) ......................14
3. ලක්දිව පැරණි පුස්කොළ ලේඛනවල ඇති වැදගත්කම සහ වර්තමානය වන විට ඒවා ආරක්ෂා කිරීමට විවිධ ආයතන විසින් දරන ලද ප්‍රයත්නයන්…………………………………………………..24
4. An Important Yet Almost Overlooked Museum Visitor Group: An Assessment of Heritage Interpretation Available for Children at Sri Lankan Museums …………………………………………….. 34
5. පුරාවිද්‍යා උරුම කළමනාකරණය කෙරෙහි හානි ඇගයීම් ක්‍රියාවලියේ (AIA) බලපෑම ජාතික උදාහරණ ඇසුරින් අධ්‍යයනයක් ……………47
6. බත් මාලාව ශාන්තිකර්මයේ කව්වලින් නිරූපිත වන්නියේ ගැමි විශ්වාසවල මූලයන් .....................................................................55
7. A Study of Companies That Produced Civil Engineering and Mechanical Technology Heritage in Sri Lanka During the British Period ........................................................................................66
8. පරාක්‍රම සමුද්‍රයේ ජල කළමනාකරණය තුළින් අනාවරණය කරගත හැකි තත්කාලීන සමාජයේ තිරසාරත්වය ………………………………...73
9. උරුම සංරක්ෂණය ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා උරුමයට එල්ල වී ඇති කාලීන අභියෝග හා මෙරට පුරාවිද්‍යා ආඥාපනතින් ඒවාට ගලපා ගත හැකි ප්‍රතිපාදන ……………………………………………………………84
10. පානම උප සංස්කෘතික ඒකකය ආශ්‍රිත අස්පෘෂ සංස්කෘතික උරුමයන් හා ඒවායෙහි වර්තමාන අනාගත ප්‍රවණතාවන් පිරික්සීමක් ………..101
11. කෞතුක වස්තු සංරක්ෂණ ක්‍රියාවලියේ දී මහජනතාවගේ දායකත්වය……………………………………………………..110

# Restudy of Kotahalu Yaagaya at Anuradhapura in Sri Lanka

**Y.D. Jayatilleke[1], A.A.J. Jayasiri[2], C. Mudalige[3], and D. Dewapura[4]**

[1-3] University of Sri Jayewardenepura, Sri Lanka

[4] Gampaha Wickramarachchi University

yasanjalee@sjp.ac.lk

## *Abstract*

*Since Sinhalese people consider puberty as a special event in a young girl's life, they perform many customs and rituals from the ancient past. The secondary socialization process has been beginning at this event and thereby internalizing the future responsibilities as a woman, wife, and mother in the girl's mind. This celebration is referred to as Kotahalu Mangalya and it contained many meaningful customs and practices. When a girl attained puberty in an inauspicious time Kotahalu Yaagaya is performed by Sinhalese shamans after her seclusion period of her. The principal researcher conducted a deep study on this ritual in 1990 at Pandulagama in Anuradhapura. In fact, she was one of the eyewitnesses who had watched this ritual when performed over one whole night by shamans of Nochchiyagama, Anuradhapura in Sri Lanka. Twenty-three years after that study, the group of present researchers have revisited twice to the same area in 2013 and 2016 and conducted a restudy. The research problem of this study was why this historically valued cultural event had disappeared from society and the reasons for failing to resurrect it. Then, the objectives of this research were to restudy and understand the contemporary status of the same ritual and tried to reform it, after more than two decades after the first study in 1990. Further, it is interesting to study the reasons and factors for this kind of cultural event becoming disappear with the passage of time. It is also important to study the reasons for this type of cultural event becoming obscure with the passage of time. The purposive sampling method was carried out for the present data collection. Basically, qualitative data was gathered by employing the interview method, including in-depth interviews. Narrative analysis was occupied as the major analytical method of the study. Among them, fifteen key informants were eyewitnesses as well as the women who were subjected to this ritual. Finally, researchers compared data which were gathered more than two decades back, and data gathered two decades after the first study. Sedaraman (1968), explained the many reasons for fading this ritual in the present society. Among them, one is that since the shamans are looking down and their successors are reluctant to continue the shaman tradition like their ancestors. In fact, Sedaraman's this explanation was proved by the experiences of researchers' regarding the attempt of resurrecting Kotahalu Yaagaya. Young descendants of shamans at Nochchyagama lineage made an attempt to learn and perform it. But they completely failed and gave up the task due to difficulties to recite verses of this unique ritual as they were not practiced it since their childhood. It is extremely difficult to reconstruct this diminished cultural event, namely the Kotahalu Yaagaya which consists of many tuneful and meaningful verses. Accordingly, like many other cultural events, Kotahalu Yaagaya also has become history.*

***Keywords****: - Kotahalu Yaagaya, Puberty Ritual, Sinhala Culture, Socialization, Shamans*

## Introduction

Rites of passage are considered of utmost importance in Sinhala culture, and they perform many customs and rituals during these life events. Among them reaching puberty is a very important event in a girl's life and it has been celebrated since the ancient past. The secondary socialization process has been beginning at this event and therefore, the main objective of this grand event is to internalize the future responsibilities as a woman, wife, and mother in a girl's mind. This outstanding celebration is referred to as *Kotahalu Mangalya* and it contained many meaningful customs and practices. When a girl attained puberty in an inauspicious time *Kotahalu Yaagaya* is performed by Sinhalese shamans after the seclusion period of her. This special ritual performs by the shamans those who belong to a special caste called *'Rajaka'* or *'Ridee'.* In fact, the word *Kotahalu* was a distinguished word that had been offered by the Sinhala king to these special shamans to honor for their magnificent performance of this ritual.

In Sinhala culture, reaching puberty is a very important event in a girl's life and it has been celebrated since time immemorial. These grand celebrations leading to the girl being taken out of doors are referred to as *Kotahalu Mangalya. Kotahalu Yaagaya* is performed during the puberty of a girl. If she has attained puberty at a non-auspicious time this ritual was performed by shamans belonging to a special caste called *'Rajaka'* or *'Ridee'.* The objective of this ritual, which was performed throughout the night, was to educate the girl on the important episodes of a woman's life. The principal researcher conducted a deep study on this ritual in 1990 at Pandulagama in the Anuradhapura area. In fact, she was one of the eyewitnesses who had watched this extinct ritual when performed over one whole night by shamans of Nochchiyagama, in Anuradhapura. Twenty-three years after that study, the present researchers have revisited, the same area in 2013 and 2016 to conduct research again. Accordingly, the objectives of this research were to restudy

and understand the contemporary status of the same ritual and attempted to resurrect it, after more than two decades after the first study.

**The Research Problem**

The research problem of this study was why this historically valued cultural event had disappeared from society and the reasons for failing to resurrect it.

**Objectives**

i. Then, the objectives of this research was to restudy and understand the contemporary status of the same ritual and tried to reform it, after more than two decades after the first study in 1990.

ii. Further, it is interesting to study the reasons and factors for this kind of cultural event becoming disappear with the passage of time.

iii. It is also important to study the reasons for this type of cultural event becoming obscure with the passage of time.

**Methodology**

A purposive sampling method was carried out for the data collection. Qualitative data was gathered by employing the interview method, including in-depth interviews using a semi-structured interview schedule. Among them, fifteen key informants were eyewitnesses as well as the women who were subjected to this ritual. These informants were selected based on judgment and purposive sampling technique. Finally, researchers compared data that were gathered more than two decades back, and data gathered two decades after the first study. Thus, researchers could be able to accumulate information on the contemporary status of *Kotahalu Yaagaya*. Additionally, researchers met with descendants of the Nochchiyagama lineage and attempted to resurrect this extinct ritual too. Collected data were analyzed by

narrative analysis and it focused on using the stories and experiences shared by people to answer the research question.

**Results and Discussion**

***Performing of Kotahalu Yagaya***

According to the respondents who provide the data, *Kotahalu Yaagaya* was popular in the Anuradhapura until the decade of the 1960s. But this ritual no longer exists, since all shamans who had been equipped with traditional knowledge of performing *Kotahalu Yaagaya* are no more alive.

A girl who has reached puberty is eligible for marriage and therefore she should have a proper understanding of sexual matters. The verses titled '*Gabha Uppaththiya*' (getting pregnant) in the *Kotahalu Yaagaya* provide the sex education needed for an attained girl. Unlike the present day, the ancient young women did not have the opportunities of learning from books and mass media. Therefore, the attempt made through the verses of '*Gabha Uppaththiya*' in the *Kotahalu Yaagaya* is extremely useful in imparting sex education to young women (Jayatilleke, 2010).





***Figure 01 and 02:*** *The special hut constructed for kotahalu yaagaya*



***Figure 03:*** *The shamans performing the blessing, wearing the wendama and the hand bangles.*



***Figure 04:*** *The girl stays overnight keeping her feet on the ceremonial dock*

*Sathosa wadana mithurani ahapan*
*Mama dan melesa kiyanu pada sathutu sithin*
*Nidosa bilindu wadumata anganun*
*Nisi koi wayaseda mata kiyan diyan (1990)*

**Meaning:**

Friend, who brings joy, please listen to the verses that I am singing merrily. Let me know the suitable age for a young woman to give birth to a child.

*Suwa satha hata upathak ethi wilasata*
*Kawuruth danagena ethi dan bohokota*
*Awurudhu dahasaya pirunoth elanduta*
*Kiudaru upadithi ethanin pasuwata*

**Meaning:**

Now it is evident that once a woman reaches the age of sixteen (16), she is in a position to give birth to children thereafter.

*Thun dina athulatha rudiraya dutu thana*
*Kamrasa vidhimen sathahata leda ena*
*In dahasaya dina thula daru pala dena*
*Min mathuwata dharuwan noma upadina*

**Meaning:**

It is explained clearly in the above verse how to indulge in sexual activities in a healthy and fruitful married life.

Having sexual intercourse during the first three days of the menstrual period would lead to diseases and from then onwards the next sixteen days (16) are ideal for having sex to get conceived. After this period conception is impossible.

The next verse explains further the knowledge they had about the sexual intercourse.

*Kama sapehi nirathuruwa kamathi wana*
*Prema ithiri dedenek ek weemena*
*Booma raga paha kara gaththoth dena*
*Keema kusehi ata naththek upadina*

**Meaning:**

This verse indicates that lesbian activities are not encouraged.

*Loba kota kavi boo se – dan nuba*
*Hema than paraka se*
*Gaba upadina ma se*
*Kiyapan nova roo se*

**Meaning:**

Be generous to recite more verses, without boasting and without getting antagonized, please tell us how a child is conceived.

*Kuhul Wenda mokatada dhagalanne*
*Awul sandu bas motada kiyanne*
*Wipul palamuweni gabhaya landunne*
*Sewel wathura piri dalabuwa wanne*

**Meaning:**

Why do you have doubts? Why do you speak in a provocative tone? The human embryo in a womb is like a caterpillar in a pool of greasy water.

*Dasa masa pirila bihiwena kala kumarunne*
*Is mas dan bihi wennata siritha bolanne*
*Dosa wadi unu thana wenas wela bihiwanne*
*Kohomada koi sitiyata dei thawa pawasanne*

**Meaning:**

On completion of ten months, normally the head of the baby comes out first. But due to some fault, the baby may come out in a different orientation, please tell us more details on the childbirth.

*Dasa masa pirila bihiwena kala* *kumarunne*
*Is mas dan bihi wannata siritha* *bolanne*
*Dosa wadi unu thana wenas wela* *bihiwanne*
*Kohomada koi sitiyata dei thawa* *pawasanne*

**Meaning:**

On completion of ten months, normally the head of the baby comes out first. But due to some fault, the baby may come out in a different orientation, please tell us more details on the childbirth.

a. Diminishing of Kotahalu Yaagaya

It is also important to investigate the reasons for this type of cultural event becoming obscure with the passage of time. Sedaraman's (1968) explanation in this regard is that, with the decline of the prosperity of a society, people tend to retain only the rituals which they can afford and let the rest disappear. According to astrology, there are some cases where the time of attainment of a girl is inauspicious. Sederaman (1968) further states that at present the expenditure incurred in performing the *Kotahalu Yaagaya* is unaffordable to many people. Therefore, in spite of the fact that this *Yaagaya* helps to eliminate the evil effects of the inauspicious time of attainment of a girl, most villagers are unable to afford this.

The economic hardships experienced by the villagers largely contribute to the disappearance of such important rituals as this *Yaagaya*. Sedaraman (1968) provides another reason for the disappearance of *Kotahalu Yaagaya*, according to which less expensive white magic has replaced it. He also mentions that the shamans are looked down in the present society, and their children and grandchildren do not continue the shaman tradition. Therefore, with the demise of the remaining shamans, the *Kotahalu Yaagaya* disappeared from the villages.

b. Re- studying and Resurrecting Kotahalu Yaagaya

The principal researcher saw the last ‘Kotahalu Yoagaya’ which had performed on 19th March 1990 at Pandulagama of North Central Province in Sri Lanka. It should be described how the principal researcher observes this ritual and her contribution in this regard. Under the patronage of the Sri Lanka Rupavahini corporation of Sri Lanka, this Yaagaya had performed by the shamans of Nochchiyagama, Hiriyalegama in Anuradhapura District. Rupavahini Corporation was televised this ritual throughout the whole night, and it was telecasted on 25th May 1990 under the program of ‘Our Heritage’ Being a young researcher while she has been conducting a study on this ritual, she was invited to be the presenter of this TV program by the producer of ‘Our Heritage’ late Mr. Sisira Suraweera. Accordingly, she had become an eyewitness of this great ritual performed by the shamans of Hiriyalegama lenage.

Twenty - three years after the first performance she decided to conduct a re-study with the rest of the researchers on ‘Kotahalu Yaagaya’ and all went to Hiriyalegama in the years 2013 and 2016. Then we came to know that all the shamans who participated in this ritual were dead by now. But researchers met one young person called Manju who performs *Jahuta Nadagama* and he is a son of the late Appuwa Kotahalu. Appuwa Kotahalu was one of the shamans who participated in the Kotahalu Yaagaya which was performed in the Pandulagama on 19th March 1990.

Further, we came to know that all the children of those shamans were engaged in various forms of economic activities instead of their traditional activities. But Manju was a different young person who would like to learn about their traditions and rituals. He said that if he is able to see the steps of dancing of the Kotahalu Yaagaya he likes to perform it again.

Accordingly, with many difficulties, we could be able to get the telecasted program from the Rupawahini Corporation and we handed it over to Manju for learning the steps of dancing. He has undertaken the task amidst hardships.



***Figure 05:*** *Manju was watching the "Kotahalu Yaagaya" Program on the 5th of October 2016*



***Figure 06:*** *Manju with "Kotahalu Yaagaya" DVD*



***Figure 07:*** *Manju's Mother was watching "Kotahalu Yaagaya"*

## Conclusion

Sedaraman (1968) explained the many reasons for fading this ritual in the present society. Among them, one is that since the shamans are looking down and their successors are reluctant to continue the tradition like their ancestors. In fact, his explanation was proved by the experiences of researchers' regarding the attempt of resurrecting this ritual. Young descendants of shamans in the Nchchiyagama lineage tried to learn and perform it. But they completely failed and gave up the task due to difficulties to recite verses of this unique ritual as they were not practiced it since their childhood. It is extremely difficult to resurrect this diminished cultural event, namely the *Kotahalu Yaagaya* which consists of many tuneful and meaningful verses. Accordingly, like many other cultural events, *Kotahalu Yaagaya* also has become history.

It is highly unlikely to resurrect this long-lost cultural event, namely the *Kotahalu Yaagaya* which contained so many melodies and meaningful Sinhala verses. Therefore, like many other cultural events, *Kotahalu Yaagaya* has also faded into history.

## References

Sedaraman, J.E. (1968). Gami Mangalya. *Gami Geeya, 1*, 27-30.

Jayatilleke, Y. D. (2010). Kotahalu Yagaya: The Ritual Pertaining to Sinhalese Puberty Rites in Sri Lanka, *SAARC Culture: Ritual Ethics and Societal Stability in the SAARC Region, 1*, 168-188.

# උරුම සන්නිවේදනයට වෙබ් මාධ්‍යයේ ඇති දායකත්වය
# (මධ්‍යම සංස්කෘතික අරමුදලේ නිල වෙබ් අඩවියට විශේෂිතව)

**ඩී. එම්. එන්. අබේගුණසේකර[1], එස්. එන්.එම්. සකීෆ්[2]**

[1]සහකාර කථිකාචාර්ය, කැලණිය විශ්වවිද්‍යාලය.

[2]සහකාර කථිකාචාර්ය, කැලණිය විශ්වවිද්‍යාලය.

snmsakeef@gmail.com

***සංක්ෂේපය***

*උරුමය හා තාක්ෂණය නූතන ලෝකයේ එකට බැඳී පවතින සංරචක ද්විත්වයකි. උරුමයන් කළමනාකරණය කිරීම, සංරක්ෂණය කිරීම මෙන් ම සන්නිවේදනය කිරීම උදෙසා තාක්ෂණය භාවිත වේ. උරුම සන්නිවේදනය කිරීමට නව මාධ්‍ය අතර වෙබ් මාධ්‍යයේ දායකත්වය කෙසේ ද? යන්න මෙම පර්යේෂණයේ ප්‍රධාන ගැටලුවයි. ප්‍රධාන පර්යේෂණ අරමුණ වූයේ උරුමයන් පිළිබඳ සන්නිවේදනය කිරීම සඳහා වෙබ් මාධ්‍යයේ දායකත්වය හඳුනාගැනීමයි. මේ සඳහා ලංකාවේ උරුම සංරක්ෂණය කරනු ලබන ප්‍රධාන ආයතනය වන මධ්‍යම සංස්කෘතික අරමුදලේ නිල වෙබ් අඩවිය තෝරාගත් අතර පර්යේෂණ ක්‍රමවේදය ලෙස ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ අන්තර්ගත විශ්ලේෂණ ක්‍රමය යොදා ගැනිණි. මධ්‍යම සංස්කෘතික අරමුදලේ නිල වෙබ් අඩවිය ඇසුරෙන් වෙබ් පිටුවක මූලික කොටස්වන පිටු ශීර්ෂය, සංචාලන තීරුව, අන්තර්ගතය හා පාදකය යන කොටස්වලට විශේෂිතව උරුමයන් සන්නිවේදනය කරනු ලබන ආකාරය පිළිබඳ මෙහි දී විශ්ලේෂණය විය. දත්ත විශ්ලේෂණය සඳහා ස්වයං විශ්ලේෂණ ක්‍රමය යොදා ගැනුණි. දත්ත විශ්ලේෂණයට අනුව උරුමයන් සන්නිවේදනය කිරීම සඳහා වෙබ් මාධ්‍යයේ දායකත්වය සාර්ථක වේ. මධ්‍යම සංස්කෘතික අරමුදල මගින් සංරක්ෂණය කරනු ලබන උරුමයන් පිළිබඳ තොරතුරු සන්නිවේදනය සඳහා වෙබ් අඩවිය සාර්ථකව උපයෝගී කරගෙන තිබේ.*

***මුඛ්‍ය පද:*** *උරුමය, තාක්ෂණය, සන්නිවේදනය, වෙබ් මාධ්‍ය, මධ්‍යම සංස්කෘතික අරමුදල*

**හැඳින්වීම**

අතීත මානවයාගේ පැවැත්ම හා ක්‍රියාකාරකම් ගැන අතීත ස්මරණීය සාධක පිළිබඳ අන්තර්ගත වන්නේ පුරාවිද්‍යාව තුළයි. "උරුම සංකල්පය අතීත, වර්තමාන, අනාගතය සම්බන්ධ වන්නා වූ ගතික සංකල්පයක් මෙන් ම ක්‍රියාවලියකි. උරුමය ස්වභාවික මෙන්ම සංස්කෘතික වශයෙන් ස්පර්ශනීය මෙන් ම අස්පර්ශනීය ගතිලක්ෂණයන්ගෙන් සමන්විත වේ." (රාජපක්ෂ, 2019)

ඔක්ස්ෆර්ඩ් ඉංග්‍රීසි ශබ්දකෝෂයට අනුව, උරුම කරගත් යමක් වේ නම් එය උරුමයක් ලෙස හඳුන්වයි. "වාග්විද්‍යාඥයින්ට අනුව උරුමය ආරක්ෂා කිරීමට පෙළඹෙන පූර්ව පරම්පරාවන්ගෙන් උරුම වූ වාස්තුවිද්‍යාත්මක ගොඩනැගිලි, ස්මාරක සහ ගම්මාන ආදිය ඇතුළත් වේ." (Barber, 1998, p.656)

මධ්‍යම සංස්කෘතික අරමුදල ශ්‍රී ලංකාවේ උරුම සංරක්ෂණය කරන ප්‍රධාන ආයතනයකි. මේ ආයතනය මගින් ශ්‍රී ලංකාවේ ප්‍රධාන පුරාවිද්‍යා ස්ථාන ආරක්ෂා කිරීම හා සංරක්ෂණය කිරීම, පර්යේෂණ සිදුකිරීම, බිතු සිතුවම් හා වෙනත් පුරාවස්තු සංරක්ෂණය කිරීම, පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ මානව සම්පත් සංවර්ධනය කිරීම සිදුකරනු ලබයි. මුලින් ම සංස්කෘතික ත්‍රිකෝණය පාදක කරගෙන ප්‍රධාන ස්ථාන හයකින් ඇරඹුණු මෙම ආයතනය නව සහශ්‍රකයේ උරුම සංරක්ෂණ කටයුතු පුළුල් කරමින් එහි කටයුතු දිවයිනේ අන්‍ය ප්‍රදේශ වෙත ද විහිදුවා තිබේ. ඒ අනුව 2020 වන විට දිවයින පුරා ප්‍රධාන පුරාවිද්‍යාත්මක ස්ථාන 26ක උරුම සංරක්ෂණය කර තිබේ." (මධ්‍යම සංස්කෘතික අරමුදල, 2022)

ස්වභාවික මෙන් ම සංස්කෘතික පරිසරය ද ඇතුළත් වන උරුමයන් සංරක්ෂණය කිරීමෙන් අනතුරුව පසු පරම්පරාවන්ට සම්ප්‍රේෂණය කිරීම සඳහා අවශ්‍ය ප්‍රධාන සාධකය වන්නේ සන්නිවේදන තාක්ෂණයයි. තාක්ෂණය යනු තොරතුරු සැකසීමට අවශ්‍ය මෙවලම් සම්පාදනය කරනු ලබන පද්ධතියයි. "තොරතුරු නිර්මාණය කිරීමට, කළමනාකරණය කිරීමට, එම තොරතුරු භාවිත කිරීමට සහ එකිනෙකා සමඟ හුවමාරු කරගැනීම සඳහා භාවිත කරන තාක්ෂණය සන්නිවේදන තාක්ෂණය නම් වේ." (Sarokim, 2009, p.28)

උරුමයන් පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම බලගැන්වීම මෙන් ම සංරක්ෂිත උරුමයන් පිළිබඳ නිවැරදි තොරතුරු ජනතාව අතරට ගෙනයාම සිදු කරන්නේ සන්නිවේදනය මගිනි. නූතනයේ ඒ උදෙසා නව මාධ්‍ය යොදා ගනී. නව මාධ්‍ය අතර වෙබ් අඩවියක් යනු අන්තර්ජාල මූල ලේඛයන් පදනම් වූ ජාලයක් තුළ පොදු වසම් ලිපිනයක් හෝ අන්තර්ජාල ලිපිනයක් අනුසාරයෙන් ඇමතෙන එකිනෙක හා සබැඳි වෙබ් පිටු, රූප,

දෘෂ්‍ය හෝ අනෙකුත් සංඛ්‍යාංක (digital) සන්තකයන් සමුච්ඡයකි. "වෙබ් පිටුවක් යනු අධිපෙළ සලකුණු බස (HTML, XHTML) භාවිතයෙන් ලියූ හැඩතලගැන්වීම් උපදෙස් ද අතරින් පතර යෙදුණු සාමාන්‍ය වශයෙන් සරල පෙළක් භාවිතයෙන් ලියැවෙන ලේඛනයකි. අනෙකුත් වෙබ් අඩවියන් හි අංගයන් සුදුසු සලකුණු භාවිතයෙන් වෙබ් පිටුවක් තුළ අන්තර්ගත කළ හැකි ය." (කුමාර, 2016)

"වෙබ් අඩවියක අන්තර්ගතය ප්‍රධාන වශයෙන් Header, Navigation Bar, Content, Footer (පිටු සිරැසිය, සංචාලන තීරුව, අන්තර්ගතය, පාදකය) ලෙස කොටස් කළ හැකි ය." (Lofgren, 2020)

## පිටු සිරැසිය (Header)

පිටුවේ අන්තර්ගතය විස්තර කරන්නකි. සෑම වෙබ් අඩවියකට ම තිබෙන පොදු විශේෂාංග ගණනාව අතරින් මෙම විශේෂාංගය මඟින් යමෙකුට වෙබ් අඩවිය තුළ සැරිසැරීමට සහ හඳුනාගැනීමට අවශ්‍ය පහසුකම් සලසයි. වෙබ් අඩවියක පිටු ශීර්ෂය තුළ අන්තර්ගත විය යුතු ප්‍රධාන කොටස් අතර අදාළ ආයතනයේ ලාංඡනය (Logo) හෝ අනන්‍යතාවය, ප්‍රධාන මෙනුව Navigation Bar, පිටු මාතෘකාව Page Title, සෙවුම් අඩවිය Search" පූරණයවීම හෝ පිටවීම (Log in, Log out), පරිශීලක පැතිකඩ සබැඳිය (User Profile link), දැනුම්දීම් (Notification) ආදිය වේ.

## සංචාලන තීරු (Navigation Bar)

පරිශීලකයෙකුට සංචාලන තීරුවේ සැරිසැරීම අපහසු වන්නේ නම් පරිශීලකයා ඉතා ඉක්මණින් වෙබ් අඩවියෙන් ඉවත් වී යයි. ඔහු සොයන පිටු සොයාගත නොහැකි වූ විට වෙබ් අඩවියෙන් පිටවීයාම වෙබ් පිටුවේ ගුණාත්මකභාවයට බලපායි. සංචාලන තීරුවක් මඟින් පරිශීලකයින්ට කියවීමට අවශ්‍ය අන්තර්ගතයට ප්‍රමුඛත්වයක් ලබා දෙයි. සංචාලන තීරුව වෙබ් අඩවියේ ඉහළින් ම ඇත. සංචාලන තීරුව අභ්‍යන්තර සබැඳිවලින් සමන්විත ය.

## වෙබ් අන්තර්ගතය (Content)

වෙබ් අන්තර්ගතය යනු වෙබ් අඩවියක ප්‍රකාශිත පාඨමය, ශ්‍රව්‍ය හෝ දෘෂ්‍ය අන්තර්ගතයයි. අන්තර්ගතය නිර්මාණාත්මක අංගවලින් යුක්ත වේ. උදාහරණයක් ලෙස පෙළ යෙදුම්, පිංතූර, සංරක්ෂිත පණිවිඩ, දත්ත, ඊ සේවා, ශ්‍රව්‍ය සහ දෘෂ්‍ය ගොනු යනාදිය වේ. එසේ ම සෙවුම් යන්ත්‍ර සඳහා වෙබ් අන්තර්ගතය ප්‍රශස්ත කිරීම

වැදගත් වන අතර එමඟින් එය සෙවීම සඳහා භාවිත කරන මූල පදවලට ප්‍රතිචාර දක්වයි. වෙබ් අඩවිය සාර්ථකව පවත්වාගෙන යාමට වෙබ් අන්තර්ගත කළමනාකරණය අත්‍යවශ්‍ය වේ. වෙබ් අන්තර්ගතය කළමනාකරණය කිරීම සඳහා ප්‍රේක්ෂකයින්ගේ අවශ්‍යතාවලට අනුකූලව අන්තර්ගතය සංවිධානය කළ යුතු ය.

**පාදකය (Footer)**

වෙබ් අඩවියක පාදකය යනු සෑම පිටුවක ම ප්‍රධාන අන්තර්ගතයට පහළින් පිහිටි ප්‍රදේශයයි. ලේඛනයක සියලු ම පිටු පුරා දක්නට ලැබෙන ස්ථාවර සැලසුම් අංගයකි. වෙබ් පිටු පාදක අන්තර්ගතය බොහෝ විට තාක්ෂණික තොරතුරු ලබා දෙයි. මෙහි වෙබ් අඩවිය සඳහා ප්‍රකාශන හිමිකම් තොරතුරු, වෙබ් අඩවියේ කර්තෘගේ නම, ව්‍යාපාර නාමය සහ ලිපිනය, අදාළ නම්, යාවත්කාලීන කළ දිනය ආදිය ඇතුළත් වේ. සමහර වෙබ් පිටු පාදකවලට වෙබ් අඩවිය තුළ ඇති වෙනත් පිටු වෙත සබැඳි, ඊමේල් සබැඳියක් හෝ RSS සබැඳියක් ඇතුළත් වේ.

මෙම පර්යේෂණය මඟින් අධ්‍යයනය වන ප්‍රධාන ගැටලුව උරුමය සන්නිවේදනය කිරීම උදෙසා වෙබ් මාධ්‍යයේ දායකත්වය කෙසේද? යන්නයි. උරුමය සන්නිවේදනය උදෙසා තාක්ෂණික වශයෙන් වෙබ් මාධ්‍යයේ ඇති දායකත්වය හඳුනාගැනීම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ විය.

**න්‍යායාත්මක පසුබිම**

කැනේඩියානු ජාතික මාධ්‍ය විශාරදයෙකු වූ මාෂල් මැක්ලූහන් විසින් ප්‍රචලිත කළ සංකල්පයක් ලෙස "මාධ්‍ය ම සංදේශය වේ" යන සංකල්පය හැඳින්විය හැකි ය. සන්නිවේදකයා සහ ග්‍රාහකයා අතර අන්තර් සම්බන්ධතාව ගොඩනගන්නේ මාධ්‍යය විසිනි. එහිදී මාධ්‍යයේ සාර්ථක අසාර්ථකභාවය සන්නිවේදකයාගේ සන්දේශය ග්‍රාහකයා වෙත ළඟා වීම සාර්ථක හෝ අසාර්ථක වීමට ඍජුව බලපානු ලැබේ. විශ්ව ගම්මාන සංකල්පයත් සමඟ පුරාණ සන්නිවේදන දූත මෙහෙවර නූතන ලෝකයේ ජනමාධ්‍ය මෙහෙයවීමෙන් සිදුවන බව හඳුනාගත හැකි ය. මේ නිසා තවදුරටත් නවීන මාධ්‍ය මෙහෙවර හා බලපෑම ග්‍රාහක ලෝකයට සමීප විය. සෑම මාධ්‍යයක ම පිටුපස මිනිසාගේ ක්‍රියාකාරීත්වය දැකගත හැකි ය. ඒ ක්‍රියාකාරීත්වය කෙතරම් ද කිවහොත් තොරතුරක පවතින බලශක්තිය මාධ්‍යයක ම පවතින බලශක්තියක් බවට පත්විය.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණය සඳහා යොදා ගනු ලබන්නේ ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයයි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ අන්තර්ගත විශ්ලේෂණය සිදුකරනු ලැබේ. මධ්‍යම සංස්කෘතික අරමුදල නිල වෙබ් අඩවිය වන www.ccf.gov.lk මූලික කර කරගනිමින් වෙබ් පිටුවක අන්තර්ගත මූලික කොටස් වන Header, Navigation Bar, Content, Footer කොටස්වලට විශේෂිතව අන්තර්ගත විශ්ලේෂණයක් සිදු කෙරිණි. දත්ත විශ්ලේෂණය කිරීමේ දී ස්වයං විශ්ලේෂණ ක්‍රමය යොදා ගැනුණි.

**පර්යේෂණ සීමාව**

වෙබ් මාධ්‍යයන්ට අදාළව මාධ්‍යමය තාක්ෂණික අංග ගණනාවක් තිබුණ ද මෙම පර්යේෂණයේ දී අධ්‍යයනය කරනු ලබන්නේ පිටු සිරැසිය, සංචාලන තීරුව, අන්තර්ගතය සහ පාදකය යන කොටස්වල උරුම සන්නිවේදනයට උදෙසා බලපාන අන්තර්ගත පිළිබඳව පමණි.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

**Header පිටු සිරැසිය පිළිබඳ අන්තර්ගත විශ්ලේෂණය**

| | |
|---|---|
| ආයතනයේ ලාංඡනය (Logo) | ✓ |
| පිටු මාතෘකාව (Page title) | ✓ |
| සෙවුම් අඩවිය (Search) | ✓ |
| පූරණය වීම හෝ වරණය (Login Logout) | ✕ |
| පරිශීලක පැතිකඩ සබැඳිය (User Profile link) | ✕ |
| දැනුම්දීම (Notification) | ✕ |
| ත්‍රිභාෂා සෙවුම් පහසුකම් (Multi-language toggle) | ✓ |

මධ්‍යම සංස්කෘතික අරමුදලෙහි නිල වෙබ් අඩවියේ පිටු ශීර්ෂය තුළ ආයතනික ලාංඡනය, පිටු මාතෘකාව සෙවුම් අඩවිය හා ත්‍රිභාෂා සෙවුම් පහසුකම් අන්තර්ගත වී ඇත. ආයතන ලාංඡනය මඟින් පැහැදිලිව අනන්‍යතාව හඳුනාගත හැකි අතර ත්‍රිභාෂා සෙවුම් පහසුකම් මඟින් වෙබ් අඩවි අන්තර්ගතය භාෂා තුනෙන් ම

අධ්‍යයනය කළ හැකි ය. එහෙත් පිවිසීමේ හා පිටවීමේ බොත්තම මෙන් ම දැනුම් දීම් සඳහා මෙහි අන්තර්ගතය සකසා නොමැත. සිත්ගන්නාසුලු වර්ණ භාවිතයකින් පිටු ශීර්ෂය සකස්කොට ඇති බව පෙනේ. එමෙන් ම වෙබ් පිටුවෙහි අක්ෂරවල ප්‍රමාණය විශාල/මධ්‍යම/කුඩා ආකාරයට සකස්කරගත හැකි පරිදි (Increase, Reset font size, decrease size) ලෙස නිර්මාණය කර ඇත.

**සංචාලන තීරු - Navigation bar**

උරුමය පිළිබඳ පැහැදිලිව සන්නිවේදනය කිරීම සඳහා අවශ්‍ය සියලු ම සබැඳිවලින් සමන්විත වේ.

- මුල් පිටුව
- අප ගැන
- ජාතික උරුමයන්
- කෞතුකාගාර
- ජාතික අනුරූ මධ්‍යස්ථාන
- විද්‍යාගාර
- පුවත්
- ප්‍රකාශන
- අප අමතන්න

යන සබැඳිවලින් සමන්විත වේ. උරුම පිළිබඳ සන්නිවේදනය කිරීම සඳහා විශේෂයෙන් මධ්‍යම සංස්කෘතික අරමුදල මගින් සංරක්ෂණය කරනු ලබන උරුම සම්බන්ධව වෙනම සබැඳියක් නිර්මාණය කර තිබීම විශේෂ වේ. එහි දී විශේෂයෙන් සංරක්ෂණය කරන ලද උරුම සම්බන්ධ ප්‍රකාශන සබැඳි තුළට ඇතුළත් කර තිබීම විශේෂත්වයකි. දිනෙන් දින යාවත්කාලීන වන උරුම හා සම්බන්ධ පුවත් පිළිබඳ සබැඳියන් ද මෙහි වේ.

උප සබැඳියන් ලෙස අනුරාධපුර, සීගිරිය, දඹුල්ල, මොණරාගල, ත්‍රිකුණාමලය, ගම්පහ, බදුල්ල, කෑගල්ල, තිස්සමහාරාමය, දඹදෙණිය, රිටිගල, අම්පාර, මාතර, පොළොන්නරුව, ගාල්ල, මහනුවර, යාපනය, ඉබ්බන්කටුව, කොළඹ, මඩකලපුව, රත්නපුරය, රඹ සංඝාවාසය, පඬුවස්නුවර, යාපහුව, කුරුණෑගල, නාමල් උයන යන සියලුම උරුම ස්ථාන ඇතුළත් කර තිබේ.

විශේෂයෙන් උරුම පිළිබඳ සන්නිවේදනය කිරීම සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදල මඟින් ප්‍රකාශයට පත් කරනු ලබන පොත්, සඟරා, පුවත් පත්‍රිකා, අත් පත්‍රිකා, තැපැල් පත්, පෝස්ටර්, සීඩී/ඩීවීඩී/, වාර්තා යන උප සබැඳි මෙහි ඇතුළත්කර තිබීම විශේෂත්වයකි.

**අන්තර්ගතය (Content)**

උරුමයන්ට අදාළව වෙබ් පිටුවේ අන්තර්ගතය පිළිබඳ විශ්ලේෂණය කිරීමේ දී,

| ම.සං. අරමුදල මඟින් සංරක්ෂණය කරනු ලබන ජාතික උරුමයන් | උරුමය හැඳින්වීම | වැඩිදුර තොරතුරු සන්නිවේදනයට සමාජ මාධ්‍ය යොදා ගැනීම | උරුමයට අදාළ ඡායාරූප | සංරක්ෂණය කිරීම සම්බන්ධ තොරතුරු | මාර්ග සිතියම් හෝ විස්තර | බාගත කිරීමේ පහසුකම් | සංරක්ෂිත දර්ශන |
|---|---|---|---|---|---|---|---|
| අනුරාධපුර | ✔ | Fb | ✔ | ✘ | ✘ | ✔ | ✘ |
| සීගිරිය | ✔ | ✘ | ✔ | ✘ | ✘ | ✔ | ✘ |
| දඹුල්ල | ✔ | Fb | ✔ | ✔ | ✘ | ✔ | ✘ |
| මොණරාගල | ✔ | ✘ | ✔ | ✔ | ✘ | ✔ | ✘ |
| ත්‍රිකුණාමලය | ✔ | ✘ | ✔ | ✔ | ✘ | ✔ | ✘ |
| ගම්පහ | ✔ | ✘ | ✔ | ✔ | ✘ | ✔ | ✘ |
| බදුල්ල | ✔ | ✘ | ✔ | ✔ | ✘ | ✔ | ✘ |
| කෑගල්ල | ✔ | ✘ | ✔ | ✔ | ✘ | ✔ | ✘ |
| තිස්සමහාරාමය | ✔ | ✘ | ✔ | ✘ | ✘ | ✔ | ✘ |
| දඹදෙණිය | ✔ | ✘ | ✔ | ✘ | ✘ | ✔ | ✘ |
| රිටිගල | ✔ | ✘ | ✔ | ✔ | ✘ | ✔ | ✘ |
| අම්පාර | ✔ | ✘ | ✔ | ✔ | ✘ | ✔ | ✘ |
| මාතර | ✔ | ✘ | ✔ | ✔ | ✘ | ✔ | ✘ |
| පොළොන්නරුව | ✔ | Fb | ✔ | ✔ | ✘ | ✔ | ✘ |
| ගාල්ල | ✔ | ✘ | ✔ | ✔ | ✘ | ✔ | ✘ |
| මහනුවර | ✔ | Fb | ✔ | ✔ | ✘ | ✔ | ✘ |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| යාපනය | ✔ | ✘ | ✔ | ✔ | ✘ | ✔ | ✘ |
| ඉබ්බන්කටුව | ✔ | Fb | ✔ | ✔ | ✘ | ✔ | ✘ |
| කොළඹ | ✔ | ✘ | ✔ | ✔ | ✘ | ✔ | ✘ |
| මඩකලපුව | ✔ | ✘ | ✔ | ✔ | ✘ | ✔ | ✘ |
| රත්නපුරය | ✔ | ✘ | ✔ | ✔ | ✘ | ✔ | ✘ |
| රඹසංඝාවාසය | ✔ | ✘ | ✔ | ✔ | ✘ | ✔ | ✘ |
| පඬුවස්නුවර | ✔ | ✘ | ✔ | ✘ | ✔ | ✔ | ✘ |
| යාපහුව | ✔ | ✘ | ✔ | ✔ | ✘ | ✔ | ✘ |
| කුරුණෑගල | ✔ | ✘ | ✔ | ✘ | ✘ | ✔ | ✘ |
| නාමල් උයන | ✔ | ✘ | ✔ | ✘ | ✘ | ✔ | ✘ |

වෙබ් පිටුවේ අන්තර්ගතය සම්බන්ධයෙන් විශ්ලේෂණය කිරීමේ දී සමස්තයක් වශයෙන් මධ්‍යම සංස්කෘතික අරමුදල මඟින් සංරක්ෂණය කරනු ලබන උරුම ස්ථාන 26ට අදාළ උරුමයන් හැඳින්වීමට අදාළව වෙබ් පිටුව ගුණාත්මක අන්තර්ගතයකින් සමන්විත බව විශ්ලේෂණය කළ හැකි ය. එමෙන් ම උරුම හා සම්බන්ධ වැඩිදුර තොරතුරු සඳහා වෙනත් සමාජ මාධ්‍යයන් භාවිත කිරීම සම්බන්ධයෙන් විශ්ලේෂණය කිරීමේ දී අනුරාධපුරය, දඹුල්ල, මහනුවර, පොලොන්නරුව, ඉබ්බන්කටුව යන උරුම ස්ථාන පිළිබඳ පමණක් මුහුණු පොත (Facebook) ඔස්සේ වැඩිදුර තොරතුරු ඉදිරිපත් කොට ඇත. සමස්තයක් වශයෙන් සියලු උරුම කලාපයන්ට අදාළ ඡායාරූප වෙබ් අඩවිය තුළ අන්තර්ගත කර ඇති බව විශ්ලේෂණය වේ. සංරක්ෂණය කිරීම් සම්බන්ධ තොරතුරු සන්නිවේදනය පිළිබඳ විමසීමේ දී උරුම ස්ථාන අතරින් සීගිරිය, තිස්සමහාරාමය, දඹදෙණිය, පඬුවස්නුවර, කුරුණෑගල සහ නාමල් උයන උරුම ස්ථාන පිළිබඳ සංරක්ෂණය කිරීම් සම්බන්ධ තොරතුරු අන්තර්ගත කර නොමැති බව විශ්ලේෂණය වේ. සමස්තයක් වශයෙන් සියලු උරුම ස්ථානවලට ප්‍රවේශ වීම සඳහා මාර්ග සිතියම් හෝ මාර්ග තොරතුරු පිළිබඳ වෙබ් අඩවිය තුළ සන්නිවේදනය සිදු කර නොමැති බව විශ්ලේෂණය වෙයි. එමෙන් ම වෙබ් අඩවියේ සියලු උරුම ස්ථාන සම්බන්ධ තොරතුරු බාගත කරගැනීමට පහසුකම් සලසා දී ඇත. එහෙත් කිසිදු උරුම ස්ථානයක් සංරක්ෂණය කිරීම සම්බන්ධ තොරතුරු හෝ ඒ හා සම්බන්ධ ප්‍රධානීන් පිළිබඳ තොරතුරු අන්තර්ගත කර නොමැත.

**පාදකය (Footer)**

| | |
|---|---|
| ප්‍රකාශන හිමිකම් තොරතුරු | ✔ |
| වෙබ් අඩවි කර්තෘගේ ලිපිනය | ✔ |
| යාවත්කාලීන වූ දිනය | ✔ |
| වෙනත් පිටු හා සබැඳි කිරීම් | ✔ |

පාදකයක සඳහන් විය යුතු කොටස් සමස්තය මෙහි ඇතුළත් වන අතර උරුමයන් සංරක්ෂණය හා සම්බන්ධ අනෙකුත් සබැඳි පාදකයේ අන්තර්ගත කර තිබීම විශ්ලේෂණය වේ. එමෙන් ම මධ්‍යම සංස්කෘතික අරමුදල හා සම්බන්ධ වීමට මෙන්ම ඒ මගින් උරුමයන් පිළිබඳ සන්නිවේදනය කිරීමට Twitter, Youtube යන සමාජ මාධ්‍යයන් ඇතුළත් කර ඇති බව විශ්ලේෂණය වේ.

**නිගමන**

උරුමයන් සන්නිවේදනය කිරීම සඳහා නව මාධ්‍ය අතර වෙබ් මාධ්‍යයේ දායකත්වය සාර්ථක බව නිගමනය කළ හැකි ය. මධ්‍යම සංස්කෘතික අරමුදලෙහි නිල වෙබ් අඩවිය මගින් එම ආයතනය හරහා සංරක්ෂණය වන උරුමයන් පිළිබඳ තොරතුරු හා සංරක්ෂණය සිදුකරනු ලබන ආකාරය පිළිබඳ ජනතාවට තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියේ අන්තර්ගතය සාර්ථකව පවත්වාගෙන යනු ලබයි. අනුරාධපුරය, තිස්සමහාරාමය, දඹදෙනිය, පඬුවස්නුවර, කුණ්ඩසාලේ, නාමල් උයන යන උරුම කලාපයන් සංරක්ෂණය කරනු ලබන ආකාරය පිළිබඳ තොරතුරු අන්තර්ගත වී නොමැත. උරුමයන් පිළිබඳ සන්නිවේදනය කිරීමට වෙබ් පිටුව තුළ පොත්පත්, සඟරා, පුවත් අත් පත්‍රිකා, තැපැල් පත්, පෝස්ටර්, සීඩී/ඩීවීඩි වාර්තා ඇතුළත් කර තිබෙන අතර එය සන්නිවේදනාත්මක වශයෙන් වැදගත් වේ. නමුත් සමස්තයක් ලෙස මෙම ජාතික උරුමයන් වෙත ප්‍රවේශ වීම සඳහා මාර්ග සිතියම් සන්නිවේදනය කර නොතිබීම දුර්වලතාවයක් ලෙස නිගමනය කළ හැකි ය. එමෙන් ම සංරක්ෂිත ක්‍රියාදාමයන් තුළ ප්‍රධානත්වය ගත් පුද්ගලයින් හෝ නිලධාරීන් පිළිබඳ තොරතුරු අන්තර්ගත වී නොමැත. සමස්තයක් වශයෙන් උරුම සන්නිවේදනය උදෙසා වෙබ් අඩවිය තුළ Twitter, Youtube යන සමාජ මාධ්‍යය ද යොදා ගෙන තිබේ.

**නිර්දේශ**

මධ්‍යම සංස්කෘතික අරමුදල මගින් සංරක්ෂණය කරනු ලබන උරුමයන් අතර අනුරාධපුරය, තිස්සමහාරාමය, දඹදෙණිය, පඬුවස්නුවර, කුරුණෑගල, නාමල් උයන යන උරුම කලාප සංරක්ෂණය කරන ලද ආකාරය පිළිබඳ තොරතුරු අන්තර්ගත කළ යුතු ය. උරුම ස්ථාන සඳහා ප්‍රවේශ වීම සන්නිවේදනය කරන මාර්ග සිතියම් හෝ මාර්ග තොරතුරු ඇතුළත් කළ යුතු ය. සංරක්ෂිත ව්‍යාපෘති සම්බන්ධ ප්‍රධානීන් පිළිබඳ තොරතුරු ඇතුළත් කළ යුතු වේ.

**ස්තුතිය.**

මෙම පර්යේෂණය සිදු කිරීම සඳහා මාර්ගෝපදේශය ලබාදෙමින් නොමඳ දායකත්වයක් ලබා දුන් ජනසන්නිවේදන අධ්‍යන අංශයේ අංශාධිපති ඇතුළු ආචාර්ය මණ්ඩලයටත්, මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂක ජෙනරාල් ඇතුළු කාර්ය මණ්ඩලයටත් ස්තුති පූර්වක වෙමු.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

කුමාර, එස්. (2016). *වෙබ් අඩවියක් යනු*. Retrieved from https://sanomart.lk

ගුණවර්ධන, පී. (2005). *පුරා විද්‍යා උරුමය ආකෘති සංකල්ප හා කළමණාකරණය*. සමන්ති පොත් ප්‍රකාශකයෝ.

මධ්‍යම සංස්කෘතික අරමුදල, 2022. Retrieved from https://ccf.gov.lk

රාජපක්ෂ, ආර්.(2019). *ශ්‍රී ලංකාවේ සංස්කෘතික ත්‍රිකෝණ ජගත් උරුම ක්ෂේත්‍ර සැලසුම්කරණය හා කළමණාකරණය.* Retrieved from https://sinhala.archaeology.lk

Barber,K. (1998). *The Canadian oxford dictionary*. Oxford university press.

Sarokim,M. (2009). *What is Technology*.University of chikago press.

Lofgren,L.(2020). *The key Elements of a high quality website*. Retrieved from www.quicksprout.com

# ලක්දිව පැරණි පුස්කොළ ලේඛනවල ඇති වැදගත්කම සහ වර්තමානය වන විට ඒවා ආරක්ෂා කිරීමට විවිධ ආයතන විසින් දරන ලද ප්‍රයත්නයන්

**ඩී. එම්. වී. දිසානායක**

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය, රජරට විශ්වවිද්‍යාලය.

disanayakavishaka@gmail.com

***සංක්ෂේපය***

*විශ්ව මට්ටමෙන් ගත් කල අතීතයේ පටන්ම ශ්‍රී ලංකාව සතුව ඉතා පොහොසත් මෙන්ම අඛණ්ඩ වූ සාහිත්‍යමය සම්ප්‍රදායක් උරුමව පවතී. සියවස් 20කටත් වඩා ඈතට දිව යන කලාවක් ලෙසින් අප රට තුළ පුස්කොළ ලේඛන කලාව ඉතා වැදගත්ය. මිනිසා තම දැනුම සංරක්ෂණය කිරීම උදෙසා භාවිතා කළ ප්‍රධානතම ක්‍රමවේදය ලේඛනයයි. පාරිසරික සාධක මත එක් එක් භාෂාගත ලේඛනයන්හි මාධ්‍යයන් විවිධ විය. ඒ අතර ඉන්දියාව, ලංකාව, බුරුමය, තායිලන්තය වැනි ඝර්ම කලාපීය රටවල මේ සඳහා භාවිතා කළ ප්‍රමුඛ මාධ්‍ය වූයේ තල හා තල් වෘක්ෂ පත්‍රයි. ලේඛන කාර්යයයේ දී තල කොළය හඳුන්වන්නේ පුස්කොළය නමිනි. තල් කොළ මත ලිවීමේ මෙම අකුරු කලාව තුළ ඇති දැනුම් සම්භාරය පුස්කොළ අතරම සැඟවී දිරාපත් වීමේ තත්ත්වයකට පත් වී ඇති බව වර්තමානය වන විට දැකිය හැකිය. බොහෝ දුරට එසේ සිදු වී ඇත්තේ පුස්කොළ ලේඛන පිළිබඳව ජනතාව තුළ නිසි අවබෝධයක් නොමැතිකම නිසාවෙනි.*

***මුඛ්‍ය පද:*** *පුස්කොළ, ලේඛන කලාව, තල, අකුරු, සංරක්ෂණය*

## හැඳින්වීම

පුස්කොළ පොත් ලිවීමේ කාර්යය සඳහා ලබා ගනු ලබන ද්‍රව්‍ය තල ගොබයයි. පත්‍ර අසූවක් පමණ ඇති තල ගොබයේ එක් එක් පත්‍රයේ ඉරටුව ඉවත් කොට කොළය දැවටුමක් ලෙස ඔතා එය ලොකු දිය හැලියක තබා පැය කිහිපයක් මඳ ගින්නේ තම්බනු ලැබේ. ඒ අරුතින් තැම්බූ කොළය පිසූ කොළය වන්නට ඇතැයි කෙනෙකුට සිතිය හැකිය. පුස් කොළය පිළිබඳව වියතුන් විවිධ අදහස් පළ කරති. ශ්‍රී සුමංගල ශබ්ද කෝෂයේ පුස් යන ධාතුවට අර්ථකතන සපයනුයේ කිසිවක් "නොලියන ලද හිස් තල් කොළ" යනුවෙනි. පුස් (ධා) - පිස දැමීමෙහි පුසී පුසිත් පසි පිසී (පුස්මින්- නෙත්‍රී - ධප්‍රි 234) පුස්කොළ පොත් ලේඛන කලාව විහාරස්ථානවල ප්‍රගුණ කළ බව ඓතිහාසික තොරතුරු අනුව සිතිය හැකිය. මෙසේ භාවිතයට පැමිණි පුස්කොළ පොත ලේඛන කලාවේ දී ශිලාලිපි හා අනෙකුත් ද්‍රව්‍ය සතු කරගෙන සිටි ස්ථානය අත්පත් කරගත් අතර පෘතුග්‍රීසි පාලන සමයේ දී ශ්‍රී ලංකාවට මුද්‍රණ කර්මාන්තය හඳුන්වා දෙන තුරුම ලංකාවේ බහුලවම භාවිත වූ ලේඛන මාධ්‍ය ලෙස රැඳිණි.

මෙම අධ්‍යයනයේ අරමුණ වී ඇත්තේ පැරණි පුස්කොළ ලේඛනවල ඇති වැදගත්කම හඳුනාගැනීමත් පුස්කොළ ලේඛන ආරක්ෂා කිරීමට විවිධ ආයතන ගෙන ඇති උත්සාහයන් කෙබඳු ද යන කරුණු පිළිබඳව අවධානය යොමු කිරීමයි. එම ප්‍රයත්නයන් ජනතාවගේ ආකල්ප වර්ධනය කිරීමට කෙතරම දායකත්වයක් සපයා ඇත්ද යන්න නිගමනය කිරීමයි.

මෙම අධ්‍යයනය සඳහා දත්ත රැස් කිරීමේ දී ද්විතියික මූලාශ්‍ර වන සාහිත්‍ය කෘති මෙන්ම අන්තර්ජාලය ඇසුරෙන් ලබා ගන්නා ලද තොරතුරු මෙන්ම ඡායාරූප ආදිය උපයෝගී කොට ගැනිණි.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

ශ්‍රී ලංකාවේ ලේඛන කටයුතු පිළිබඳව ක්‍රි. පූ. 6 වන සියවසේ සිට ම වංශකතාවල තොරතුරු ඇතුළත් වී තිබේ. විජය රජු පඬි රජුට ද, සුමිත්ත කුමරුට ද ලිපි යැව් බවත් පඬි රජු විජය රජුට ලිපියක් එවූ බවත් සඳහන් වෙයි. ක්‍රි. පූ. 4 වන සියවසේ පණ්ඩුකාභය කුමරු හා අභය රජු අතර ලිපි හුවමාරු විය. ක්‍රි. පූ. 3 වන සියවසේ දී උත්තිය කුමරු සිය නෑනාට රහස් ලිපියක් යැවීය. (ලගමුව, 2006, පි. 49)

දේවානම්පියතිස්ස රජු මිහිඳු හිමියන්ගේ නියමය පරිදි සෙල් කණුවක ද රන් පතකද ලේඛන ලියා තැන්පත් කර තැබූ බව ද සඳහන් වෙයි. මුලින් සඳහන් කළ ලිපි කුමන ද්‍රව්‍යයක ලියුවේද යන්න පිළිබඳව සඳහන් නොවේ. සැමවිටම ‘‘ලේඛං’’ යන වචනය

පමණක් සඳහන් වේ. එහෙත් ශිලාස්ථම්භය හා රන්පත් ඉරුව පිළිබඳව සෘජුවම මහාවංශයේ සඳහන් වේ. (ලගමුව, 2006, පි. 50)

ඒ අනුව ඉතා වැදගත් සිද්ධි කල් පවත්නා ද්‍රව්‍ය මත රචනා කළ බවත් ලිපි ගනුදෙනු වැනි එදිනෙදා කටයුතු සාමාන්‍ය කාබනික ද්‍රව්‍ය මත රචනා කළ බවත් පෙනේ. එහෙයින් එම ලිපි පුස්කොළ හෝ පුස්කොළ වැනි කොළ වර්ගයක් මත රචනා කළ බව පැහැදිලිය.

ක්‍රි. පූ. 3 වන සියවසේ මහින්දාගමනයෙන් අනතුරුව ලේඛන කලාව වඩාත් පුළුල් ලෙස ව්‍යාප්ත විය. මුල්ම ඓතිහාසික මහා පරිමාණ ලේඛන සාහිත්‍යයක් පිළිබඳව කරුණු අනාවරණය වන්නේ මිහිඳු හිමියන් විසින් සංග්‍රහ කරන ලද හෙළ අටුවා පිළිබඳව ඓතිහාසික තොරතුරුවලිනි.

මහාචාර්ය පී. ඊ. ඊ. ප්‍රනාන්දු දක්වන පරිදි දඹදෙණි රාජධානි සමයෙහි හෙවත් 13 වන සියවසෙහි ලියන ලද දැනට ලක්දිව පැරණිම පොත් හතර පහත දැක්වේ. (බණ්ඩාර, Archaeology.lk)

- චුල්ලවග්ගය (කොළඹ ජාතික කෞතුකාගාරය)
- විසුද්ධිමග්ග ටීකාව (පේරාදෙණි විශ්ව විද්‍යාලීය පුස්තකාලය)
- සාරත්ථදීපනී නම් විනය ටීකාව 1 කාණ්ඩය (ලන්ඩන් නුවර බ්‍රිතාන්‍ය කෞතුකාගාර පුස්තකාලය)
- සාරත්ථදීපනී පිටපත (පැරිස් නුවර ජාතික පුස්තකාලය)

**පුස්කොළ පොත්වල ඇති වැදගත්කම**

තල් කොළය මත ලිවීමේ මෙම අකුරු කලාව තුළ සාම්ප්‍රදායික තාක්ෂණික ක්‍රියාවලියක් පැවති අතර එය තුළ සංස්කෘතිකමය වශයෙන් වැදගත්කමක් ද දක්නට ලැබේ. පෞරාණික සමාජය තුළ ආගම, සංස්කෘතිය, ආර්ථිකය, තාක්ෂණය, කලාව හා චාරිත්‍ර විධි වැනි කරුණු හා එකට බැඳුණු සම්ප්‍රදායක් පුස්කොළ පොත් ලිවීම තුළ අන්තර්ගතව පැවතිණි. අපගේ මුතුන් මිත්තන් විසින් වසර දහස් ගණනක් තිස්සේ සිදු කරන ලද අත්හදා බැලීම් හා උකහාගත් අත්දැකීම් පදනම් කොටගත් මිල කළ නොහැකි මහත් වූ ඥාණ හා දැනුම් සම්භාරයක් මෙම පුස්කොළ පොත්වල අන්තර්ගත වී ඇත. පැරණි යුගයේ සිට ශ්‍රී ලංකාවේ රචනා කරන පුස්කොළ පොත් අතිවිශාල ප්‍රමාණයක් විනාශ වී ගොසින්ය. එහෙත් දේශීය-විදේශීය පුස්තකාල, කෞතුකාගාර, ලේඛනාගාර මෙන්ම ලංකාවේ බෞද්ධ ස්ථානවල ද පුස්කොළ විශාල ප්‍රමාණයක් වාසනාවට මෙන් තවමත් ශේෂව පවතී.

පුස්කොළ පොත්වල අක්ෂර හා භාෂාවේ සමානකම් හා අසමානකම් දැකිය හැකිය. පුස්කොළ පොත්වල අන්තර්ගත විෂය ක්ෂේත්‍රය පිළිබඳව සීමාවක් කළ නොහැකිය. සිංහල පාලි පමණක් නොව සංස්කෘත භාෂාවෙන් ද, බෞද්ධ දර්ශනය, බුද්ධ ධර්මය, බෞද්ධ සංස්කෘතිය යන ප්‍රධාන අනුවිෂය ධාරාවන්ට අයත් පුස්කොළ පොත් රචනා කර තිබේ. සිංහල භාෂා සාහිත්‍ය පිළිබඳව රචනා වී තිබෙන පොත් ප්‍රමාණය ද අධිකය.

පුස්කොළ පොත්වලින් හෙළිවෙන ආයුර්වේද වෛද්‍ය විද්‍යාව පිළිබඳව තතු විස්මයජනකය. බටහිර වෛද්‍ය විද්‍යාව පසුපස යන මෙවන් අවධියක අපේ පාරම්පරික හෙළ වෙදකම පුස්කොළ පොත් අතර ම දිරාපත් වනු ඇත. යෝගරත්නාකරය, අරිෂ්ට ශතකය, සාරාර්ථ සංග්‍රහය, අත් වෙදපොත, වට්ටෝරු ගෙඩි වෙද පොත් එයින් කිහිපයකි. සමහර වෛද්‍ය ග්‍රන්ථ නම් කර ඇත්තේ අනියම් රහස් නම් වලිනි. භූත විද්‍යාව හා යන්ත්‍ර මන්ත්‍ර බලිතොවිල් යනාදි අභිචාර විධි ඇතුළත් පොත් රෝග නිවාරණය, අපල-උපද්‍රව දුරලීම, කොඩිවින, අංජනම් බැලීම, බහිරව විත කැපුම වැනි නොයෙක් තොරතුරු විශාල ප්‍රමාණයක් පුස්කොළ ලේඛනවල සඳහන් වේ. (ලගමුව, 2006, පි. 183) ජ්‍යොතිෂයට සම්බන්ධ නැකැත් පොත්, කලා ශිල්ප ශාස්ත්‍ර පොත් ද ඒ අතර වේ.

පුස්කොළ පොත් සෞන්දර්යාත්මක හා කලාත්මක අගයෙන් අනූනය. පොත් අභ්‍යන්තරයේ රේඛා චිත්‍ර හා රූප සටහන්, බුද්ධ චරිතය, බෝසත් චරිතය, ජනකතා, ඉතිහාසය, මල් ලියකම්, ජ්‍යාමිතික රටා යනාදී විවිධ අංශවලට අයත් වන අතර ඒවා සිත්තර කලා සම්ප්‍රදාය හෝ ශෛලිගත සම්ප්‍රදාය අනුව ඇඳ තිබේ. දැව, ලෝහ, ඇත්දත්, තල්පත් වැනි අමුද්‍රව්‍යවලින් නිර්මාණය කළ පොත් කම්බවල ඇති අලංකාර ලාක්ෂා සිතුවම්, කැටයම් වැඩ, ගිල්ලවිලි වැඩ, බිද්රි වැඩ යනාදියෙන් මනහර ලෙස සරසා තිබේ. කම්බා පමණක් නොව සකි, හුය හා ලේඛනෝපකරණය පවා අලංකාර කර තිබේ. පුස්කොළ පොත්වල ඇති වැදගත්කම මෙම කරුණු මඟින් මනාව තහවුරු වේ.

**පුස්කොළ ලේඛන ආරක්ෂා කර ගැනීම සඳහා විවිධ ආයතන මඟින් ගෙන ඇති පියවර**

වටිනාකම පිළිබඳ තක්සේරුවක් හෝ අවබෝධයක් නැති වීම හේතුවෙන් බොහෝ වටින කියන දේ අප අතින් ගිලිහී යෑමට ඉඩ ඇත. පෞරාණික වටිනාකමකින් යුත් ත්‍රිපිටකය, හෙළ වෙදකම, දේශීය සටන් ක්‍රම, නක්ෂත්‍ර වැනි බොහෝ දේ පිළිබඳ විශාල දැනුම් සම්භාරයක් රැගත් පුස්කොළ පොත්වලට අත්වී ඇත්තේ ද එම ඉරණම

ය. වර්තමානයේ විවිධ පාරිසරික හේතූන් හා මානව ක්‍රියාකාරකම් නිසා මෙම වටිනා ලේඛන විනාශ වීමේ තර්ජනයකට මුහුණ දී තිබේ.

මනුෂ්‍ය ක්‍රියාකාරකම් ඇතුළු විවිධ විනාශකාරී බලපෑම්වලින් පුස්කොළ පොත් ආරක්ෂා කර ගැනීම සඳහා ශාස්ත්‍රාභිලාෂී ගිහි පැවිදි උගතුන් විද්වතුන් හා සාමාන්‍ය පොදු ජනතාව විසින් පැරණි අවධියේ සිට ම විශාල වෑයමක් දරා තිබේ. බ්‍රිතාන්‍ය යටත් විජිත යුගයේ පවා පුස්කොළ ආරක්ෂා කර ගැනීම සඳහා කළ එබඳු ප්‍රශංසනීය ක්‍රියාකරකම් පිළිබඳව නොයෙක් විට සඳහන් වී තිබෙන බව කොළඹ ජාතික කෞතුකාගාරයේ ඇති මහාවග්ගපාලියෙන් විවරණය වේ. ඒ සඳහා නීති රීති ද පනවා ඇති බවට පැවසේ.

එම ප්‍රයත්නයෙහි ප්‍රතිඵලයක් ලෙස මේ වන විටත් පුස්කොළ පොත් විශාල ප්‍රමාණයක් ශ්‍රී ලංකාවේ කෞතුකාගාර පුස්තකාලවල, විහාර, කෝවිල්, පල්ලි වැනි ආයතනවලත් පෞද්ගලික තැන්පතුවලත් ශේෂව පවතී. එයින් කොළඹ ජාතික කෞතුකාගාර පුස්තකාලයේ 5000කට අධික ප්‍රමාණයක් ද පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 3000කට අධික ප්‍රමාණයක් ද එක්රැස් කර තිබේ. අති විශාල පොත් හා ලේඛන ප්‍රමාණයක් ත්‍යාග මිලදී ගැනීම් ලෙස හෝ බලහත්කාරයෙන් විදේශීය රටවලට ගෙන ගොස් තිබේ. බ්‍රිතාන්‍ය කෞතුකාගාරය, ඉන්දීය පුස්තකාලය, පෙරදිග හා අප්‍රිකා විද්‍යාතන පුස්තකාලය, රාජකීය ආසියාතික සංගමයේ පුස්තකාලය, නෙදර්ලන්තය, පෘතුගාලය, බුරුමය වැනි සමහර රටවල පුස්තකාලවලත් විශාල ප්‍රමාණයක් පුස්කොළ පොත් තිබේ.

මෙවැනි දේශීය හා විදේශීය පුස්තකාලවල තිබෙන පුස්කොළ පොත් පිළිබඳව උගතුන් කිහිපදෙනෙක් ම පුස්කොළ පොත් නාමාවලියක් ප්‍රකාශයට පත්කළහ. ඒ අතර ලුවිස් ද සොයිසා මුදලි, ඩබ්. ඒ. සිල්වා, පී. ඊ. පී. දැරණිගල, කේ. ඩී. සෝමදාස යනාදි උගතුන් විසින් සම්පාදිත නාමාවලි ඉතා වැදගත් විය. එහෙත් පුස්කොළ පොත් පිළිබඳව කෙටි පොදු විස්තරයක් ද, පොතේ නම ද, තිබෙන ස්ථානය හැර වෙනත් තොරතුරු කිසිවක් කෙරෙහි ඔවුන්ගේ අවධානය යොමු වී නැත. ලංකාවේ තිබෙන පුස්කොළ පොත් පිළිබඳව වඩාත්ම නිවැරැදි වූ ලේඛනය සෝමදාස මහතාගේ ලේඛනයයි. (ලගමුව, 2006, පි. 255)

මේ පුස්කොළ පොත් නාමාවලිවල කාලනිර්ණය හා ඒවා සංරක්ෂණය පිළිබඳ සඳහන් නොවේ. 20 සියවසේ අපර භාගයේ දී පුස්කොළ පොත්වල පර්යේෂණාත්මක ව අවධානය යොමු විය. සමහර පුස්කොළ පොත් හා ඒවායේ අන්තර්ගත විෂයන් පිළිබඳව ජනතාවට යම් අවබෝධයක් ඇති කිරීමට එය හේතු විය. එහෙත් පුස්කොළ පොත්වල අඩංගු වී තිබෙන දැනුම් සම්භාරය පිළිබඳව

තවමත් නිසි අවබෝධයක් සාමාන්‍ය ජනතාවට පමණක් නොව උගත් බුද්ධිමතුන් බහුතරයකට ද නැත. වර්ෂ 1931 ජනවාරි මස 17 දින ඊ. ඩබ්. පෙරේරාගේ යෝජනාව අනුව හර්බට් ස්ටැන්ලි ආණ්ඩුකාරවරයා විසින් පුස්කොළ පොත් ඇතුළු අත් ලිපි සම්බන්ධයෙන් ඓතිහාසික කොමිසමක් පත්කොට වගකීම් පවරන ලදී. මේ ආදී වශයෙන් එකල පුස්කොළ පොත් සංරක්ෂණය කෙරේ යොමවූ ඇති බව පෙනේ.

පුස්කොළ විනාශ කිරීමේ ප්‍රධාන බලවේග දෙකෙන් එකක් වන්නේ මිනිසා හා සතුන්ය. දෙවැන්න ස්වභාවික පාරිසරික සාධකයි. පුස්කොළ ආරක්ෂා කර ගැනීමෙහි ලා ප්‍රබලතම ආරක්ෂකයා මිනිසා වන්නා සේ ම අවාසනාවකට මෙන් ඒවා විනාශ කිරීමේ ප්‍රබලතම සාධකය වන්නේ ද මිනිසාය. පුස්කොළ පොත්වල අගය පිළිබඳව ඇති අනවබෝධය නිසා ඒවා නොසලකා හැරීමෙන් ද විනාශ වෙයි. අක්‍රමවත් ලෙස පරිහරණය කිරීම නිසා ජලය, දහදිය, තෙල්, විවිධ වර්ණකාරක ගෑවීම, තැළීම, පොඩි වීම, කැඩීම හෝ ඉරීම මඟින් ද හානි වෙයි. මුද්‍රිත පොත් තිබෙන සමහර පුස්කොළ පොත් අනවශ්‍ය යැයි ඉවත දැමීමෙන් නාස්ති වෙයි. පන්සල් පල්ලි හා කෝවිල් වැනි ආයතනවල සුදුසු පූජ්‍ය පක්ෂයේ අධිපතිවරුන් නොමැතිකම, අසමගිය, සොරසතුරු උවදුරු වැනි හේතු මඟින් පොත් විනාශ මුඛයට යොමු වී ඇත. විශේෂයෙන් ම නිදන් මංකොල්ලකරුවන් හා පැරණි භාණ්ඩ එකතුකරන්නන් අතින් බලවත් විනාශයක් සිදුවෙයි. විදේශකයන් විසින් පුස්කොළ පොත් ගෙනයෑමත් සමහර ස්වදේශිකයන් විසින් පොත් හෝ පොත්වල කොටස් ඔවුන්ට විකිණීම හා අපනයනය කිරීමත් නිසා පොත් විශාල ප්‍රමාණයක් අහිමි වී ඇත.

පෞද්ගලික පුස්කොළ පොත් එකතුන් අයිතිකරුවන් විසින් නොසලකා හැරීමෙන් ඒවා පරිහානියට පත්වෙයි. සමහරවිට ඒවා තැන්පත් කර ඇති ස්ථානවලට ජලය කාන්දුවීම, කෘමීන් ඇතුළුවීම හෝ දිරාපත්වීමෙන් විනාශ විය හැකිය. එසේම පොත් වැරදි ආකාරයට හැසිරවීම, නොනිසි ගබඩාකරණය, ගිනිගැනීම් හා අනිසි ප්‍රදර්ශනය කිරීම යනාදී ක්‍රියාදාමවලින් ද පුස්කොල පොත් විනාශ වීම සිදු වේ. එමෙන්ම පුද්ගල සන්තක පොත් හා ලේඛන රජයේ පුස්තකාල, කෞතුකාගාර හෝ දෙපාර්තමේන්තු වැනි ආයතනයකට ලබාගැනීමට නොහැකිවීමත් තමන් සතු එම පොත් හෝ ලිපි ලේඛන සංරක්ෂණය කිරීම පිළිබඳව දැනුමක් ඔවුන් සතු නොවීමත් එ නිසාම කියවීමට අපහසු වන්නා වූ ද, අබලන් වන්නා වූ ද පොත් ඒවායේ හිමිකරුවන් විසින් ඉවතලීමත් මිනිසා විසින් කරන විනාශයන් ය. දිරාපත් වූ පොත්පත් නැවත පරිහරණය කිරීමෙන් ද හායනයවීම කඩිනම් වෙයි.

මෙසේ මිනිස් ක්‍රියාකාරකම් මඟින් සිදුවන විවිධ විනාශකාරි හායනවලින් පුස්කොළ පොත් ආරක්ෂා කරගෙන සංරක්ෂණය කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග කිහිපයක් ම තිබේ. පළමුවෙන්ම දේශීය විදේශීය ආයතනවල හා පුද්ගල සන්තක පුස්කොළ පොත් පිළිබඳ සමීක්ෂණයක් කොට ලේඛනගත කිරීම, සුචිකරණය කිරීම, නාමාවලිය සැකසීම යනාදි මූලික ප්‍රතිග්‍රහණ කාර්යයන් කළ යුතුය.

පසුගිය කාලය තුළ මෙන් ම වර්තමානය වන විට ද මේ සඳහා විවිධ ආයතන මැදිහත් වී පුස්කොළ පොත් සංරක්ෂණ ව්‍යාපෘති මෙන් ම ජනතාවගේ ආකල්ප වර්ධනයට නොයෙකුත් කර්තව්‍යයන් සිදුකරමින් පවතී. එම ආයතන උක්ත කාරණය සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද යන්න විමර්ශනයට ලක් කළ යුතු කාරණයකි.

**පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පුස්කොළ පොත් සංරක්ෂණය**

පුස්කොළ පොත් තුළ අන්තර්ගතව පවත්නා මහා දැනුම් සම්භාරය මතු පරපුරට දායාද කිරීමේ අරමුණින් පේරාදෙණිය විශ්වවිද්‍යාලය මඟින් එහි ඇති මෙරට දෙවන විශාලතම පුස්කොළ පොත් එකතුව සංරක්ෂණය කිරීමේ වැඩපිළිවෙළක් ආරම්භ කර තිබේ. කොළඹ ජාතික කෞතුකාරයට පමණක් දෙවැනි මෙම විශ්වවිද්‍යාලයේ පුස්කොළ පොත් එකතුව පොත් 5200කට ආසන්නය. මහාවංශය, රාජාවලිය, විසුද්ධ මග්ගය, පන්සිය පනස් ජාතකය ඇතුළු දේශීය වෙදකම, ගුප්ත විද්‍යාව, පුරාතන සිංහල සාහිත්‍ය, බලි තොවිල් හා යාග කර්ම ඇතුළු විෂය ක්ෂේත්‍ර ගණනාවක් ඔස්සේ ලියවුන පුස්කොළ 250000ක් පමණ මෙම පොත් එකතුවට අයත්ය.



***ඡායාරූපය 01:*** *පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පුස්කොළ පොත් එකතුව*

මෙයට අමතරව එකළ නිකුත් කළ සන්නස් ගණනාවක් ද ආරක්ෂා සහිතව විශ්වවිද්‍යාලය සතුව පවතී. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වැඩබලන පුස්තකාලයාධිපති ආර්. මහේෂ්වරන් මහතාගේ මඟ පෙන්වීම මත මෙම පුස්කොළ පොත් සංරක්ෂණ පියවරේ ප්‍රධාන අංගයක් වන කළු මැදීම සිදු කරනු ලබන්නේ පුස්තකාලයේ විශේෂ ශ්‍රේණි නිලධාරි එච්. එම්. හේරත් බණ්ඩා මහතාය.

**කේ. ඩී. සෝමදාස මෙහෙවර**

පුස්කොළ පොත් එකතු කර සංරක්ෂණය කිරීමේ මූලික පියවර ගෙන ඇත්තේ හිටපු පුස්තකාලයාධිපති සෝමදාස මහතාය. මෙම ව්‍යාපෘතිය අරඹා ඇත්තේ වෙහෙර විහාරස්ථාන ඇතුළු විවිධ ස්ථාන වෙත ගොස් පැරණි පුස්කොළ පොත් ඒකරාශී කරමින්ය. ඔහු මේ සඳහා විශාල වශයෙන් වෙහෙස වූ බව පැවසේ. වී අටුවක දොර වෙනුවට පුස්කොළ පොතක් තබා ඇති බවට ලද තොරතුරක් අනුව ඔහු එහි ගොස් දොරක් සාදවා එයට සවිකර දී පුස්කොළ පොත ඉල්ලාගෙන ඇත. එම පුස්කොළ පොත පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ තබා ඇති බව සඳහන් වේ.

1971 දී සෝමදාස මහතා පුස්කොළ පොත් නාමාවලියක් එළි දක්වා ඇත. 1991 වසරේදී අවසන් වරට මෙම නේත්‍ර පිංකම සිදු කර ඇත. වසර 28කට පසුව විශ්වවිද්‍යාලය මඟින් මෙම සංරක්ෂණ වැඩපිළිවෙළ නැවතත් ආරම්භ කර ඇත. පාරම්පරික ඥානය මතු පරපුරට දායාද කිරීමට දරන මෙවන් කර්තව්‍යයන් ඉතාමත් අගය කළ යුතුය.

**කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්කොළ පොත් ඩිජිටල් තාක්ෂණයෙන් පිටපත් කිරීම හා සංරක්ෂණය**

පුස්කොළ පොත්වල සඳහන් කරුණු ඩිජිටල් තාක්ෂණයෙන් පිටපත් කිරීම ද ඒවා සංරක්ෂණය කරලීමට ද වැඩපිළිවෙලක් කැලණිය විශ්වවිද්‍යාලය අරඹා ඇත.

ලංකාවේ පවතින පැරණි ම පුස්කොළ ග්‍රන්ථය වන චුල්ලවග්ගපාලිය කැලණිය විශ්වවිද්‍යාලය සතුව ඇති බව පැවසේ. පුස්කොළ ලේඛන කලාව සම්බන්ධ සරසවිවල විද්‍යාර්ථයින්ගේ උනන්දුව ඉතාමත් හීනය. මේ පිළිබඳව විශාල උනන්දුවක් දක්වන සමයක සිංහල අකුරු ලිවීම ගැනවත් අවධානය යොමු කරනන් බෙහෙවින් අඩුය. මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට හේතු වී ඇත්තේ විහාරස්ථානවල නිවෙස්වල ඇති පොත් ලබාදීමට ඔවුන් තුළ වූ අකැමැත්ත නිසාවෙනි. නමුත් කැලණිය විශ්වවිද්‍යාලය පවත්වාගෙන යන ඩිජිටල් පුස්තකාලය ගැන හෝ පුස්කොළ සංරක්ෂණය පිළිබඳව බොහෝ දෙනෙක් දැනුවත් නැත. මේ කාර්යයට

රජයෙන් මූල්‍යාධාර නොලැබෙන අතර සියල්ල පවත්වාගෙන යන්නේ සමාජ විද්‍යා පීඨයේ අරමුදල්වලිනි. ආචාර්යවරයෙකුගේ අනුමැතිය ඇතිව ශාස්ත්‍රීය මට්ටමේ හැදෑරීමට පැමිණෙන සිසුන්ට ඩිජිටල් පුස්තකාලයේ පුස්කොළ කියවීමට සේම එම එකතුව දැක බලා ගැනීමටත් හැකියාව ඇත. සිසුන්ගේ පහසුව තකා කාණ්ඩගත කිරීම ද සිදු කර ඇත. පුස්කොළ පොත් සංරක්ෂණය සියලු දෙනාටම සිදුකළ නොහැකි අතර ඒ සඳහා මනා දැනුමක් ද අවශ්‍යය. මෙවන් වටිනා ව්‍යාපෘති දියත් කිරීම තුළින් පාරම්පරික උරුමය පිළිබඳ ජනතාවගේ නව ආකල්ප වර්ධනට රුකුලක් වනු ඇත.

**රිදී විහාරයේ පුස්කොළ පොත් සංරක්ෂණය**

කුරුණෑගල රිදී මහා විහාරයේ ඇති පුස්කොළ පොත් විද්වත් මණ්ඩලයක් මඟින් පරීක්ෂා කර සංරක්ෂණය සඳහා අවශ්‍ය පියවර මෛත්‍රීපාල සිරිසේන මහතා ජනාධිපතිව සිටි කාලය තුළ සිදු වී ඇත. මෙම පියවර ගෙන ඇත්තේ බුදු දහමේ හර පද්ධතියට හානි කරමින් විකෘති කරවීම හා වැරදි අර්ථකථන ලබාදීම වැළැක්වීම සඳහා එය ජාතික උරුමයක් ලෙස නම් කිරීමෙන් පසුවයි. එහි එක් අදියරක් ලෙස කුරුණෑගල රිදී මහා විහාරයේ පුස්කොළ පොත් සංරක්ෂණය සඳහා පියවර ගැනීම සිදු කර ඇත.

**නිගමනය**

පැරණි ලක්දිව අක්ෂර හා ලේඛන කලාව ආරම්භ වූයේ ඉන්දියාවේ ආභාෂය ඇතුළු රටවලට සමගාමීවය. මහින්දාගමනයත් සමඟ ශ්‍රී ලංකාවේ ලේඛන කටයුතු තවත් පුළුල් වූ අතර ක්‍රි. පූ. 3 සිට නිශ්චිතවම ලංකාවේ පුස්කොළ පොත් ලේඛන කලාව ව්‍යාප්ත විය. එසේම වර්තමානය වනවිට ද මෙම කලාවේ නිරතවන ගිහි පැවිදි ලේඛකයන් කිහිපදෙනෙක් හෝ සිටින බැවින් ලංකාවේ පුස්කොළ පොත් කලාව මුළුමනින්ම අභාවයට ගොස් නැති බව ද නිගමනය කළ හැකිය.

පුස්කොළ පොත්වල විෂය ක්ෂේත්‍රය විවිධ අංශ ආවරණය වන පරිදි රචනා කර තිබේ. ආගම, කලාව, සාහිත්‍යය, සමාජීය ආර්ථික, සමාජීය, දේශපාලනික හා සංස්කෘතික අතින් මහත් වූ වැදගත්කමක් මෙම පුස්කොළවල අන්තර්ගතය දෙස බැලීමේ දී පැහැදිලි වේ. වර්තමානය දක්වා ශේෂව පැවති පුස්කොළ හුදෙක් ලේඛන විශේෂයක් පමණක් නොව අගනා පුරාවස්තු සම්භාරයක් බව ද අවධාරණය කළ යුතුය. වර්තමානය වන විට පාරිසරික හේතූන් සහ මානව ක්‍රියාකාරකම් නිසා මෙම වටිනා ලේඛන ජාතියට ආගමට අහිමිවීමේ තර්ජනයකට මුහුණ පා ඇති බව පැහැදිලිය. එසේම ජනතාවගේ පුස්කොළ පොත් සම්බන්ධව ඇති ආකල්ප ද එතරම්

සුබදායක මට්ටමක නැත. මෙවන් තත්වයක් තුළ පුස්කොළ පොත් ලිවීමේ හා සුරැකීමේ පැරණි තාක්ෂණය වර්තමානය සමාජය තුළ ප්‍රචලිත කිරීම අත්‍යවශ්‍ය වී ඇති අතර ඒවා විභවමය අයුරින් භාවිතා කිරීම පිළිබඳව යළි සලකා බැලීම ද කළ යුතුය. මෙම සන්දර්භය තුල පුස්කොළ පොත්වල වැදගත්කම වර්තමාන සමාජයට ලබාදීම පැරණි පුස්කොළ පොත් සංරක්ෂණය කිරීම හා වර්තමාන ජාතික සංවර්ධන ක්‍රියාදාමය තුළ ඒවා ප්‍රයෝජනයට ගැනීම යන කරුණු අන්තර්ගත වූ ව්‍යාපෘති සැකසීම කාලෝචිතය.

## ආශ්‍රිත ග්‍රන්ථ


ලගමුව, ඒ, (2006). ශ්‍රී ලංකාවේ පුස්කොළ පොත් ලේඛන කලාව, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

ඇල්ලේපොළ, ඩී. (2007). තල්පත් ලිවීම, සංස්කෘතික අමාත්‍යංශය.

ඩිජිටල් තාක්ෂණයෙන් පුස්කොළ පොතට පණ දෙයි. විජය පුවත්පත. www.lankadeepa.lk
කුරුලුවංශ, ඒ. (2018, මැයි, 08). පුස්කොළ දැනුමට සරසවි බැල්මක්. *දිනමිණ.* https://www.dinamina.lk

(2019 ජූලි 11). රිදී මහාවිහාරයේ පුස්කොළ සංරක්ෂණය කෙරේ. RU News. මාර්ගගත. (2022 ජනවාරි 20). https://www.runews.lk

(ජනවාරි 19 2017). ලංකාවේ පුස්කොළ පොත් ගැන දැන ගන්න ඕන කාරණා පෙළක්. මර්ගගත. (2022 ජනවාරි 20). https://www.yamu.lk

# An Important Yet Almost Overlooked Museum Visitor Group: An Assessment of Heritage Interpretation Available for Children at Sri Lankan Museums

**[1]Rishini Fernando, [2]Suvimali Rathnayake, [3]Hamzayini Pirashath, [4]Yeshanthika Jayarathne**

[1,3]Assistant Lecturer, Department of Tourism and Hospitality Management,

Sri Lanka Institute of Advanced Technological Education, Colombo, Sri Lanka.

[2]Lecturer, Department of Archaeology, University of Kelaniya, Sri Lanka.

[4]PhD. Scholar, Department of Anthropology, University of Sri Jayewardenepura.

Corresponding Author: rishini@sliate.ac.lk

## *Abstract*

*Sri Lanka is a hub for both cultural and natural heritage. This has led the country to operate a considerable number of state museums to make visitors learn and witness the heritage resources collections conveniently. These have become crucial tourism earning points as well. Children, both local and foreigners are usually accompanied by adults and are a prominent and unique visitor group. Many other countries seem to be keen on initiating children's museums and introducing creative interpretation techniques for children, particularly as the way children grab concepts are different from adults. This present study was conducted to investigate the currently available interpretation techniques for children at state museums in Sri Lanka, the engagement level of children during the museum visits along with the extent they have understood the key concepts or stories, and the potential ways of improving heritage interpretations for children in the future. A mixed research approach was followed and primary data were collected from stakeholders such as the adult visitors, child visitors, museology undergraduates, and museum curators. Frequency measures under Descriptive statistics and content analysis were analytical tools used. The findings indicate that Sri Lanka is somewhat a laggard in terms of heritage interpretation aimed at children. Recommendations were made by the researchers to overcome this situation and be more effective in the relevant practice.*

***Keywords:*** *Children, Child Psychology, Heritage Interpretations, Heritage Tourism, Museums, Sri Lanka*

## Introduction

Paying visits to museums that indicate values of cultural, natural, and scientific heritage has been considered a mode of education for a longer period of time in almost all the countries. Sri Lanka is no exception to this. It is an established practice to organize museum educational trips for primary school students. Even the parents tend to take their kids on casual museum visits during school holidays. In addition to that, the country being a top international destination, a larger number of foreign tourists along with their children visit the major museums of Sri Lanka when they fly down to the island.

By considering these facts, it can be noted that the children accompanied and led to museums by the adults are a significant visitor group (Beaumont & Sterry, 2005; Davidson & Black, 2007; Fanning, 2007; Gennaro, 1981; Kopelke, 2010; Sterry, 2007). Previous researches point out that if a human has fond memories of the museum visits of their tender years, they are more likely to be admirers of heritage and inclined to conserve those resources when they become adults. This means positive experiences can create life-long inspirations (Kindler & Darras, 1997; Sutcliffe & Kim, 2014).

Staiff (2013) makes his readers re-think the emphasis on learning over experience which has already and increasingly become an issue within heritage interpretation. This also indicates the need for creative interpretation techniques which makes sites alive to encourage children in experiencing the natural and cultural heritage values firsthand.

On the other hand, the psychology of children is different from that of adults. The way children perceive things, the way they relate to the things that they notice are different from the ways a mature adult does. Jean Piaget's (1950) through his theory of cognitive development argued that a child's cognitive development is not just about acquiring knowledge, but the child requires to develop or construct a mental model of the world. As children grow their

thinking goes from more rudimentary and concrete to more abstract states; for an instance, younger children are not capable of manipulating may be numbered in their head like adults can so they need to use their fingers to do the math. Children have less developed mental structures and also due to lesser experience in the world than an adult, less sophisticated social skills and knowledge (Pahalwan, 2021).




***Figure 01:*** *Paiget's Stages of Cognitive Development*

Paiget's Stages of Cognitive Development as shown in the above image illustrates that humans below the age of 12 years of their entire life span have a different cognitive pattern on contrary to 12 years and above.

This understanding of child psychology has led many countries to revamp their interpretation techniques directed at children. A number of overseas countries even do have separate museums designed to educate children. Some other museums provide a kid's section at the usual major museums so that children can engage in games, touch, test, and observe the prototypes of the actual artifacts displayed in the main lobby. The 'please touch museum'

in Philadelphia is focused on providing children a place to touch all the objects at the museum and learn.






***Figures 02 & 03:*** *Children's Museum of Indianapolis & 'Please Touch Museum' in Philadelphia*

However, the children are somewhat overlooked when it comes to heritage interpretations at Museums of Sri Lanka according to the previous personal observations of the researchers of this present study. The interpretation for children, in particular, seems not to be undertaken strategically given the fact that children's visitor group is considered merely as part of a family unit rather than a separate and prominent visitor group. Furthermore, the academic research in this regard in the Sri Lankan context falls behind the research in the same area in the international context. These two situations point towards a research problem to be investigated formally.

Given all the above facts, the present researchers carried out this study aiming at comprehending the currently available interpretation techniques for

children at state museums in Sri Lanka, the engagement level of children during the museum visits along with the extent they have understood the key concepts or stories and the potential ways of enhancing heritage interpretations for children in the future time to come.

**Methodology**

Researchers of the present study adopted the mixed approach in order to accomplish the previously explained research objectives. The research area was all the state museums operated in Sri Lanka.

All the adult visitors who have taken children below 12 years to a state museum during the period of past three years; 2018 – 2021 and the children themselves, undergraduate students who are currently taking lectures and practicing for the subject of museology, and the museum curators were considered as the population of the study from which a sample of 46 members was extracted through convenience sampling technique.

Primary data was collected from adult visitors, undergraduates, and museum curators through questionnaires consisting of both close-ended and open-ended questions, and semi-structured interviews while data was also gathered from children by making them engage in friendly discussions. Secondary data was collected from reliable websites, articles, and previous research papers relevant to the keywords of this present study.

Frequency measurements of Descriptive statistics and content analysis method were followed to analyze the collected data to make conclusions.

## Results & discussion

### *Degree of interpretation availability for children at state museums in Sri Lanka*

When the respondents were asked to mention the names of the museums that they visited during the aforementioned time period, it was revealed that they have visited museums that are majorly operated under the Department of National Museums and the Central Cultural Fund. The mentioned museums were Colombo National Museum, Maritime and Naval History Museum in Trincomalee, Dutch Museum, National Museum of Kandy, World Buddhist Museum, National Museum of Natural History, Galle Maritime Archaeology Museum, and Sigiriya Museum. It was revealed that the museums operated under the Department of National Museums do not use specialized interpretation methods for children under 12 most of the time.





**Figure 04:** Availability of interpretation for children below 12 years

According to the above pie chart, a percentage of 77.3 has pointed out that there are no specifically designed heritage interpretation techniques for children below 12 years old, at museums operated under both the department and CCF. However, 22.7% have come across interpretations aimed at children to a limited degree.

### *Types of available interpretation techniques*

It is essential to assess what the above-mentioned 22.7% of respondents have observed at these sites. According to the members of the sample who have experienced interpretation for children, there are some commendable and developable techniques available at a few of the state museums, majorly the ones operated under the CCF. Those efforts should undoubtedly be appreciated for the time being as something is always better than nothing. These methods were mostly introduced by the young fresh graduates who get employed at museums. Some of the techniques include teaching the kids to write Sinhalese letters, painting and drawing activities, reassembly of clay pots shattered into pieces, making beaded necklaces and filling puzzles, etc. Moreover, the visitors who had paid a visit to the Naval Museum have experienced activities aimed at kids such as displaying artifacts inside fish tanks, providing the freedom for children to play around while observing the artifacts, and employing cartoons for explanations. The natural museum of Colombo provides the platform for the kids to reassemble the prototype version of skeletons of fauna.

### *The engagement level of children during the museum visits along with the extent they have understood the key concepts or stories*

When the personal observations of the researchers of this study and the friendly discussions conducted with the children concerned, it could be noted that the engagement level of kids during museum visits is rather lower. Some children talked enthusiastically about their visit and the drawing that they were able to do. Filling out puzzles seemed to be remembered and appreciated by the kids too. But they seem to lack interest in some activities such as reassembling the beaded necklace and pottery sherds as those take much time and concentration from the children's end. However, when they were asked about the stories behind the activities they have and the stories of

artifacts, the majority of them failed at reflecting on the story except for a few of the kids.





***Figure 05:*** *Photographs were taken by respondents which indicate the usage of paintings and puzzles as interpretation methods at the Jethavana Museum*

"…. there were small ships (prototypes) inside glass boxes. Those were about the people who sailed the seas. I drew a ship and ocean and they (the staff) pasted it on the drawing board." (An 8 years old child respondent who had visited Maritime Museum, Galle)

This quoted statement of a child shows that introducing these activities has enabled the children to be related to the artifacts displayed to some extent,

but the pinnacle of this effort should be to make the kids understand and remember the stories behind.

***The deficiency of heritage interpretation for children should be addressed***

Addressing the weaknesses of the current situation can lead to revamping the interpretation extended for future child visitors. Not paying much attention to 4-6 age group, lack of understanding of child behaviors and child psychology and interests when planning, being laggards in adopting new technology in interpretation, inadequate museum staff; especially the trained staff to deliver interpretation aimed at children, financial barriers, not specially focusing on museum interpretation but just providing activities for kids, information being mostly disseminated via text panels which makes it inconvenient and unappealing for the kids to grab their mind around the idea, most museums practicing interpretation only with the form of guided walks generally relevant to adults rather the interactive activities for kids, the typos and errors in language used for naming labels, the noisy overcrowds at these sites which fail to be proper learning places, not refurbishing the damaged properties of the site and poorly working scanning codes were the major weaknesses which were pointed out by the adult respondents of the two categories, namely: adult visitors and museology practitioners.

## Conclusions

In a concluding remark, it could be said that even though the heritage interpretations available for children at state museums of Sri Lanka are not entirely null, there are still pivotal shortcomings to be sorted out. If more attention was given to those weaknesses along with visitor feedback, innovative ideas can be implemented to make the museum visits more memorable and knowledge sharing.

## Recommendations

Considering the suggestions made by respondents and focusing on the best practices around the world that the researchers of the present study came across during the literature survey, the following recommendations could be made.

The first and the most critical factor is looking at and treating the children as a separate visitor group, not merely as ones accompanied by adults. By doing that only, the relevant practitioners will be able to successfully craft the strategies to implement. Marketing philosophies and psychology should be concerned in this matter.

Museums are no longer seen as just a storehouse that preserves historical or scientific artifacts. There is more to that. museums can be considered universal educational institutes. At present, there are various methods to integrate museum education and technology in order to improve the interpretation methods at the museum.

Children who visit museums expect an enjoyable experience there. So that it is vital to implement more enjoyable yet educational programs at the museums such as guided tours and educational dialogues etc. For an instance Sri Lanka which has a long and abundant history one can use role-play and museum theatre in order to educate the young audience about the important historical events in Sir Lankan history. Wearing the costumes relevant to the past stories during these activities would be rather effective. i.e., kings, queens, sailors, etc.

These tactics go hand in hand with the concept called Edutainment: the concept of learning and teaching new facts via an enjoyable experience. The psychology of humans by its nature prefers entertainment which brings a level of engagement that motivates learning and stimulates retention. The release of happy hormones dopamine and endorphins in the brain during

enjoyable experiences triggers positive associations and stimulates long-term memories. With the realization of this dual mission, museums; international ones in particular increasingly rely on the integration of new storytelling techniques and technologies. These help to immerse and engage audiences. Sri Lanka can successfully move forward with the same concept as we have an abundance of stories of the past as previously mentioned. This is quite likely to be a very enjoyable yet rich in knowledge experience (Moustafa, 2020).

Furthermore, learning games such as puzzles, historical games, competitive games, etc. can be organized at the museum as children prefer more interactive activities. These kinds of activities help to develop critical thinking ability and creative thinking skills etc.

Moreover, with the advancement of new technology, it is important to use these futuristic new technological methods at the museum. For example, using AR and VR technology, interactive touch screens, and video games that tells the story of the Sri Lankan past can improve learning outcomes through increased interactivity. It is important to implement new learning methods to improve and nurture the knowledge in more enjoyable ways for the children.

Videos and documentary films for children are again an intriguing way to plant enthusiasm in a child's mind. As they become interacted with audiovisual contents of their capacity. Audiovisual communication methods are capable of enhancing the interest among the children and it is easy to grasp every single detail in this way. for an instance such as showing the introductory videos and background noises or oral history.

Another suggestion is to make the children engage in Group activities of a similar age and facilitate them to have family trials or Parent-Child Interaction activities.

In addition to that, museums can use detailed demonstrations and practical workshops as a sound learning experience. with the guidance of local experts such as craftspeople, artists, and technicians, museums can make the children comprehend Sri Lanka's clay pots, wood carvings, etc. Through these workshops, children would be encouraged to make use of one major way that they learn things; ‘touch’. Making them create different crafts with given raw materials under the supervision of local craftsmen will require the active participation of children. Customized museum publications for children under 12 can also be introduced while including more cartoon characters, animated characters, and colorful images.

The recommendations given would be capable of addressing the deficit of heritage interpretation techniques which are supposed to attract and retain the children to Sri Lankan museums and thereby make them grasp the heritage of the country. These efforts are much more likely to support the tourism industry and economic development in return too.

## References


Beaumont, E., & Sterry, P. (2005). A study of grandparents and grandchildren as visitors to museums and art galleries in the UK. *Museum and Society*, 3(3), 167–180.

Davidson, P., & Black, R. (2007). Voices from the profession: Principals of successful guided cave interpretation. *Journal of Interpretation Research*, 12(2), 25–45.

Fanning, C. (2007). Children in interpretation – have we forgotten anyone? *Proceedings of Interpretation Association Australia conference, Sydney*

Gennaro, E. (1981). The effectiveness of using pre-visit instructional materials on learning for a museum field trip experience. *Journal of Research in Science Teaching*, 18(3), 275–279.

Kindler, A. M., & Darras, B. (1997). Young children and museums: The role of cultural context in early development of attitudes, beliefs, and behaviours. *Visual Arts Research*, 23(1), 125–141.

Kopelke, D. (2010). Children are visitors too: Listening to children to improve the effectiveness of interpretive programs. *Proceedings of the National Association for Interpretation International conference, Townsville, Australia.*

Moustafa., R. (2020). The Role of Edutainment In Museums, Learn Through Play. *International Journal Of Multidisciplinary Studies In Heritage Research,* 3(1), 15-19.

Pahalwan, S. (2021). *What are the psychological differences between a child and an adult?*. Quora. Retrieved 20 December 2021, from https://www.quora.com/What-are-the-psychological-differences-between-a-child-and-an-adult.

Piaget, J. *Piaget's Stages of Cognitive Development*. Simplypsychology.org. Retrieved 20 December 2021, from https://www.simplypsychology.org/piaget.html.

Staiff, R. (2013). Re-imagining heritage interpretation. Enchanting the past-future. *Farnham:Ashgate*.

Sterry, P. (2007) Designing interpretation for family visitors at cultural heritage destinations: Issues and solutions. *Proceedings of the National Association for Interpretation International conference, Vancouver, BC, Canada.*

Sutcliffe, K. & Sangkyun, K. (2014). Understanding Children's Engagement with Interpretation at a Cultural Heritage Museum. *Journal of Heritage Tourism*. 9. 332-348. 10.1080/1743873X.2014.924952.

# පුරාවිද්‍යා උරුම කළමනාකරණය කෙරෙහි හානි ඇගයීම් ක්‍රියාවලියේ (AIA) බලපෑම ජාතික උදාහරණ ඇසුරින් අධ්‍යයනයක්

**ඒ.එල්.බී.එම්. අමරසිංහ**

පුරාවිද්‍යා විශේෂවේදී තෙවන වසර,

පුරාවිද්‍යා අධ්‍යයන අංශය,

කැලණිය විශ්වවිද්‍යාලය.

buddhikamadhuwanthi1234@gmail.com

## සංක්ෂේපය

*පුරාවිද්‍යා උරුමයකින් නිරූපනය වන්නේ යම් රටක අනන්‍යතාවයයි. නමුත් එම රටේ සිදුවන සංවර්ධන ව්‍යාපෘති හෝ වෙනත් කුමන හෝ හේතු පදනම් කොටගනිමින් එම රටේ උරුමය විනාශ වන්නේ නම් සත්‍ය වශයෙන් අප සිදුකරනු ලබන්නා වූ කාර්යය නිශ්ඵල වේ. එනිසාම  සිදුකරනු ලබන ව්‍යාපෘතියේ සාර්ථකත්වය හා උරුමයේ පැවැත්ම තහවුරු කරන්නා වූ ක්‍රියාවලියක් කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් බවට සමස්ත ලෝකයේ ම අවධානය යොමු වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස යෝජිත සංවර්ධන ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට පෙර පුරාවිද්‍යා හානි ඇගයීමක් සිදුකිරීම අනිවාර්ය වේ. මෙලෙස හානි ඇගයීම් සිදුකිරීම නිසාවෙන් ආරක්ෂා වූ උරුමයන් මෙන්ම නොකිරීම නිසාවෙන් විනාශ වූ උරුමයන් සඳහා ද ජාතික උදාහරණ බොහොමයක් ඇත. මෙහි දී පුරාවිද්‍යා උරුමය කළමනාකරණය කෙරෙහි හානි ඇගයුම් ක්‍රියාවලියේ බලපෑම කෙබඳු ද යන්න පිළිබඳව අවධානය යොමු කරන අතර එහි දී ගුණාත්මක විශ්ලේෂණ ක්‍රමය යොදාගෙන ඇත.*

**මුඛ්‍ය පද:** *පුරාවිද්‍යා උරුමය, හානි ඇගයුම, ජාතික බලපෑම්*

## හැඳින්වීම

යම්කිසි රටක, ජාතියක ඓතිහාසික අනන්‍යතාව ප්‍රකට කරවනු ලබන්නේ එම සමාජය සතු වූ පුරාවිද්‍යාත්මක උරුමය මඟිනි. එනිසා සෑම රටකටම, සෑම ජාතියකට ම පුරාවිද්‍යාත්මක උරුමය ඉතා අගනා වස්තුන් වේ. නමුත් නවීන ලෝකයත් සමඟ ඉදිරියට යෑමේදී සංවර්ධන ව්‍යාපෘතිවලින් මේ උරුමයන් හට බලපෑම් එල්ල කරනු ලබයි. පුරාවිද්‍යා උරුමයේ යථාභූත පැවැත්ම සඳහා විවිධ සංවර්ධන ව්‍යාපෘති මඟින් බලපෑම් ඇතිකරනු කරනු ලැබුවත්, පුරාවිද්‍යා උරුමය විනාශ කොට සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මඟහරවා ගැනීම වැදගත් වේ. ඒ අනුව එයට විකල්ප මාර්ගයක් වශයෙන් පුරාවිද්‍යා කළමනාකරණ සැලසුම් සකස් කිරීම් මඟින් ඒවා ආරක්ෂා කිරීම සඳහා පිළියම් යෙදිය හැක. එසේ සකස් කිරීමට ප්‍රථමව පුරාවිද්‍යාත්මක හානි ඇගයීම් ක්‍රියාවලියක් (Archaeological Impact Assessment (AIA)) සිදුකිරීම වැදගත් වේ.

## පුරාවිද්‍යා හානි ඇගයුම් ක්‍රියාවලිය යනු ?

ඉපැරැණි මානවයා සතු ව තිබූ පාරම්පරික දැනුම් හා සාම්ප්‍රදායික තාක්ෂණික ක්‍රමෝපායන් ඔවුන් තුළින් ක්ෂය වී යාමේ තර්ජනයකට මුහුණ දීම මුලින් ම දක්නට ලැබෙන්නේ පහළොස්වන සියවසෙන් පමණ පසු ලොව ඇති වූ කාර්මික විප්ලවයත් සමඟය. විශේෂයෙන් 1950 දශකයේ දී සුළු වශයෙන් ආරම්භ වී 1960 දශකයේ දී සීග්‍රයෙන් ඉහළ ගිය ලෝකයේ ඇති වූ සංවර්ධන කටයුතු නිසා ඉතා වටිනා පුරාවිද්‍යා ස්මාරක හා පුරාවස්තු වලට දැඩි තර්ජනාත්මක බලපෑමක් ඇති වන්නට පටන් ගත්තේය. එනිසා ඒවා ආරක්ෂා කරගැනීමේ විශාල අභියෝගයකට පුරාවිද්‍යාඥයා මුහුණ පෑවේය. ඒ අනුව ලෝකයේ බොහෝ රටවල්වල ජාතික අභිමානය, අනන්‍යතාවය හා පුරාවිද්‍යා උරුමය ආරක්ෂා කර ගැනීමේ වගකීම පුරාවිද්‍යාඥයා සතුකර ගන්නට විය. එහි ප්‍රතිඵලයක් ලෙස සංවර්ධන ක්‍රියාවලියේ දී විනාශ වීමට හා අහිමි වී යාමේ තර්ජනයට ලක්වන පුරාවිද්‍යා උරුමය අනාවරණය කරගෙන ආරක්ෂා කොට කළමනාකරණය කරමින් අනාගත පරම්පරාවට ඉතිරි කර දීම සඳහා ගත් වැදගත් පියවරක ආරම්භයක් ලෙස ලෝකයේ මුදවා ගැනීමේ පුරාවිද්‍යාව නම් වූ ප්‍රවණතාවයක් ක්ෂේත්‍ර පුරාවිද්‍යාවට එක්විය. ඒ අනුව බේරා ගැනීමේ නැතිනම් මුදවාගැනීමේ පුරාවිද්‍යා ව්‍යාපෘති Archaeological Impact Assessment (AIA), පුරාවිද්‍යා හානි ඇගයීම් ව්‍යාපෘති වශයෙන් 1960 දශකයේ දී ආරම්භ විය. මේ අනුව රටක ජාතික අභිමානය හා උරුමය ආරක්ෂා කර කළමනාකරණය කිරීමේ වගකීම භාරගත් පුරාවිද්‍යාඥයින්ට පුරාවිද්‍යා ස්මාරක හා පුරාවස්තු බේරාගනු වස් හදිසි පුරාවිද්‍යා ගවේෂණ, කැණීම් හා සංරක්ෂණ

කටයුතු පුරාවිද්‍යා ක්ෂේත්‍රය තුළ ආරම්භ කිරීමට සිදුවිය. ඒ අනුව ශීඝ්‍ර සංවර්ධන ක්‍රියාදාමයන් හමුවේ අභියෝගයට ලක් වූ පුරාවිද්‍යා ස්මාරක හා පුරාවස්තු යම් තරමකට හෝ අනාවරණය කර ගනිමින් වාර්තා කොට බේරා ගැනීමට හැකි විය.

**පුරාවිද්‍යා හානි ඇගයුම් ක්‍රියාවලියට අදාළව ලංකාව තුළ බලපවත්වන නීතිය**

පුරාවිද්‍යා බලපෑම් ඇගයීම් ක්‍රියාවලියට අදාලව ශ්‍රී ලංකාව තුළ බලපවත්වන නීතිය පහත පරිදි වේ.

1998 අංක 24 දරන පුරාවස්තු (සංශෝධිත) පනතේ 43 (ආ) වගන්තිය සමග කියවිය යුතු 47 වන වගන්තිය යටතේ සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යවරයා විසින් සාදා 2000.10.04 වන දිනැති අංක 1152/14 ගැසට්පතින් ප්‍රකාශයට පත් කර ඇති නියෝගයන්හි මේ පිළිබදව සඳහන් වේ. මෙම නියෝග 2000 අංක 01 දරන ව්‍යාපෘතිවල කාර්ය පටිපාටි නියෝග ලෙස හැඳින්වෙයි. ඒ අනුව පුරාවිද්‍යා බලපෑම් ඇගයීම් සමීක්ෂණ ක්‍රියාවලියට නතු කළ යුතු බව සඳහන් කර ඇති සියලු ආකාරයන්ට අයත් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පෙර මෙම දෙපාර්තමේන්තුවේ ලිඛිත අවසරය ලබා ගැනීම අනිවාර්ය කටයුත්තක් ලෙස පෙන්වා දිය යුතුය.

මේ ආකාරයට 1980 දශකයේ සිට ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාදාමය නිසා පැරණි උරුමය ආරක්ෂාකර කළමනාකරණය කිරීමේ දැඩි අභියෝගයට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මුහුණ පෑවේය. ඊට අනුව විවිධාකාර අභියෝග හමුවේ ශ්‍රී ලංකාවේ පැරණි උරුමය කළමනාකරණය කරනු වස් 1998 අංක 24 දරණ පුරාවස්තු සංශෝධන පනතින් හා 2000 වසරේ අංක 01 දරණ ව්‍යාපෘතිවල කාර්‍ය පටිපාටි නියෝග යටතේ පියවර රැසක් ගන්නා ලදී. ඊට අනුව පුරාවිද්‍යා හානි ඇගයීම් ව්‍යාපෘති ආරම්භ කරන ලදී. ඒ අනුව මේ වන විට ශ්‍රී ලංකාවේ සංවර්ධන කාර්යයන් සඳහා හසුවන භූමිවල පුරාවිද්‍යා හානි ඇගයීම (AIA) ව්‍යාපෘතිය සාර්ථකව සිදු කරමින් පවතිනු ලබයි.

එහි සඳහන් පුරාවිද්‍යා හානි ඇගයුම් නියෝගවල අනුව ශ්‍රී ලංකා භූමියේ යම් සංවර්ධන කටයුත්තක් සඳහා භූමිය භාවිතා කරන්නේ නම් එම සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වෙන් කරන ලද මුදලින් සියයට එකක් (1%) යොදවා සංවර්ධන කාර්යය ආරම්භ කිරීමට පෙර පුරාවිද්‍යා හානි ඇගයුම් සමීක්ෂණයක් කළ යුතුය. පූරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයාට පුරාවිද්‍යා නියෝජිත ආයතන හරහා එම හානි ඇගයීමේ ව්‍යාපෘති කරවා ගත හැක. එසේ හානි ඇගයීමක් කිරීමෙන් පසු පුරාවිද්‍යා අධ්‍යක්ෂක ජනරාල්වරයාගේ ලිඛිත පූර්ණ අනුමැතිය ලබාගත හැක. අනතුරුව හානි ඇගයීමේ

වාර්තාවේ නිර්දේශ කර ඇති වූ ආකාරයට එම සංවර්ධන කාර්යය ආරම්භ කළ හැකිය. (1998 අංක 24 දරණ පුරාවස්තු සංශෝධන පනත)

නියෝජිත ආයතනය විසින් සති හයක් ඇතුළත පුරාවිද්‍යා හානි ඇගයීම පවත්වා එහි වාර්තාව පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත භාරදිය යුතු වන අතර ඔහු විසින් යෝජිත ව්‍යාපෘතිය තුළ පිහිටි පුරාවස්තු කිසිවකට සිදුවිය හැකි යම් හානියක් අඩුකර ගැනීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති යෝජකයා ගේ වියදමින් එම පුරාවස්තු ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම, කැණීම, ලේඛනාරූඪ කිරීම, ප්‍රසිද්ධ කිරීම, අවශ්‍ය වේ නම් නැවත ස්ථානගත කිරීම පිණිස වැයවන යම් අතිරේක වියදමක් වෙතොත් එහි ඇස්තමේන්තුවක් ද සමඟ යෝජිත ව්‍යාපෘතිය හෝ යෝජනා ක්‍රමය නිර්දේශ කරමින් හෝ විරුද්ධ වෙමින් හෝ වාර්තාවේ සඳහන් කරනු ලබන යම් කොන්දේසි හෝ වෙනස්කම් වලට යටත්ව ඔහුගේ ලිඛිත වාර්තාව අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. (1998 අංක 24 දරණ පනතින් සංශෝධිත 2001 දරණ ව්‍යාපෘතිවල කාර්‍ය පටිපාටි)

පුරාවිද්‍යා හානි ඇගයුම පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහුගේ බලය පැවරූ අයෙකුගේ අධීක්ෂණය යටතේ පවත්වනු ලැබිය හැකිය. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ව්‍යාපෘතියෙහි කාලසීමාව තුළ දී එය නියාමනය කරනු ලැබිය යුතු වන අතර අවශ්‍ය නම් හානි අඩු කිරීමේ වැඩපිළිවෙළක් වෙතොත් එහි වියදම් ව්‍යාපෘති යෝජකයාගේ අයකර ගනු ලැබිය යුතුය.

**පුරාවිද්‍යා හානි ඇගයුම් ක්‍රියාවලිය ජාතික උදාහරණ ඇසුරින් විමසීම**

- **AIA සමීක්ෂණයන් සිදු නොකර සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම නිසා උරුමයන්ට සිදු වූ හානි**

ශ්‍රී ලංකාවේ තිබූ පැරණි ආර්ථික සංවර්ධන ප්‍රතිපත්ති වෙනසකට ලක්කොට බහුකාර්ය ආර්ථික සංවර්ධන ව්‍යාපෘති මඟින් සමාජ ආර්ථික දියුණුවක් ඇති කිරීමේ දී ලංකාවේ උරුම ස්ථාන බොහොමයකට සිදු වූ හානිය සුළුපටු නොවේ. ඒ අතරින් ප්‍රමුඛ ස්ථානයෙහිලා සැලකිය හැකි සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් වන්නේ මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය, උදාගම් ව්‍යාපෘතිය, නිදහස් වෙළෙඳ කලාප ආර්ථික කටයුතු ය. මහවැලි සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමේ දී විශාල ඉඩම් ප්‍රමාණයක් ඒ සඳහා යොමු කිරීමට සිදුවිය. කොත්මලේ ව්‍යාපාරය ඉදිකිරීමේ දී ඉඩම් අක්කර 5000 කට ආසන්න ප්‍රමාණයක් ඊට භාවිතයට ගැනීමේ දී සංස්කෘතික භූ දර්ශනය සමඟ පුරාවිද්‍යා උරුමයන් රාශියක් සඳහා බලපෑම් ඇති කරන ලදී. දැනට අනුමාන කරන තොරතුරු වලට අනුව පුරාවිද්‍යා උරුම ස්ථාන දෙසීයකට ආසන්න ප්‍රමාණයක්

වික්ටෝරියා ජලාශය සඳහා යට කිරීමට සිදුවිය. වර්තමානයේ එම ජලාශය හිඳී ගිය අවස්ථාවල දී පැරණි විහාරස්ථාන කිහිපයකට අදාළ නටබුන් උඩට මතුවන අවස්ථා හඳුනාගත හැකි ය. මෙම ව්‍යාපෘතියේ දී සිදුවූයේ ප්‍රදේශයේ ඓතිහාසික වටිනාකමක් තිබෙන ස්ථාන රාශියක තොරතුරු ජලාශයට යට වීමයි.

මහවැලි සංවර්ධන ව්‍යාපෘතියට ගැනෙන දැවැන්ත බහු කාර්යය යෝජනා ක්‍රම අතර මාදුරු ඔය ව්‍යාපෘතිය ද එවැනි පරිසරයක් නිර්මාණය කළ එකකි. එහෙත් මාදුරු ඔය ව්‍යාපෘතිය මගින් ඊට වඩා වෙනස් අත්දැකීමක් ලබාගැනීමට ද හැකි විය. විශේෂයෙන් 1978 වර්ෂයේ දී ව්‍යාපෘතියට අයත් නව අමුණ ඉදිකිරීමට සැලසුම් කළ ස්ථානයේ වැඩකටයුතු සිදුකරමින් පවතින විට එම ස්ථානයෙන් පුරාණ වැව් බැම්ම හා සම්බන්ධ කොටස් හඳුනා ගැනීමට හැකි විය. එය උස අඩි 75 ක් හා දිග අඩි 900 කින් යුක්ත පැරණි වැව් බැම්මේ වැඩිදුරටත් සොයා ගැනීම් කිරීමේ දී පැරණි වැව් බැම්මේ බිත්තියට අල්ලා තිබූ මැටි එලකයන්හි කොටස් හඳුනාගැනීමට ද හැකි විය. මාදුරු ඔය පිළිබඳ කැනේඩියානු තාක්ෂණික කොමිසම පවසා සිටියේ ලෝකයේ විශාලතම හා ශ්‍රේෂ්ඨ වාරිකර්මාන්ත සේ සැලකෙන මෙසපොතේමියාවේ වාරි තාක්ෂණය හා මාදුරු ඔය පුරාවිද්‍යා උරුමය හා සම්බන්ධ තාක්ෂණික නිපුනණතාවන් සමාන වන බවයි. එය ශ්‍රී ලංකා පුරාවිද්‍යා උරුමයේ ඉතිහාසය පිළිබඳව ඇතැම් කරුණු කියාපාන්නකි. පුරාවිද්‍යා උරුමය හා සම්බන්ධ තොරතුරු වාර්තා වීමෙන් උරුම කළමනාකරුවන් වැඩිදුර පර්යේෂණ හා ගවේෂණ කටයුතු සඳහා සම්බන්ධ වී එය අනාගත පරපුර සඳහා ආරක්ෂා කිරීමට අවශ්‍ය කටයුතු සකස් කරන ලදී. මෙයින් පැහැදිලි වූයේ සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර පූර්ව බලපෑම් ඇගයීමක් නොතිබූ බවත් සංවර්ධන කටයුතු සිදුකරන අවස්ථාවේ අහම්බෙන් හමුවූ උරුම අංග ආරක්ෂා කිරීම සඳහා උරුම කළමනාකරුවන් මැදිහත් වූ බවයි. තව ද සමනලවැව, මාවුස්සාකැලේ, රන්දෙණිගල ආදී ව්‍යාපාර මගින් ද අඩු වැඩි වශයෙන් පුරාවිද්‍යා උරුමයන් සඳහා බලපෑම් ඇති කර තිබේ.

මෑත කාලයේ පුරාවිද්‍යාව උරුමයට බලපෑම් කළ සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් මෙහිදී හඳුනාගත හැකිය. එප්පාවල පොස්පේට් නිධිය ඇසුරෙන් ක්‍රියාත්මක කිරීමට යෝජිත ව පැවැති ඇමෝනියම් පොස්පේට් නිෂ්පාදනය කිරීමට අදාල වැඩසටහන මෙහිදී ප්‍රධාන ස්ථානයක් ගනී. වෙතත් පාරිසරික හා සමාජයීය ප්‍රශ්න හා ආශ්‍රිත ගැටළු පුරාවිද්‍යා උරුමය සඳහා ඇති කරන බලපෑම් මෙහිදී හඳුනාගන්නා ලදී. එනම් 1992 ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සංවර්ධන ව්‍යාපෘතියට එරෙහිව ලබාදුන් නඩු තීන්දුවේ දී ප්‍රකාශ කර ඇති කරුණු අතර තදාශ්‍රිත ජය ගඟ ඇතුළු උරුමයන්ට බලපෑම් ඇතිවිය හැකි බව පෙන්වාදෙන ලදී. දීඝවාපියේ පුරාණ බෞද්ධ විහාරස්ථානයට අදාළ ඉඩම් ජාතිකත්වය පදනම් කරගෙන බෙදා වෙන් කිරීම සඳහා

දේශපාලන මැදිහත්වීම් සිදු වූ අවස්ථාවේ දී අනුරාධපුර යුගයේ අවසාන සමයට අයත් ස්තූපයක් විනාශයට පත්විය. කෙසේ වෙතත් මුස්ලිම් ජනතාවගේ නිවාස ඉදිකිරීම සඳහා වෙන් කර තිබූ අක්කර 278ක කොටස මගින් බෞද්ධ උරුමයන් හමුවීම නිසා එය පුරාවිද්‍යා ස්ථානයක් ලෙස වෙන් කිරීමට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ඉදිරිපත් විය. නමුත් 1998 දී ඩෝසර් කර ජනාවාස ඉදිකිරීමේ දී ස්තූපය විනාශයට පත් විය. එහි පස් පාරවල් සෑදීම සඳහා ඉවතට ගෙන යාම නිසා එහි වූ සංස්කෘතික භූ දර්ශනය සහමුලින්ම වෙනස් විය.

දඹුලු ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය ඉදිකිරීම සඳහා තෝරා තෝරාගනු ලැබුවේ දඹුල්ල විහාරාරාමයට අයත් භූමි භාගයකි. මෙය ඉබ්බන්කටුව වැවට අයත් රක්ෂිත ප්‍රදේශයේ තදාශ්‍රිතයේ ඉදිකරනු ලැබුවේ පුරාණ භූමිය පිළිබඳ පූර්ව බලපෑම් ඇගයීමක් සිදු නොකරය. තවද 1999 දී කිඹිස්ස ගුවන් හමුදා කඳවුර සංවර්ධනය කිරීම සඳහා අදාළ ව්‍යාපෘතිය මගින් සීගිරි චිත්‍ර, පිදුරංග ස්මාරක සඳහා ප්‍රබල පීඩනයක් ඇති කරන බවට අදහස් ඉදිරිපත් වුවත් ඒ පිළිබඳව නිසි බලපෑම් ඇගයීමක් සිදු නොවුණි.

- ❖ **AIA සමීක්ෂණයන් සිදු කිරීම නිසා ආරක්ෂා වූ උරුමයන්**

1970 දශකයේ දී එවකට පැවති රජය විසින් සැලසුම් කොට ක්‍රියාත්මක කරන ලද මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පොල්ගොල්ල හා උකුවෙල යා කරමින් ජලය ගෙනයාමට උමගක් කපා ඉදිකරන ලද ජල විදුලි බලාගාරය හේතුකොටගෙන අනුරාධපුර යුගයට අයත් නාලන්දා ගෙඩිගෙය පිහිටා තිබූ මුළු වෙල් යායම ජලයෙන් යටවීමට නියමිතව තිබුණි. ඒ අනුව නාලන්දා ගෙඩිගෙය එතැනින් ඉවත් කර වෙනත් තැනක නිර්මාණය කිරීමට යෝජනා විය. එම යෝජනාවට අනුව සම්පූර්ණ ගෙඩිගෙය සහිත ගොඩනැගිල්ල පුරාවිද්‍යා සංරක්ෂණ මූලධර්ම වලට අනුකූලව එහි කොටසින් කොටස ගලවා පුරාවිද්‍යා කාර්යාලයේ තිබූ භූමියේ තැන්පත් කරන ලදී. පසුව සම්පූර්ණ භූමිය ම පුරාවිද්‍යා කැණීමකට භාජනය කරන ලද අතර එහි ප්‍රතිඵලයක් ලෙස ගෙඩිගේ මන්දිරයට යටින් වූ පස් ස්ථරයක චතුරශ්‍රාකාර ශිලාමය පාදමක් මතු කරගත හැකිවිය. පසුව එම ගෙඩිගෙය නාලන්දාවෙන් ඉවත් කොට බෝවතැන්න ජලවිදුලි බලාගාරය පිහිටි තැන වූ කඳුගැටයක සවි කිරීමට යෝජනා වුවත් බොහෝ දෙනාගේ එකඟත්වය මත එම තීරණය වෙනස් කර එය පිහිටි ස්ථානයේ ම නැවත ප්‍රතිනිර්මාණය කිරීමට තීරණය විය. ඒ අනුව මුල් ගෙඩිගේ පිහිටි භූමියම අඩි 23 ක් උස් කොට නැවත ප්‍රතිනිර්මාණය කරන ලදී. ඊට පිවිසුම් මාර්ගයක් ද ඒ සමාන උසට ම සකස් කර

ඇත. මෙම කාර්යය ශ්‍රී ලංකා පුරාවිද්‍යා ඉතිහාසයේ ගලවාගැනීමේ පුරාවිද්‍යාවේ මුල්ම කරුණු ලෙස පෙන්වා දිය හැකිය. (ප්‍රේමතිලක, 1985)

තව ද යාපහුව උරුම ස්ථානය පූජනීය නගරයක් ලෙස සංවර්ධනය කිරීමට අදාළ වූ යටිතල පහසුකම් අතර රථගාල, වාණිජ මධ්‍යස්ථානය, ඔසුහල, විශ්‍රාම ශාලාව ආදී අංග පෙරහැර මාවත පදනම් කරගෙන ඉදිකිරීමට පෙර 2000 වර්ෂයේ බලපෑම් හානි ඇගයීමක් සිදු කිරීම මගින් ඇතිවිය හැකි තර්ජන වළක්වා ගත හැකිවීම සුවිශේෂී කරුණකි. 2004 වසරේ දී රුහුණේ මැණික් ගඟ හරස් කර වෙහෙරගල ජලාශය ඉදිකිරීමට සැළසුම් සම්පාදනය වීමෙන් පසු ඊට අයත් වූ ප්‍රදේශයේ වන රක්ෂිතයේ අක්කර 3800 ක් පමණ යටවීමට නියමිතව තිබුණි. ඒ බව ජනමාධ්‍ය ඔස්සේ පුළුල් ලෙස ප්‍රචාරණය විය. එනිසා මධ්‍යම සංස්කෘතික අරමුදල යටතේ පුරාවිද්‍යා හානි ඇගයීමක් සිදුකර ඊට අයත් ප්‍රදේශයෙන් ජලාශයේ ඉදිකිරීම්වලට හසුවීමට ඉඩ තිබූ ඇතැම් පුරාවස්තු ඉන් ගලවා ඉවත් කරගෙන විත් මධ්‍යම සංස්කෘතික අරමුදලට අයත් කතරගම කෞතුකාගාරයේ තැන්පත් කර ඇත.

ශ්‍රී ලංකාවේ 1980 දශකයේ වේගවත් සංවර්ධන යෝජනා ක්‍රම රැසක් ආරම්භ වීමත් සමඟම පුරාවිද්‍යා ස්මාරක රැසක් විනාශ වී හෙවත් අහිමි වී යෑමේ අභියෝගයට ලක්විය. නමුත් සමනල වැව යෝජනා ක්‍රමයට හසුවූ භූමිය ඇතුළත් ප්‍රදේශය තුළ යම් තාක් දුරකට පුරාවිද්‍යා පර්යේෂණයක් සිදුකර ජර්මන් ජාතික Gillian Juleff විසින් 1998 දී ප්‍රකාශයට පත් කර ඇති Early Iron & Steel In Srilanka, A Study Of Samanala Wewa Aria පර්යේෂණ ග්‍රන්ථය තුළින් ම එම ප්‍රදේශය ආශ්‍රිතව පැරණි ලෝහ තාක්ෂණය හා සම්බන්ධ පුරාවිද්‍යාත්මක සාධක රැසක් වාර්තා ගත කිරීමට හැකියාව ලැබී ඇත. (Juleff 1998)

**සාරාංශය**

මෙසේ සලකා බලන විට ලෝකයේ සිදුවන ශීඝ්‍ර සංවර්ධන ගමනට ඉඩ දෙමින් පුරාවිද්‍යා ස්මාරක ස්ථාන වාර්තා ගත කරමින් උරුමය කළමනාකරණය කර අනාගත පරම්පරාවට ඒවා දායාද කරදීම සංවර්ධන ක්‍රියාවලිය තුළ දී පුරාවිද්‍යාඥයාගේ මහත් වගකීමක් බවට පත් වී තිබේ. එහි ප්‍රතිඵලයක් ලෙස ක්ෂේත්‍ර පුරාවිද්‍යාවේ දී මුදවාගැනීමේ හෙවත් ගලවා ගැනීමේ පුරාවිද්‍යාව නම් විෂය බිහි වී ඇත. එම විෂයට නව පුරාවිද්‍යාව ඔස්සේ විශාල කාර්යභාරයක් පැවරී ඇත. Archaeological Impact Assessment යනු මෙම මුදවා ගැනීමේ පුරාවිද්‍යාව විෂය ඔස්සේ සිදු කරනු ලබන ව්‍යාපෘති වේ. සංවර්ධන ව්‍යාපෘති වලට සමගාමීව සිදු කෙරෙන මෙම ක්‍රියාවලිය ඔස්සේ ආරක්ෂා වුණ පුරාවිද්‍යා උරුම ස්ථාන රාශියකි.

කෙසේ නමුත් වර්තමානයේ සිදුකෙරෙන ඇතැම් සංවර්ධන ක්‍රියාවලීන් තුළ මේ කටයුත්ත නිසිලෙස සිදුවනවා ද යන්න ගැටළුවකි. නමුත් උරුම කළමනාකරණය හා උරුම ආරක්ෂා කර ගැනීම යටතේ පුරාවිද්‍යාත්මක හානි ඇගයුම් වාර්තා සිදුකරීම අනිවාර්යෙන්ම සිදුකළ යුතු කාර්යයක් වන අතර නොඑසේනම් රටේ අභිමානය ලොවට කියාපාන අගනා පුරාවිද්‍යා උරුමයන් විනාශ වී යාම වැළැක්විය නොහැකි වනු ඇත.

**ආශ්‍රිත ග්‍රන්ථ හා ලිපි මාලාව**


ගුණවර්ධන පී. 2005 පුරාවිද්‍යා උරුමය ආකෘති සංකල්ප හා කළමනාකරණය, සමන්ති පොත් ප්‍රකාශකයෝ, ජා ඇල

ගුණවර්ධන පී. 1996 පුරාවිද්‍යා උරුමය කළමනාකරණය ලෝක උරුම ස්ථාන හා නරඹන්නා, වසුන්දරා කලාපය 4, පුරාවිද්‍යා අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

පුරාවස්තු සංශෝධන පනත, 1998 අංක 24 දරණ

ප්‍රේමතිලක පී. එල්. 1985 නාලන්දා ගෙඩිගේ ප්‍රතිමා මන්දිරය පිළිබඳව කෙටි හැඳින්වීමක්, මධ්‍යම සංස්කෘතික අරමුදල

සෝමදේව රාජ්, අනුවාදක 2000 පුරාවිද්‍යාවේ සිද්ධාන්ත ක්‍රම හා භාවිතය, අනුවාදක ප්‍රකාශකයකි

Juleff, Gillian, 1998, Early Iron & Steel in Sri Lanka, A Study of Samanalawa, Germany

Renfrew Colin & Bahn, Paul, 2000 Archaeology, Theories Methods & Practice, Thames & Handson, London

Thomsan, W Newmann & Robert, M Sanford, 2001, Practice Archaeology, A Training M annual for Cultural Resources Archaeology, Rome

# බත් මාලාව ශාන්තිකර්මයේ කව්වලින් නිරූපිත වන්නියේ ගැමි විශ්වාසවල මූලයන්

**ඒ.එච්.එම්.ජේ.එම් අතපත්තු**

අභ්‍යාසලාභී උපාධිධාරී

යාපහුව පුරාවිද්‍යා කාර්යාලය

jmathapaththu@gmail.com

***සංක්ෂේපය***

*වන්නිය යනුවෙන් හැඳින්වෙන්නේ දිවයිනේ උතුරු වියළි කලාපීය ප්‍රදේශයයි. මේ ප්‍රදේශය වත්මන් පරිපාලන ක්‍රමයට අනුව අයත් වන්නේ වයඹ පළාතේ ඉහළ කොටසට හා උතුරුමැද පළාතටයි. වැව් ගම්මාන මුලික කරගෙන නිර්මාණය වූ මේ ගැමි සමාජයේ ඔවුනට ආවේණික සංස්කෘතික ලක්ෂණ ද ගණනාවක් බිහිවී පවතී. එයින් වන්නියට අවේණික ගැමි අභිචාරාත්මක සංස්කෘතිකාංගයක් වශයෙන් බත් මාලාව ශාන්තිකර්මය හැඳින්විය හැකි වේ. තම අස්වැන්න ලබාගත් පසු ප්‍රාදේශීය දෙවියන් වෙනුවෙන් ආශීර්වාද ලබාගැනීමේ අරමුණෙන් මෙය සිදු කර තිබේ. ජනකාව්‍ය ලක්ෂණ රැගත් කවි පංති ගණනාවක් මෙම ශාන්තිකර්මයේ දී ඔවුහු ගායනා කරති. එය පදනම් කරගෙන වන්නියේ ගැමි දේව විශ්වාස නිර්මාණය වීමට බලපෑ හේතු හා එහි ස්වභාවය අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ විය. පර්යේෂණයට අවශ්‍ය දත්ත ලබාගත්තේ ක්ෂේත්‍ර ගවේෂණ ක්‍රමවේදය මතයි. සම්මුඛ සාකච්ඡා මෙන්ම සහභාගිත්ව නිරීක්ෂණ ක්‍රමවේදයන් ද සිදු කළේය. පර්යේෂණය සඳහා ප්‍රධාන වශයෙන් උපයෝගී කොට ගත්තේ බත් මාලාව ශාන්තිකර්මයේ දී ගායනා කරන කවි ඇතුළත් අත් පිටපතකි. මෙම ශාන්තිකර්මයේ දී ඔවුන් පුද සත්කාර කරන දේව සංකල්ප කීපයක් පවතී. අයියනායක, කඩවර, කම්බිලි, කළු දේවතා, ගමේ දේවතා, යනාදී ප්‍රාදේශීය දේව සංකල්ප ඒ අතර වේ. මෙම කව්වල දී එම දෙවියන් බිහිවීමේ පුවත් හා දෙවියන්ගේ ස්වභාවය ඇතුළත් කවි ගණනාවක් දැකගත හැකි ය. ඒ අතර අයියනායක, කඩවර හා කම්බිලි යන දෙවිවරුන් ශ්‍රී ලංකාවේ දෙවියන් නොව ඉන්දියාවේ සිට මෙරටට පැමිණි දෙවිවරු බව ගැමියෝ විශ්වාස කරති. මින් කළු දේවතා දේව සංකල්පය ඔවුන් විශ්වාස කරන්නේ කතරගම දෙවියන්ගේ හා වල්ලි අම්මාගේ දරුවෙකු බවයි. මෙම කව්වලින් පැහැදිලිවන තවත් සංකල්පයක් වන්නේ ඒ සෑම දෙවිකෙනෙකු ම බොද්ධාගමිකයෙකු වශයෙන් හඳුන්වා තිබීමයි. එම දේව සංකල්ප දමිළ සංස්කෘතික බලපෑම මත නිර්මාණය වුවත් දිවයිනේ මහා සංස්කෘතිය වූ බෞද්ධ සංකෘතියට ඒවා සම්බන්ධ කරගැනීමට ගැමියන් කටයුතු කර ඇති බව මින් විශ්වාස කළ හැකිය.*

**මුඛ්‍ය පද:** *වන්නිය, බත් මාලාව ශාන්තිකර්මය, ගැමි දේව සංකල්ප, බෞද්ධ සංස්කෘතිය, හින්දු සංස්කෘතිය, ගැමි දේව සංකල්ප*

**හැඳින්වීම**

ප්‍රමාණය අතින් කුඩා වුවත් ශ්‍රී ලංකාවේ ඓතිහාසික පසුබිමත් සංස්කෘතියත් ගැන සලකා බලන විට ඒකීයත්වය තුළින් විවිධත්වයක් පිළිබඳව ලක්ෂණ මනාවට දැකගත හැකිය. ඒකීය සංස්කෘතික ධාරාවන් තුළ විවිධ වූ එකිනෙකට වෙනස් ලක්ෂණයන් රැගත් උප සංස්කෘති කොටස් ඇතුළත් ජන සමාජ පැහැදිලිව දැකගත හැකිය. එසේ වන්නට ඇත්තේ ශ්‍රී ලංකාවේ ජනාවාස නිර්මාණය වීමට බලපෑ භූගෝලීය සාධක නිසාවෙනි.

ලංකාවේ විවිධ ප්‍රදේශයන්වල නිර්මාණය වූ ජන සමාජවල සංස්කෘතික ලක්ෂණ අතර එන විශ්වාස හා ඇදහිලි එකිනෙකට වෙනස් වේ. ඒ ඒ ජන සමාජ කොටස්වලට ආවේණික අභිචාර විධි දැකගත හැකිය. ලංකාවේ වියළි කලාපයට අයත් වන්නි ප්‍රදේශයේ ද ඊට ආවේණික දේව විශ්වාස හා ඇදහිලි වගේම පුදසිරිත් කීපයක් දැකගත හැකි වේ. මෙම අභිචාර පිළිබඳව සිදුකරන මානවවංශ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක් තුළින් එම ජන සමාජයේ ගැමි අධ්‍යාත්මික පැතිකඩ නිර්මාණය වූ ආකාරයත් ඊට පාදක වූ හේතු කාරණා වගේම ජන සංස්කෘතිය නිර්මාණයවීමට බලපාන පාරිසරික සාධක පිළිබඳව ද පැහැදිලි අධ්‍යනයක් කළ හැකිය. එ නිසා මෙම පර්යේෂණයේ අරමුණ වුයේ වන්නිය යනුවෙන් හැඳින්වෙන ප්‍රදේශය තුළ ඇති බත් මාලාව ශාන්තිකර්මය හා එහි දී භාවිත කරන කව්වලින් නිරූපණය වන ගැමි අධ්‍යාත්මික විශ්වාසත් එම සංස්කෘතික ලක්ෂණත් නිර්මාණය වූ ආකාරය පිළිබඳව මානවවංශ විද්‍යාත්මකව අධ්‍යයනයක් කිරීමයි.

**වන්නිය**

වන්නිය යනුවෙන් බොහෝවිට හඳුන්වා ඇත්තේ උතුරු ශ්‍රී ලංකාවයි. ඒ යාපනය අර්ධද්වීපයත් අනුරාධපුර හා ත්‍රිකුණාමලය අතර ඇති විශාල භූමි භාගයයි. නමුත් මෙම සීමා නිශ්චිත නියතියක් ලෙස එක් ආකාරයෙන් තිබී නොමැත. එය කලින් කලට වෙනස්ව ඇත. ''වන්නිය'' යන වචනය මෙම ප්‍රදේශයට භාවිතා වන්නට වූ හේතු පිළිබඳ විවිධ ජනප්‍රවාද කීපයක් ඇත. ඉන් එකක් නම් බුදුන්ගේ තෙවන ලංකාගමනයේ දී වම් සිරිපතුලෙන් සලකුණක් තබා අනුරාධපුර පූජා භූමිය සලකුණු කිරීම පිළිබඳ කතා පුවතයි. ජනප්‍රවාදයට අනුව අනෙක් කතාව නම් විජය රජු වම් අත්ල පොළවේ තබා පස පරික්ෂා කිරීමේ දී ප්‍රදේශය ඝන කැලෑවකින් වැසී පැවති නිසා ද වන්නිය යන්න ව්‍යවහාර වූ බවයි (දිවාකර,2002,2). කෙසේ නමුත් වර්තමාන සාමාන්‍ය ජන ව්‍යවහාරයේ වන්නිය යනුවෙන් අදහස් කරන්නේ ග්‍රාමීය, දුෂ්කර, වියලි කාලගුණික ප්‍රදේශයක් වේ. අද්‍යතන ව්‍යවහාරයට අනුව වන්නිය ලෙස

භාවිතා කරන්නේ කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රිකයේ ඉහළ කොටස හා අනුරාධපුර දිස්ත්‍රිකය හා වන්නි දිස්ත්‍රිකය ඇතුලත් භූමි ප්‍රදේශය වේ (අතපත්තු,2009,18).

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණය සිදු කිරීම සඳහා අවශ්‍ය දත්ත ලබාගැනීමට ක්ෂේත්‍රගත ක්‍රමවේද යොදාගන්නා ලදී. එහිදී කුරුණෑගල දිස්ත්‍රිකයේ වන්නි හත්පත්තුවේ පවතින මැඩියාව එල්ලංගාව මූලික කොටගත් වැව් ගම්මාන පර්යේෂණය සඳහා අවශ්‍ය නියැදිය ලෙස යොදාගෙන ඇත. එම ප්‍රදේශයේ වෙසෙන වැඩිහිටි පිරිස් වගේම බත් මාලාව ශාන්තිකර්මය සිදු කරන පිරිස් සමග ද සම්මුඛ සාකච්ඡා සිදු කළේය. ඊට අමතරව මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මොරගස්වැව ග්‍රාම නිලධාරි වසමේ පැවැත්වූ බත් මාලාව ශාන්තිකර්මයකට ද සහභාගී වී නිරීක්ෂණය කරන ලදී. එහි දී බත් මාලාව ශාන්තිකර්මයේ දී ගායනා කරන කවි ඇතුළත් අත් පිටපතක් ප්‍රධාන මූලාශ්‍ර කොටගෙන අනෙකුත් දත්ත ලබා ගැනීම සඳහා පුස්තකාල ගවේෂණයක් සිදු කළේය.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

සිංහල ගැමි ශාන්තිකර්ම හා අභිචාරමය චාරිත්‍රවල කවි ගායනා කිරීම අනිවාර්ය අංගයක් වේ. දහඅට සන්නිය වැනි පහතරට ශාන්තිකර්මවලත්, කොහොඹා කංකාරිය වැනි උඩරට ශාන්තිකර්මවලත් කවි ගායනා කිරීම දැකගත හැකි වේ. එහිදී වන්නිය ප්‍රදේශයත් උඩරට සම්ප්‍රදායට අයත් වන නිසා කොහොඹා කංකාරිය ශාන්තිකර්මය ද මෙම ප්‍රදේශයේ ඉතා ජනප්‍රිය අංගයකි. නමුත් කොහොඹා කංකාරියට වඩා බත් මාලාව වෙනස්කම් රැසක් ඇතුලත් වේ. කොහොඹා කංකාරිය සිදු කරන්නේ නර්තනය පිළිබඳ මනා පරිචයක් ලත් නැටුම් කුලයන්ට අයත් පිරිස් විසිනි. ඒ නිසාම එම සංස්කෘතිකාංගයේ උඩරට සම්ප්‍රදායට අයත් වෙස් නර්තනයන් අඩංගු වේ. ඒ වගේම එහිදී ගායනා කරන කවි විවිධ විරිත්වලින් පිරිපුන් ඒවාය. එම කවිවල කෝට්ටේ යුගයේ ජනප්‍රිය වූ  සමුද්‍රඝෝෂ විරිතට අයත් සිව් පද ආකාරයේ කවි වගේම සැහැලි ගී හා ගී කාව්‍යමය ලක්ෂණ ඇතුලත් ගායනා ද වේ (දිසානායක,2008). මේ ගී කාව්‍යමය ලක්ෂණ නිසා ම මෙහි ප්‍රධාන වාදන භාණ්ඩය ලෙස යොදාගැනෙන්නේ මඟුල් බෙරය හෙවත් ගැට බෙරයයි. එසේ ම එම කවි පබැඳුම්වලත් සාහිත්‍යමය භාවිතයන්  හා වර්ණනා හොඳින් දැකගත හැකිවන අතර ම එහි භාෂාමය ලක්ෂණයන් මහනුවර යුගයට අයත් බව විශ්වාස කරයි.

බත් මාලාව ශාන්තිකර්මය නිර්මාණය වුයේ සාමාන්‍ය ග්‍රාමීය ගොවි ජනතාව අතර ය. ඒ නිසා එහි කොහොඹා කංකාරිය තරම් කලාත්මක සෞන්දර්යාත්මක ලක්ෂණ ඇතුළත් වුයේ නැත. බත් මාලාව තුළ ද මනරම් කවි ගායනා රැසක් ඇතුළත් වුවත් ඒවා විරිත් කීපයකට සිමා වී තිබන බව පෙනී යයි. ඒ වගේම ඒවා සියල්ල ම සිව් පද ආකාරයේ කවි වේ. එහිදී කවි ගායනා කිරීම සඳහා වන්නි ප්‍රදේශයට ආවේණික වාද්‍ය භාණ්ඩයක් වන උඩැක්කිය යොදාගනී. මෙම වාද්‍ය භාණ්ඩය ආඳා නම් මිරිදිය මත්ස්‍යයාගේ හමෙන් ගැමියන් ම නිර්මාණය කරගන්නා සියුම් නිර්මාණයක් වේ. බත් මාලාවේ ගැයෙන කවි ඉතාමත් සමීප වන්නේ ජන කාව්‍යාත්මක ලක්ෂණවලට ය. ඒ ඒවායේ ඇති සාහිත්‍යමය ලක්ෂණ හා භාෂාමය ලක්ෂණ අනුව වේ. සාමාන්‍යයෙන් බත් මාලාව ආරම්භ වී අවසන්වන තුරු හොරා 5ක් පමණ ගතවෙන අතර ඒ සම්පුර්ණ කාලය ම ගත වන්නේ මේ කවි ගායනා කිරීමෙනි. මෙම ශාන්තිකර්මයේ මූලික ලක්ෂණ වන්නි ප්‍රදේශයට සමාන මුත් ප්‍රදේශයෙන් ප්‍රදේශයට කවිවල වෙනස්කම් ද දැකගත හැකි වේ. එසේ වන්නට ඇත්තේ ඒ ඒ ප්‍රදේශයේ වෙසෙන ගැමියන් එම කවි නිර්මාණය කර ඇති නිසාය. නිශ්චිත කර්තෘ කෙනෙක් සොයා ගත නොහැකි එම කවි සාහිත්‍ය මානවවංශ විද්‍යාත්මකව වැදගත් සාධකයක් වන්නේ ඒවා බිහි වුයේ ඒ කෘෂිකාර්මික සමාජයේ වෙසෙන ගැමියන් අතින් ම වන හෙයිනි.

### වන්නියේ ප්‍රාදේශීය දේව සංකල්ප

ශ්‍රී ලංකාවේ සංස්කෘතිය බෞද්ධ ආගමික සංකල්ප මත හැඩගැසුණ දේව විශ්වාසවලට විශාල ඉඩක් වෙන් වී තිබෙනවා දැකගත හැකිය. දිවයිනේ ඒ ඒ ප්‍රදේශවලට අවේණික දේව සංකල්ප ගණනාවක් සෑම ප්‍රදේශයක ම දැකගත හැකි වේ. මෙම අධ්‍යයන ප්‍රදේශයට ද අවේණික දේව සංකල්ප කීපයක් හඳුනාගැනීමට හැකි වේ. වන්නියේ ගැමියන්ගේ අභිචාරාත්මක කාර්යයක් ලෙස පවතින බත් මාලාව තුලින් එම දෙවියන් වෙනුවෙන් පුද පූජා පවත්වන නිසා එම ප්‍රාදේශීය දේව සංකල්ප පිලිබඳව අධ්‍යයන කල හැකි වේ. ඒ අධ්‍යයන සදහා බත්මාලව වෙනුවෙන් ගායනා කරන කවි බෙහෙවින් උපයෝගී කරගත හැකි වේ.

බත් මාලාව ශාන්තිකර්මයේ පුද දෙන ප්‍රධාන දෙවි කෙනෙකුන් වන්නේ අයියනායක දෙවියන් ය. විශේෂයෙන් දැදුරු ඔයත් කලා ඔයත් අතර වන්නි හත්පත්තු ප්‍රදේශයට අයත් කලාපය භාර දෙවියන් ලෙස ගැමියෝ අයියනායක දෙවියන් අදහති (අතපත්තු,2019,108). එම නිසා එම කලාපයේ සියලු අභිචාරාත්මක කටයුත්තක දී ම මෙම දෙවියන් ප්‍රධානකොට සලකයි. අයියනායක දෙවියන්ගේ ප්‍රභවය පිළිබඳව මත රැසක් පලවී තිබේ. ඉන්දීය අයියනාර් යන දෙවියන්ගේ ශ්‍රී ලාංකීය සම්භවයක් ලෙස

අයියනායක දෙවියන් නිර්මාණය වී ඇති බව ඉන් එක් මතයකි (දිසානායක,2013,31). ඉන්දීය මූලාශ්‍රවලට අනුව අයියනාර් දෙවියන් ශිව දෙවියන්ගේ පුත්‍රයෙක් ලෙස හඳුන්වයි (දිසානායක,2014,24). බත් මාලාව ශාන්තිකර්මයේ අයියනායක දෙවියන් වෙනුවෙන් ගායනා කරන කවිවල ද දක්වන්නේ එම දෙවියන් ඉන්දියාවේ සිට රන් නැවක නැඟ මෙරටට ආ දෙවි කෙනෙකුන් බවට වේ. එහි දී බෞද්ධ කතාවල දැක්වෙන ඉන්දියාවේ යම් යම් ස්ථාන නාම මේ කවිවල දී දෙවියන් හා සම්බන්ධවන ස්ථාන ලෙසට ගැලපීමක් ද සිදු කර ඇත.

තොස් කර මුණි පෙරුම් බලේ බිඳ හැරියේ මයුර රාජ
අස්කර නද කුරිරු යකුන් දමනය කල බුද්ධ රාජ
තිස්තුන් කෝටියක් සමග භාර රැගෙන උතුන් රාජ
බස් බොරු නැත මඳක් කියමි අයියනාය දේව රාජ

ගිලි මුහුද වයිකුන්ටික පර්වත පිට විෂ්ණු රාජ
වේලි දරන හත් පොටකින් අස්න දරන නාග රාජ
දිලි රුවට නැගී වාහන තෙයි නාටික මයුර රාජ
දීලි ඔබගේ අලි ඇතු පිට වඩින් අයියනාය රාජ

වැඩමවන්න සිංහලයට මදුර පුරේ වැඩ ඉඳලා
වැඩපල නැති දෙමළ යකුන් දහස් ගණන් රැස් කරලා
දිව බල ඇති දේවතා පස් දෙනා කැටුව එකතු වෙලා
අඩසඳ ලෙස නැවක් කරමි වඩුවන් රැස් කරවාලා

ලොල්ල වඩන රුවල් පෙනේ සිදු මැද සිංහලේ බලා
රැල්ල වරින් වරට පෙනේ සිඳු මැද සිංහලේ බලා
මල්ල රටේ උපන් මේ දේවතා පස්දෙනා එකතු වෙලා
බෙල්ල කපා ඇතු බිලි දී හනිකට නැව මතු කරලා

(උක්කු බණ්ඩා මහතා සතුව පැවති අත් පිටපතෙන් උපුටා ගත්තකි)

බත් මාලාව ශාන්තිකර්මයේ දී පුද දෙන තවත් වන්නියේ ප්‍රාදේශීය දෙවියෙකු ලෙස කම්බිලි දෙවියන් හැඳින්විය හැකි වේ. කම්බිලි දෙවියන්ගේ ප්‍රභවය පිළිබඳව පැහැදිලි තොරතුරක් නැති මුත් ඒ සඳහා මත කීපයක් ඉදිරිපත් වී ඇත. ඉන් එකක් නම් මහනුවර යුගයේ දී සිටි පුද්ගලයෙක් බවට වන මතයකි (දිසානායක,2014,49). නමුත් වන්නියේ පවතින බත් මාලාව ශාන්තිකර්මයේ ඇති කවිවලින් ඉදිරිපත් වන්නේ මෙම දෙවියන් ද අයියනායක දෙවියන් සමඟ එම නැවේ ම ඉන්දියාවෙන් පැමිණි දෙවියෙකු වන බවයි. එම කවිවල දී කම්බිලි දෙවියන් වෙනුවෙන් පිදෙන පුද පූජා,

දේවාල පවතින ස්ථාන හා දෙවියන් වන්නි ප්‍රදේශයට ආ මාර්ග යනාදිය ද ඉදිරිපත් කර ඇත.

සත් මුහුදින් යන එතර එදෙසේ කළුගල් බිසවගේ කුස පිලිසිඳිතා
සිත්ලෙස මෙරගල් නැව සරසාගෙන සයුර ගෙවා මෙතරට වැඩිතා
ගත්තේ ද විවරණ කන්දස්වාමිගේ රන්තොරණේ මුර භාරවෙතා
සත් පැය ඇතුළත නවදෙන කතුන්ගේ සීරි බීවේ කම්බිලි දේවතා

(උක්කු බණ්ඩා මහතා සතුව පැවති අත් පිටපතෙන් උපුටා ගත්තකි)

නුවර කලාවිය හා වන්නිය ප්‍රදේශයේ නිතර ම ගැමියන් පුද පූජා සිදු කරන දෙවියෙකු වන කඩවර දෙවියන් වෙනුවෙන් ද මෙම ශාන්තිකර්මයේ පූජා පවත්වයි. එහි දී එම දෙවියන් වෙනුවෙන් කවි ගණනාවක් ගායනා කරන අතර ඒ දෙවියන්ගේ ලක්ෂණ හැඩරුව, සම්භවය ආදී කරනු එම කවිවල අන්තර්ගත වේ. කඩවර දෙවියන් දේශීය සම්භවයක් සහිත දෙව් කෙනෙකු ලෙස සලකනු ලබයි. එනම්, කලාවැව ආරක්ෂා කල පුද්ගලයෙකු ඒ නිසා ම මිය ගොස් දේවත්වයට පත්වී කඩවර දෙවියන් වූ බව ප්‍රකට ජනප්‍රවාදය වුවත් මේ කවිවල අන්තර් ගතවන්නේ නම් කඩවර දෙවියන් ද අයියනායක දෙවියන් සමඟ ඉන්දියාවේ සිට ලංකාවට පැමිණි අයෙක් වන බවයි.

කලා රට ද ත්‍රිකුණාමලේ සහා පුත්තලම ද මන්නාරමටත්
හලාවත ද වෙලාසිය සහා වන්නිය පහළොස් පත්තුවටත්
ලොල සිතින් තෙද පෙන්නා සතහට පට පඩුරුද ගන්නා යහපත්
වලා යටින් සඳ පායන විලසට වඩින්ඩ කඩවර ස්වාමි අදත්

(උක්කු බණ්ඩා මහතා සතුව පැවති අත් පිටපතෙන් උපුටා ගත්තකි)

බත් මාලාවේ දී දෙවියන් පස් කට්ටුවකට පුද පූජා පවත්වයි. ඉන් මේ ප්‍රදේශයට අවේනික තවත් දෙවියෙකු වන්නේ කළු දේවත්වා නමින් හැඳින්වෙන දෙවියන් ය. මේ දේව සංකල්පයත් මේ ප්‍රදේශයට ආවේණික දේව සංකල්පයකි. බත් මාලාව ඇතුළු ගැමියන්ගේ වෙනත් පුද පූජා අවස්ථාවල දී ද මූලිකත්වයට පත් දෙවියෙක් වේ. මෙම ශාන්තිකර්මයේ ඇති කවිවලින් පැහැදිලි කරන ආකාරයට එම දෙවියන් ද අයියනායක දෙවියන් සමඟ ම ඉන්දියාවේ සිට මෙරටට පැමිණි අයෙකි. මෙරටට ආ පසු නුවරකලාවිය හා වන්නි හත්පත්තු ප්‍රදේශය තම වාසභූමි කරගෙන ජීවත්ව සිට ඇත. එම ප්‍රදේශය වාසභූමි කොටගත් නිසා එම ප්‍රදේශයේ ජනයා බොහොම භක්ති ආදරයෙන් පුද සත්කාර කරන දෙව් කෙනෙකුන් බවට පත්ව ඇත.

කල්ල තුරයේ අයියන දෙවි නෑර කැටුව          වැඩමවන්න
ගල් නැව පැදගෙන ඇවිදින් මා වැව් සත භාර          ගන්න
සිල්වාරන් නැව් කප්පර නැව් තොට මුණ බලා
යන්ඩ
මල්විල කිරි වෙහෙර බලා කළු දේවතා          වැඩම වන්ඩ

(උක්කු බණ්ඩා මහතා සතුව පැවති අත් පිටපතෙන් උපුටා ගත්තකි)

බත් මාලාවේ කවිවලින් පුද දෙන තවත් ප්‍රාදේශීය වශයෙන් පවතින දේව සංකල්පයක් වන්නේ හඳුන් කුමාර දෙවියන් ය. එම දෙවියන් ඉහත දැක්වූ අනෙක් දෙවියන්ට වඩා තරමක් සුවිශේෂී වන්නේ දේශීය ප්‍රභවයක් ලෙස ඉදිරිපත් කරන නිසාය. මෙම දෙවියන් සඳුන් මලකින් උපත ලබා ඇත. එම නිසා සඳුන් කුමාර ලෙස නම් තබා ඇත. මෙම දෙවියන් කුඩා කල කිරි දී හදාගෙන ඇත්තේ කතරගම දෙවියන්ගේ බිරිඳක් ලෙස ජන විශ්වාසයේ පවතින වැදී ගෝත්‍රයට අයත් වල්ලි අම්මා බව කවිවලින් කියැවේ.

සඳුන් ගැබේ පිළිසිඳ මල සත් දවසට          පුපුදුවන්න
අඳුන් ගිරෙන් රිවි පායන ලෙසට දෙවියෝ          වැඩමවන්න
හඳුන් කුමරු තෙද කන්ද ස්වාමි අතට          වඩා ගන්න
හඳුන් මලෙන් උපන් බැවින් හඳුන් කුමරු          නම් තබන්න

තෙදට වල්ලි අම්මා මිස කෙනෙක් ඇත්ද          නර තලයට
සඳට ඇඳපු සඳ ලප සේ කිරි දී ඇති කරපු          රුවට
සොඳට ඉසුණු පෙති ගෝමර අවුල් දගේ          හවඩි ලෙසට
තෙදට හඳුන් කුමරු මිසක් කෙනෙක් ඇත්ද          නර තලයට

(උක්කු බණ්ඩා මහතා සතුව පැවති අත් පිටපතෙන් උපුටා ගත්තකි)

**හින්දු සංස්කෘතික බලපෑම**

මෙරට දේව විශ්වාසවල ඉතිහාසය අනුරාධපුර අවධිය දක්වා දිගුවේ. පණ්ඩුකාභය රාජ්‍ය අවධිය ලිඛිතව හමුවන පැරණි ම සාක්ෂියයි. කෙසේ වුවත් බුදුදහම පැමිණි විගස මෙරට සම්පූර්ණ සංස්කෘතිය බෞද්ධාගමිකව නිර්මාණය විය. එහෙත් කතරගම, පුල්ලියාර්, ශිව, විෂ්ණු, සමන්, ආදී දේව විශ්වාස ගණනාවක් මෙරට ජනයා අතර අඛණ්ඩව පැවති බවට පුරාවිද්‍යාත්මකව වගේ ම ලිඛිත තොරතුවලිනුත්

පැහැදිලි වේ(ධර්මදාස ,2015). ඒ බොහෝ දේව සංකල්ප හින්දු ආගමික බලපෑමත් සමඟ නිර්මාණ වුවන් ය.

වන්නියේ පවතින මේ ප්‍රාදේශීය දේව සංකල්ප බොහොමයක් නිර්මාණය වන්නට ඇත්තේ මහනුවර අවධියේ දී වන්නට ඇත. ඊට හේතුවන්නේ දැනට වන්නි ප්‍රදේශයේ ඇති මේ බොහොමයක් ගම්වල මුලාරම්භය මහනුවර අවධියේ දී පමණ වන නිසාවෙනි. එසේම ඒ අවධියේ දී ඒ ගම් කැලෑබදව දුෂ්කරව පැවති ප්‍රදේශ වේ. මහනුවර යුගයේ පැවති බොද්ධ ආගමික අස්ථාවර බව ද සමහරවිට මේ දේව විශ්වාස නිර්මාණය වීමට බලපා ඇත. අයියනායක දේව විශ්වාසය හැරුනුකොට පවතින අනෙකුත් දේව සංකල්ප සියල්ල ම වගේ ඉන්දියාවේ දේව සංකල්ප අතර දැකගත නොහැකි වේ. නමුත් ජන විශ්වාසය පවතින්නේ එම දෙවියන් ඉන්දියාවෙන් පැමිණි දෙවිවරු වන බවයි (අතපත්තු,2019 ,98). බත් මාලාවේ කවිවල දැක්වෙන දේව වර්ණනා අතරින් එය පැහැදිලි වේ. එසේම ඉන්දීය මලය දේශය පිළිබඳව සඳහන් කවි බොහෝ ප්‍රමාණයක් ඇත. ඒ වගේම දමිළ උරුවෙන් ආ වචන ද රැසක් සමහර කවිවල දැකගත හැකි වේ. ඒ අනුව මෙහි දේව සංකල්ප නිර්මාණය වීමට හින්දු සංස්කෘතික බලපෑමක් ද පැහැදිලිව සිදු වී ඇති බව පෙනෙයි.

*"කල්ල දෙමළ අරවලි මන්නුදී වලට නැදද     කැමති"*

*"මලලු මල්ල උපා පියස කලලු දෙමළ    දේසේ"*

**බෞද්ධ සංස්කෘතික ආභාෂය**

බෞද්ධ ආගමික මූලික ධර්ම කරුණු අනුව බුදු දහම තුළ දේව ඇදහීම එතරම් ප්‍රචලිත දෙයක් නොවේ. නමුත් සංස්කෘතියක් තුළ එවැනි ඉරි ගසා බෙදීම් පැහැදිලිව දැකගත නොහැකි වේ. ඒ නිතරම සංස්කෘතික මිශ්‍රවීම් සිදුවන නිසාවෙනි. මෙරට සංස්කෘතිය බෞද්ධ ධර්මය මත හැඩගැසුණ මුත් හින්දු දේව සංකල්ප ද මිශ්‍ර වීම් දැකගත හැකි බව පෙනී යයි. එහෙත් ඒවා සියල්ල ගැමියා නිර්මාණය කරගෙන ඇත්තේ බෞද්ධ සංස්කෘතිය ඇතුළත වේ. කිසිදු අවස්ථාවක බෞද්ධ සංස්කෘතියෙන් ඒවා වියුක්ත කර නැත. පහතරට ශාන්තිකර්ම හා අභිචාර විශ්වාස ද ඇදහිලි තුළ වගේම මේ බත් මාලාව ශාන්තිකර්මයේ ද බෞද්ධ ආගමික ලක්ෂණ හොඳින් දැකගත හැකි වේ. එය බත්මාලාවේ ශාන්තිකර්මයේ ඇති කවිවලින් හොඳින් පැහැදිලි වේ.

බත්මාලාව ආරම්භවන මොහොතේ බුද්ධ, ධම්ම හා සංඝ යන ත්‍රිවිධ රත්නය නමස්කාර කරමින් එය ආරම්භ කරයි. ඒ අනුව බුදුන් වහන්සේ දෙවියන්ට වඩා

ගෞරව ආකාරයෙන් සලකනු ලබයි. ඒ වගේම බුදු දහමේ ඇති අටවිසි බුදුවරු හා නාථ දේව සංකල්පය පිළිබඳව ද මෙහි සඳහන් කර තිබෙනු දැකගත හැකි වේ.

ඈත එපිට දීපංකර මුලසිට බුදුබවට ම සිත නොමලක්කා
මෑත කපට බුදු වෙන්ඩ පතාගෙන තපසේ නිවැරදි සිල් රැක්කා
හිනනේර්ථයෙන් රඟමඬලට බැස සැමට ම දුරුවෙයි නොවල්ලකා
නාථ දෙවියෝ මතු බුදුවෙන ඔබ හට කවි කියන්ඩ බැහැදැක්කා

(උක්කු බණ්ඩා මහතා සතුව පැවති අත් පිටපතෙන් උපුටා ගත්තකි)

මෙහි ඇති ප්‍රාදේශීය දේව සංකල්ප ඉන්දීය සම්භවයක් සහිතව නිර්මාණය වී තිබුණ ද ඒ සැම දෙවිකෙනෙකුන් ම බුදු දහමේ ආරක්ෂකයින් වශයෙන් ද කවිවල සඳහන් කර තිබේ. එසේම මෙරට බෞද්ධ ආගමික ස්ථානවල වැඩවසන දෙවිවරුන් වශයෙන් එම දෙවිවරු මේ තුළ හඳුන්වා ඇත.

බාරවෙමින් පස්පව් හැර නරලොව රැකපන් කියලා
බාරකළේ පුලවන් දෙවි කම්බිලි දෙව් තෙද දැකලා
ගෝර රුදුරු යක් සෙන් බිඳ රට රටවල තෙද පාලා
නැර සිටිති අනුරපුරේ අටමස්ථානෙට වැඩලා

අයියනා දෙවි සැම පෝයට නිතර දම් පිත් කරන්නේ
අල්ලා වැද පෙරලා පන දැනගෙන වරින් වරමල් පුදන්නේ
නල්ලා උපතකි වරං ගත් සැටි හිමාලේ මුර කරන්නේ
අයියන දෙවි ඔබට පිං ඇති මේ මල් යහනට වඩින්නේ

උඩ මළුවේ ජය රන්කඳ බාර වෙලා මුර කරන්ඩ
මඩවේ කර දත් මුළුතැන් කිරි ඉතුරුම් භාරගන්ඩ
දැඩිකර එන නැව් කප්පර පොඩිකර දශ අතහරින්ඩ
සැඩ මාතා උතුං තෙදැති කළු දේවතා සත රකින්ඩ

(උක්කු බණ්ඩා මහතා සතුව පැවති අත් පිටපතෙන් උපුටා ගත්තකි)

මෙහිදී පුද දෙන දේව සංකල්ප අතර එන කළු දේවතා යන දෙවියන්ගේ සම්භවය ගැන බත්මාලාවේ එන කවිවලින් ඉදිරිපත් කරන්නේ බෞද්ධාගමික මුහුණුවරකිනි. බෞද්ධ පන්සීය පනස් ජාතක කතා පොතේ විදුර ජාතකයේ ප්‍රධාන චරිත ද්විත්වය වන ඊරන්දතී නාග කුමරියට හා පූර්ණක යක්ෂයාට දාව ඉපදුනු දරුවෙක් වශයෙන් කළු දේවතා යන දෙවියන් හඳුන්වා ඇත. පන්සිය පනස් ජාතක කතා පොතේ

ජනප්‍රිය කතා වස්තු කොහොමත් මෙරට වන්නියේ ගැමි සමාජයට හොඳින් අවශෝෂණය වී තිබී ඇත. ඒ බලපෑම මත මේ සංකල්පය නිර්මාණය වන්නට ඇත.

එරන්දතී කුස පිළිසිඳ පුර්ණක පිය රජ
දාකොට
තරං වයස සත් හැවිරිදි කුමාර කෙලිය පිරුණු        කලට
නිරන්තරෙන් පිය රජුගෙන් උදහස් ලැබුණේ        කුමරුට
නරා රකින්නට වල්වැද පැන්නේ සත්ගම්        හිමයට

(උක්කු බණ්ඩා මහතා සතුව පැවති අත් පිටපතෙන් උපුටා ගත්තකි)

**නිගමන**

බත් මාලාව වන්නියේ සිටි ගැමියන්ගේ අභිචාරාත්මක කාර්යකි. එහි ඓතිහාසිකත්වය පිළිබඳව නිශ්චිතව තහවුරු කරගත නොහැකි වේ. නමුත් එහි මහනුවර අවධිය දක්වා දිවෙන බවට සිතිය හැකිය. මහනුවර යුගයේ දී මෙම ප්‍රදේශ හුදකලා වීමත්, එවකට සිදුවූ බුදු දහමේ අරාජික තත්වයත් නිසා මෙවැනි අභිචාරාත්මක අංග මිනිසුන් අතර ප්‍රචලිත වන්නට ඇත. අනෙක් අතට මෙම ශාන්තිකර්මය පවත්වන්නේ භවබෝග අස්වනු ලබාගත් පසු දෙවියන් වෙනුවෙන් එයින් පුජා පැවැත්වීමත් ඉදිරි වසරේ දී ද මෙවැනි අයුරින් එය ආරක්ෂා කර දෙන ලෙස ඉල්ලා සිටිමිනි. වන්නි ප්‍රදේශය වියළි කාලගුණයකින් යුත් දුෂ්කර ප්‍රදේශයකි. ඒ තත්වය කෘෂි ආර්ථිකයට තදින් ම බලපායි. එසේම වෙනත් උවදුරු ගණනාවක් නිසා ගොවියා නිතර ම පිඩා විඳිමින් සිටියේය. මෙම නිසා මීට විසඳුම් ලෙස ගොවියා බලාපොරොත්තු වුයේ පාරභෞතික පිළිතුරකි. ඒ දෙවියන්ගෙන් පිහිට ඉල්ලීමයි. බුදු දහම දාර්ශනික පදනමකින් යුක්ත වූ නිසා ඒ දේ බුදුදහම තුළින් ඔවුන්ට ලබාගත නොහැකි විය. ඒ නිසා ඔවුන් වඩාත් ලං වුයේ කාලයක් තිස්සේ සිංහල සංස්කෘතියට බලපෑ හින්දු දේව සංකල්පයන්ට ය. මේ නිසා වන්නියේ ගැමි ජන විශ්වාස නිර්මාණය වීමට හින්දු ආගමික සංස්කෘතිය ද බලපා තිබේ. නමුත් චිරාත් කාලයක් බෞද්ධ ආගමික පසුබිමක හැඩගැසුණු සංස්කෘතියක් පැවති නිසා ඒ මහා සංස්කෘතික අවකාශයෙන් ඔවුනගේ විශ්වාස පද්ධතිය වියුක්තව ද නැත. ඒ නිසා මේ අභිචාරාත්මක විශ්වාස පද්ධතිය හැඩගැසුනේ බෞද්ධ සංස්කෘතික ලක්ෂණ ද සංකලනය වීමෙන් බව පෙනී යයි. ඒ නිසා වන්නියේ ගැමි ජන විශ්වාස පද්ධති අධ්‍යයනය කිරීම සඳහා බත් මාලාව ශාන්තිකර්මය හොඳින් උපයෝගී කරගත හැකි වේ. මෙම  අභිචාරාත්මක කාර්යය තුළ ගැමි නාද මාලා, ජන කාව්‍යවලට අයත් කවි පබැඳුම්, චාරිත්‍ර වාරිත්‍ර වැනි වන්නියට ආවේණික ලක්ෂණ ගණනාවක් ගැබ්ව ඇති නිසා අස්පර්ශිත සංස්කෘතික උරුමයක් වශයෙන් ද හැඳින්විය හැකි වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ

### ප්‍රාථමික මූලාශ්‍ර

මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මොරගස්වැව ග්‍රාම නිලධාරි වසමේ අඹගස්වැව ගම්මානයේ වෙසෙන කේ.එම් උක්කු බණ්ඩා මහතා සතුව පවතින බත් මාලාව ශාන්ති කර්මයේ දී ගායනා කරන කවි ඇතුලත් අත් පිටපත.

### ද්විතික මූලාශ්‍ර


අතපත්තු, ජනක (2019) වන්නි හත්පත්තුවේ අභිචාර විශ්වාස හා ජන ඇදහිලි ,එස්. ගොඩගේ සහෝදරයෝ, කොළඹ

කරුණාතිලක එන්.ටි, (1986) දැදුරු ඔය බද ජන ඇදහීම්, ගොඩගේ ප්‍රකාශන

කාරියවසම්, තිස්ස, (1991) සිරිලක දෙවිවරු, තරංජි ප්‍රින්ටර්ස්

කාරියවසම්, තිස්ස (1976) ශාන්තිකර්ම හා සිංහල සමාජය, ප්‍රදීප ප්‍රකාශකයෝ

දිසානායක, මුදියන්සේ (1990) උඩරට ශාන්තිකර්ම හා ගැමි නාට්‍ය සම්ප්‍රදාය, ගොඩගේ ප්‍රකාශන

දිසානායක මුදියන්සේ (2014) වන්නියේ දෙවි දේවතා සම්භවය හා ව්‍යාප්තිය, ගොඩගේ ප්‍රකාශන

සිංහල විශ්වකෝෂය, 1 බණ්ඩය (1998) සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

විජේසිංහ, රත්නත් ශ්‍රී (2017) විමලරත්න කුමාරගම, සන්ථව ප්‍රකාශන

සරච්චන්ද්‍ර, එදිරිවීර (1968) සිංහල ගැමි නාටකය, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

ධර්මදාස, කේ, එන්, ඕ (2015) සිංහල දේව පුරාණය, රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

ධර්මරත්න, තෙන්නකෝන් (2015) පැරණි සත්කෝරළය, ගොඩගේ ප්‍රකාශන

බෂාම් ඒ, එල් (2000) අසිරිමත් ඉන්දියාව, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

කුරුණෑගල ශාස්ත්‍රීය සංග්‍රහ (2008) වයඹ පළාත් සභාව

Krisan, Shasthri (1986) South Indian God and Goddess, Archaeological Survey of India

# A Study of Companies That Produced Civil Engineering and Mechanical Technology Heritage in Sri Lanka During the British Period

**J.L.G.V.M.S.S Jayasinghe[1], N.H.L Kaveesha Nanayakkara[2]**

[1]Department of Archaeology, Faculty of Social Sciences
University of Kelaniya, Sri Lanka.
vishwasrijayasinghe@gmail.com
[2]Department of Archaeology, Faculty of Social Sciences
University of Kelaniya, Sri Lanka.
kaveeshananayakkara1995@gmail.com

## *Abstract*

*As a result of the Industrial Revolution, with the advent of plantations in Sri Lanka during the British era, the British developed the infrastructure and machinery to transport the harvest to the Port of Colombo and to use the harvest to produce goods. Construction and machinery related to the field of transport, communication, factories, and public facilities were manufactured by various companies. The aim of this research was to study the facts about such companies that remain today. Our research problem was, did all those companies belong to the British? Library and mapping studies were conducted with a focus on prior research in data collection for this study. The field was then explored and observations and interviews were conducted. Most of the civil engineering and mechanical technology heritage that we have studied in the field has been destroyed due to negligence and the nameplates of some companies have been degraded for various reasons. Also, some nameplates couldn't be disclosed due to distortion. In this study, we were able to identify that the civil engineering and mechanical technology heritage built during the British era was produced in England as well as in Eastern countries or Sri Lanka. The study found that industrial heritages more than a hundred years old could be turned into archaeological monuments under the Archaeological Act. Coal steam locomotives used in the highway, including iron bridges, cast iron road signs, used in the transportation industry, as well as all equipment used to run trains, were mainly manufactured by companies based in England, as revealed through research. Some of the signaling systems used in the train operation, as well as the communication devices used in the rail transport, were made in the UK. This research uncovered a number of British period construction companies in the country that have not been the subject of prior research. The industrial heritage identified in this study can be pointed out as heritage that can be traced back to one period in the history of Sri Lanka.*

***Keywords:*** *British period, Civil Engineering, Companies, Industrial heritage, Transport*

## Introduction

With the expansion of plantations in various parts of Sri Lanka during the British colonial rule, a new road system and the railway system were constructed for transportation of fertilizers, equipment, and labor for the plantations, for transport harvest to the Port of Colombo and to supply consumer goods required by the labors. The British built bridges along with those road systems and these civil engineering constructions were carried out by various companies in England. Also, road signs made from cast iron that were situated as superstructures in roads were manufactured in England and Sri Lanka. In addition, steam power generators imported for road construction were also manufactured by British companies and imported to Sri Lanka.

With the construction of the railway system, many machines were manufactured by British companies, from the water supply for steam trains to the signal control equipment at railway stations including bridges. Factories were set up to do productions using the harvest of coffee or tea estates, and steam-powered engines and machinery manufactured by British companies were installed in those factories. In addition, various constructions made for the communication of plantation workers and keepers were manufactured by British companies, as well as by factories established by the British in Sri Lanka.

This research is about those companies that manufactured steam-powered engines and machinery. We aim to study the facts about such companies that remain today. And our research problem was, whether all those companies belonged to the British or not.

## Research Methodology

The research didn’t include the Northern and Eastern Provinces but focused primarily on transportation, communications, factories, and public facilities.

Preliminary and secondary data were used to collect data primarily for the study of companies that produced civil engineering and mechanical technology heritage in Sri Lanka during the British period. To collect primary data, we investigated data from the field and we used the interview method to collect data. Interviews were conducted with executive engineers, station masters, station staff, museum staff, factory superintendents, and postal officials. In addition, information was gathered for the research from villagers in explored areas. Other railway lines including the Kandyan railway line, the Pilimatalawa Highway Museum, the Kadugannawa railway museum, and other private collections also contributed to this research.

Libraries and archives were studied during the collection of secondary data, with the main focus being on field-related books, reports, newspaper articles, journals, and previous research data. Also, we studied photographs that we captured during the exploration in the field.

## Results and Discussion

Most of the bridges built in the British period were manufactured by government factories, and the nameplates of many bridges are now defunct. Cast iron plaques on the Warawala Bridge, Bentota Bridge, Halaba Bridge, Gampola Bridge, and Katugasthota Bridge are still standing. In addition, old road signs made as superstructures of roads were also manufactured by the government factory.




*Figure 1.* *Plaques of Warawala bridge*




*Figure 2. Plaques of Gampola bridge*

Bridges were built by various British companies on the Kandyan Railway as well as in other parts of the country to facilitate the transportation of plantation harvest to the Colombo Port. Among them, several railway bridges manufactured by a company called 'Westwood Baillie & Co. Engineers & Constructors' are remaining. The bridges built by the company can be seen in Katugastota, Yatirawana, Battulu Oya, Rakwana and Hunuwala areas. In addition, there are two passenger girder bridges built by a company called 'Joseph Westwood & Co. Engineers & Constructor'. The bridges built under this company can be seen at the Galle Railway Station and a tea estate in the Nanu Oya area. Also, there were more companies named 'The Horseley Co. LTD Engineers', 'E.C.J. Keay. LD', 'P & W Maclellan Limited' and 'Patent Shaft & Axilenee Company LTD', manufactured bridges all over the Lanka.




***Figure 3.*** *Plaques of Katugatota Railway bridge*

The stone rollers, which were initially used by elephants in the construction of roads, were manufactured by 'C.A. Huston & Co. LTD', and two such rollers are in the Pilimatalawa Highway Museum. Steam-powered Road crushing rollers were manufactured by Thomas Aveling and Richard Porter's company named Aveling & Porter Limited. Stone roller manufactured by 'Aveling & Baford' company is displayed at the Pilimatalawa Museum. Kurunagala Municipal Council has a roller manufactured by the 'Nicolina' company. Steam-powered lorries were manufactured by 'British Ceylon Corporation'. A tire company in Kandy owns a portable machine manufactured by Marshall Sons & Company which is powered by steam. The Pilimatalawa museum has machinery manufactured by the 'John Allen & Sons (Oxford) LTD and Barford & Perkings LD' companies used to excavate roads.




***Figure 4.*** *Plaques of Steam Roller*

At railway stations to supply water for the steam train installed water pipes manufactured by 'W. Abell LD Makers' company. Also 'Crowns Smart CO. LTD' and 'IS & A Foundry Co. Engineers companies manufactured water tanks for railway stations. Cargo lifting cranes were manufactured by 'Ransomes & Rapier' and 'Cowans Sheldon Co. LTD. Engineers' companies. The scales used to weigh goods at railway stations and the scales used to weigh train carriages were manufactured by 'W & T Avery Makers' and 'H. Pooley & Co. Ltd.' companies. 'Cowans Sheldon & Co. Ltd' company manufactured and brought to Sri Lanka turning tables to turn locomotives. Old telephones that were used in railway stations were made by 'Western Electric Co.' and 'GEC Phone Co.' companies. Railway gates and levers are manufactured by companies such as 'WB & Co. LTD' and 'The Westinghouse Brake & Saxby Signal Co. Ltd'. The company named 'Railway Signal Co. Limited' manufactured Samapo and Disk signals that were situated in railway stations. Brake weights iron balls made by 'Workers & Sons Co.' company and cash safes made by 'The Chatwood Safe & Engineering Co. LTD.' were brought to Sri Lanka for railway stations during the British period.

## Conclusions

During the British colonial rule, they imported various equipment, including bridges, manufactured by various companies in England, and used them in the fields of transport, communication, factories, and public facilities. The research revealed that some of the equipment was manufactured in factories in Eastern countries and Sri Lanka. The research found that companies in the UK manufactured tools for steam locomotives, water, and train maintenance, and various signaling. Such industrial heritages can be protected by proper conservation and public awareness in collaboration with the responsible organizations under the intervention of the Department of Archaeology.

## References

Jayasinghe, Vishwa Sri 2021, *A study on the Industrial Archaeological Heritage of Kandy and Suburbs*, (Unpublished), Department of Archaeology, University of Kelaniya, Kelaniya.

Kodithuwakku, Kusumsiri 2004, Early modern cast products in Sri Lanka, *Archaeologia*, Department of Archaeology, Colombo 07.

Nanayakkara, Kaveesha 2021, *Industrial Archaeological Heritage associated with Galle Railway Station* (in Sinhala), 13$^{th}$ Annual Research Conference, The Royal Asiatic Society of Sri Lanka, Colombo 07. pp. 81-83

# පරාක්‍රම සමුද්‍රයේ ජල කළමනාකරණය තුළින් අනාවරණය කරගත හැකි තත්කාලීන සමාජයේ තිරසාරත්වය

**යූ. චතුනි ලත්හාරි**

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

තෙවන වසර

lathharic@gmail.com

***සංක්ෂේපය***

*අතීතයේ පැවති කෘෂිකර්මාන්තය මුල් කරගත් සමාජයන්හි තිරසාරත්වය උදෙසා ඊසාන දිග මෝසම් වැසි සක්‍රීයව පවතින කලාපයෙහි වැව් ඉවහල් වී තිබේ. ඒ අතරින් පරාක්‍රම සමුද්‍රය විශේෂිත වේ. පරාක්‍රම සමුද්‍රය මඟින් කෘෂිකර්මය මුල් කොටගත් තත්කාලීන සමාජයේ තිරසාරත්වයට සැපයූ දායකත්වය කෙසේ ද යන පර්යේෂණ ගැටලුව මුල් කරගෙන සිදු වූ මෙම පර්යේෂණයේ අරමුණ වූයේ කෘෂිකර්මය මුල් කොටගත් තත්කාලීන සමාජයේ තිරසාරත්වයට පරාක්‍රම සමුද්‍රය සමඟ බැඳුණු වාරි පද්ධතියේ දායකත්වය කෙබඳු දැයි නිර්ණය කිරීමයි. උක්ත පර්යේෂණයේ ක්‍රමවේදය වශයෙන් සාහිත්‍ය විමර්ශන හා අන්තර්ජාලයත් ජාතික භූ දත්ත කළමණාකරණය යටතේ ඇති Geo portal උපාංගයත් යොදා ගන්නා ලදී. පාරිසරිකවූත් සාමාජීයවූත් ආර්ථිකමයවූත් ජල කළමනාකරණය හා බැඳුණු ක්‍රමවිධිහි පවත්නා තිරසාරත්වය මත ගොඩනැංවී ඇති තිරසර ජල කළමනාකරණය, අතීත ශ්‍රී ලංකාවේ දැවැන්ත වාරි පද්ධතීන් තුළින් හැඳිනිය හැකිය. පරාක්‍රම සමුද්‍රයේ පවත්නා සුවිශේෂී ලක්ෂණ කිහිපයක් මඟින් තත්කාලීන සමාජ තිරසාරත්වය හඳුනාගත හැක. එහි දී තිරසාරත්වයට පදනමක් වූ වාරි තාක්ෂණිකාංගයන් ප්‍රධාන වේ. ඒ යටතේ අඛණ්ඩ ජල සැපයුමක් හරහා ඇලවේලි, අමුණු, කළිඟු බැමි යනාදිය හරහා තිරසර ජල  සැපයුම රඳවා ගෙන තිබේ. සමුද්‍රය වටා නිර්මාණය වී පවතින ජෛව පද්ධතිය ද  තිරසාරත්වයට හේතුවක් වී තිබේ. එහිදී මිරිදිය ජෛව පද්ධතිය තුළ ලංකාවටම ආවේණික මත්ස්‍ය විශේෂයක් හඳුනාගත හැක. සාහිත්‍යමය හා අභිලේඛන මූලාශ්‍ර මඟින් අනාවරිත කරුණු ද තිරසාරත්වය පෙන්විය හැකි තවත් ලක්ෂණයකි. එපමණක් නොව 1930, 1948, 1979 යන විවිධ යුගයන්හි සිදු කරන ලද වාරි ප්‍රතිසංස්කරණයන් ද සමුද්‍රයේ තිරසාරත්වයට හේතුවක් වීය. තවද තිරසර ජල කළමනාකරණය සහ සංවෘත ආර්ථික රටාවන් යන ද්විත්ව අංශයන්හි සම්මිශ්‍රණය ද මීට බලපා තිබේ. උක්ත කරුණු සියල්ල ම විමසීමේ දී පෙනෙනුයේ පරාක්‍රම සමුද්‍රය මඟින් තත්කාලීන සමාජ තිරසාරත්වයට පදනමක් එක් කර ඇති බවත් මොරගහකන්ද වැනි නව වාරි ව්‍යාපෘති සඳහා අවශ්‍ය ගාමක බලවේගය වශයෙන් ක්‍රියාත්මකව ඇති බවත්ය.*

***මූඛ්‍ය පදඃ*** *පරාක්‍රම සමුද්‍රය, කළමනාකරණය, සමාජය, තිරසාරත්වය, කෘෂිකර්මාන්තය*

### හැඳින්වීම

අඛණ්ඩ පැවැත්මක් සහිත ශිෂ්ටාචාරගත සමාජයක මූලිකම පදනම ජලයයි. ජලය මුල් කොටගත් තත්කාලීන සමාජ සංස්ථාවේ සමතුලිත බව ඇති කරන්නාවූ තිරසාරත්ව සංකල්පය වනාහි එකී ශිෂ්ටාචාරයේ සශ්‍රීකත්වයට බලපානු ලබන ගාමක බලවේගය වේ. තිරසාරත්වය ගුරු තැන්හි තබා අතීත මිනිසා විශාල වාරි සංස්කෘතියක් අපට උරුම කර දී තිබෙන අතර අවුරුද්දේ අඩකටත් වඩා වියළි සමයක් පවතින ප්‍රදේශයක් පුරා විහිදුනු වාරි පද්ධතිය තත්කාලීන සමාජ සැකැස්මේ ගාමක බලවේගය වීය. මෙසේ ජල ගබඩාකරණය, පානීය ජල අවශ්‍යතා සපුරාලීම, පාංශු හා භූගත ජල සංරක්ෂණය, පරිසර උෂ්ණත්වය සහ ජල වාෂ්පීකරණය අඩු කිරීම, කෘෂිකාර්මික හා වගා කටයුතු යනාදී නොයෙකුත් අංශ ගණනාවක් උදෙසා දායකත්වය සපයන වාරි පද්ධතියට අදාළ බොහෝමයක් වැව් ඊසාන දිග මෝසම් වැසි ලබන කලාපයෙහි ස්ථාපිතව පවතී. මෙසේ අවුරුදු දහස් ගණනක් තිස්සේ වැඩී අද පවා ක්‍රියාත්මකව පවත්නා වැව් හා විශාල ඇල පද්ධතීන් උදෙසා ජලය ගෙන ආ ක්‍රම රාශියක් පවතින අතර එකී ක්‍රමවේදයන්ගේ මනා තාක්ෂණික ශිල්ප උපක්‍රම හේතුවෙන් අද වන විටත් ඒවා නොනැසී ක්‍රියාත්මකව පවතී. වැවට ජලය ගෙන ආ ප්‍රධාන ක්‍රම වශයෙන් වැව හා සම්බන්ධ ඉහළ පෝෂක මූකලාන් වලින් යුත් යෝධ ඇල පද්ධතීන්, ජල හැරවුම් නිර්මිතයන් වශයෙන් ක්‍රියාත්මක වන්නා වූ රිදී බැඳිල්ල සහ කළිඟුල් ඇලවල්, බාහිර ප්‍රභවයන්ගෙන් ජලය ලබා ගැනීම උදෙසා නිර්මිත අමුණු ද පෙන්වා දිය හැක. විවිධ වූ තාක්ෂණික ක්‍රම ගණනාවක් පදනම්ව සැකසී ඇති වාරි පද්ධතිය වටා ඉතා සංවේදී පරිසර කලාපයන් රැසක් හඳුනාගත හැකිවේ. හෙතෙම වැව් පාමුල තෙතමනය සුරකිමින් ශාක වර්ධනය උදෙසා ගෝචර වන්නාවූ ඉස්වැටිත් වැව් ඉහත්තාව තුළ ස්වභාවික ශාකයන්ගේ වර්ධනයත් වැවේ උපරිම ජල මට්ටම් සළකුනු කරන්නා වූ සිසිල් ගුණයෙන් යුත් ශාක ව්‍යාප්තව පවතින්නාවූ වැව් තාවුල්ලත් කිසිදු හෙළිපෙහෙළි කිරීමකින් තොරව ජල පෝෂක රඳා පවත්වාගනු වස් ආරක්ෂා කර තිබේ. ඊට වැඩ ඉනාමළු සකසමින් පනම් බැඳි ගස් චාරිත්‍රයන් සිදුකරමින් වැව භාර දේවාත්මයන්ගේ ආශිර්වාදය ද ගෙන තිබේ. හෙතෙම වැටිවැව්, බිසෝවැව්, කුළුවැව් යනාදීන් නිර්මාණය කරමින් විවිධ වූ අවශ්‍යතාවයන් මත වෙන වෙන ම කුඩා වැව් සඳහා ජලය ලබාදීම ද කර තිබේ. අතීතයේ පැවති කෘෂිකර්මාන්තය මුල්කරගත් සමාජයන්හි තිරසාරත්වය උදෙසා උක්ත සාධක බලපා තිබේ. මෑනිසා එදිනෙදා ජල පරිහරණයටත් මතුපිට ජල මාර්ගයන් ආරක්ෂා කර ගැනීමටත් හැකියාව ලැබිණි. මෙසේ අඛණ්ඩ ජල සැපයුමක් පැවතීමෙන් වගාබිම සැමදාම සශ්‍රීකව පවත්වා ගැනීමට හැකියාව ලැබීය. හෙතෙම පොළොන්නරු රාජධානියෙහි ඇති මෙවන් විශාල වාරි පද්ධතියක් වන්නේ පරාක්‍රම

සමුද්‍රයයි. මෙහි වැව් බැම්ම දිගින් කිලෝමීටර් 12.38ක් සහ උසින් මීටර 9.45කි. වර්ග කි.මී. 71.71ක් පමණ විශාල ජලධාරා ප්‍රදේශයක් වටා විසිරී ඇති සමුද්‍රයෙහි ජල ධාරිතාව ඝන මීටර දසලක්ෂ 134.07ක් ද ජල පැතුරුම හෙක්ටයාර් 2539.5ක් ද වේ. උතුරින් හබරණ ප්‍රදේශය සින්නකුලම් හා දිවුලන්කඩවල වැව දක්වාත් දකුණින් කලහගල ගම, කලහගල වැව, කුකුරු මහවෙල, අංගමැඩිල්ල හා කොටවැල්ල ගම දක්වාත් නැගෙනහිරින් පොළොන්නරුව නගරය හා ගොනාගොල්ල දක්වාත් බටහිරින් සුදු කන්ද හා නැබදිල්ල කඳුවැටියටත් මායිමව ජලාශය ව්‍යාප්ත පවතී (අබිසදහාමි උ.බ, 1999). අක්කර 28,000ක් තරම් වූ වගා බිම් ප්‍රමාණයකට මින් ජලය සැපයිය හැක. ඒ හරහා ගොවි පවුල් 20,000ක් පමණ පෝෂණය වේ. තෝපා වැව, දුඹුටුළු වැව, එරමුදු වැව, භූ වැව, කලහගල වැව හා බැඳි වැව යන ප්‍රධාන වැව් හයක ඒකාබද්ධයෙන් ගොඩනැංවුණු මෙකී සුවිශාල වාරි කර්මාන්තයෙහි ඇති ඉතා වැදගත් තාක්ෂණිකවූත් පාරිසරික හිතකාමීවූත් ක්‍රියාපටිපාටියන් හරහා තත්කාලීන කෘෂිකර්මාන්තය මුල් කොටගත් සමාජයේ තිරසාරත්වයට හේතුවක් වී තිබේ.

## පර්යේෂණ අරමුණ හා ක්‍රමවේදය

මෙහි පර්යේෂණ අරමුණ බවට පත්වූයේ කෘෂිකර්මය මුල් කොටගත් තත්කාලීන සමාජයේ තිරසාරත්වයට පරාක්‍රම සමුද්‍රය සමග බැඳුණු වාරි පද්ධතියේ දායකත්වය කෙබඳුදැයි නිර්ණය කිරීම වේ. ඒ සඳහා අවශ්‍ය තොරතුරු එක්රැස් කිරීමේ ක්‍රම වශයෙන් සාහිත්‍ය විමර්ශනය හා අන්තර්ජාලයත් ජාතික භූ දත්ත කළමනාකරණය යටතේ ඇති Geo portal උපාංගයත් යොදා ගන්නා ලදී. උක්ත පර්යේෂණයේ අවසන් අභිප්‍රාය බවට පත්වූයේ පරාක්‍රම සමුද්‍රයේ වාරි පද්ධතිය හා බැඳුණු තිරසර ජල කළමනාකරණයේ ප්‍රධාන අංග වන පාරිසරික තිරසරභාවය, සාමාජීය තිරසරභාවය, ආර්ථිකමය තිරසරභාවය සහ ජල කළමනාකරණය හා බැඳුණු පරිපාලන ක්‍රම විධිවල තිරසරභාවය යනාදියෙහි සිදුවූ පරිණාමීය ලක්ෂණයන් ආශ්‍රිතව ශාස්ත්‍රීය අධ්‍යයනයක් සිදු කිරීම වේ.


## විමර්ශනය

පාරිසරිකවූත් සාමාජීයවූත් ආර්ථිකමයවූත් ජල කළමනාකරණය හා බැඳුණු ක්‍රමවිධිහි පවත්නා වූ තිරසාරත්වය මත ගොඩනැංවී ඇති තිරසර ජල කළමනාකරණය වනාහි අතීත ශ්‍රී ලංකාවේ දැවැන්ත වාරි පද්ධතීන් තුළින් මැනවින් හඳුනාගත හැකි ලක්ෂණයකි. හෙතෙම ජනාවාස ගතවූ නිම්නයේ භූගෝලීය වශයෙන් වඩාත් සුදුසුතම ස්ථානයේ වැවක් නිර්මාණය කොට ඊට ජලය රැස්කර ගනිමින් බිසෝ කොටුව වැනි සුවිශේෂී තාක්ෂණික ක්‍රියාවිධීන් හරහා නිසි කලට නිසි ප්‍රමාණයට

ජලය බෙදාහරින ලදී. පරාක්‍රම සමුද්‍රයෙහි පවත්නා මෙවන් වූ අති සුවිශේෂී වාරි තාක්ෂණික අංගයන් ගණනාවක් නිසාවෙන් තත්කාලීන සමාජයේ තිරසාරත්වයට දායකත්වය සපයා තිබේ.

## තිරසාරත්වයට පදනමක් වූ වාරි තාක්ෂණිකාංගයන්


පරාක්‍රම සමුද්‍රය වෙත මූලාශ්‍ර කීපයකින් ජලය එක්රැස් කරගෙන තිබේ. තෝපා, දුඹුටුළු, එරමුදු, භූ වැව, කලහගල වැව, බැඳිවැව යනාදී වශයෙන් ප්‍රධාන මූලාශ්‍ර කිහිපයක් හරහා අඛණ්ඩ ජල සැපයුමක් එක් කරගෙන තිබේ.




*ඡායාරූපය 01: පරාක්‍රම සමුද්‍රයේ නානමිතික සිතියම*

මෙනිසා කෘෂි බිම් වලට කිසිදු බාධාවකින් තොරව ජලය ලබා ගැනීමේ හැකියාවත් සමඟ කෘෂිකාර්මික තිරසාරත්වය ගොඩනැගිණි. එපමණක් නොව ඊසාන දිග මෝසම් වර්ෂාවෙන් ලැබෙන්නා වූ ජලයට අමතරව වියළි කලාපයට ජලය ගෙන ආ මහවැලි ගඟ වැනි ස්වභාවික ජල මූලාශ්‍රයන් හරහා ද ජලය ගෙන තිබේ. මහවැලි ගඟේ ප්‍රධාන අතු ගංගාවක් වන අඹන් ගඟ අංගමැඩිල්ලේ දී හරස්කර ආකාස ගංගාව නම් ඇල මාර්ගය මඟින් ජලය ගෙන තිබේ (Arumugam S, 1969). මෙම ඇල මාර්ගය කිලෝමීටර් අටක් දිග වේ. තවද අඩි 100ත් 200ත් අතර සමෝච්ච රේඛාවන් යොදා ගනිමින් අංගමැඩිල්ල ඇල නිර්මාණය කර තිබේ (අවිසදහාමි උ.බ, 1999). වාරි තාක්ෂණයේ වූ මෙවන් විශිෂ්ටත්වයන් හේතුවෙන් ගොවි බිම්හි සශ්‍රීකත්වයත් මිනිසාගේ මූලික අවශ්‍යතාවයනුත් ඉටු කර ගත හැකි විය. එමඟින් පාරිසරික තිරසාරත්වය පවත්වා ගනිමින් පරිසරයේ වූ ජල සංචිතයන් එලෙසම

ආරක්ෂා කර ගැනීමට හැකි වීය. වර්ෂාවෙන් තොර ජලය හිඟ සමයන් වලදී ප්‍රමුඛතාවන් හැඳින ඊට අදාලව වැව්වලට ජලය බෙදාහැරීම සිදු කෙරුණු අතර පරාක්‍රම සමුද්‍රය ද ඊට ඉවහල් විය. මෙනිසා සමාජයේ සෑම අවශ්‍යතාවයකට ම මනාව ජලය බෙදා හැරි අතර එමඟින් සමාජ තිරසාරත්වය තහවුරු විය. පරාක්‍රම සමුද්‍රය වෙත ජලය ලබාගත් තවත් තාක්ෂණික ක්‍රියාවලියක් වන්නේ අංගමැඩිල්ල ක්‍රමවේදයයි. මෙහිදී ජලය මුදා හැරීමට ප්‍රධාන ඇලක් ද අතිරික්ත ජලය මුදා හැරීමට උප ඇලක් ද තිබූ අතර එම උප ඇල හරහා ජලය ප්‍රධාන ඇලට බැස යාමට සලස්වා තිබේ. තවද මෙහි වේල්ලේ එක්වන ජලය පහළින් සංසරණයට ඉඩ දී තිබේ. බාදනය වළක්වා ගැනීමට ප්‍රධාන ඇල ආරම්භ වන ස්ථානයෙහි ම බැම්මක් බැඳ තිබේ. මෙහිදී හදිසි ජල පීඩනයක දී අතිරික්ත ජලය ප්‍රධාන බැම්ම හරහා ගලා යාමෙන් පරිසර හිතකාමී පද්ධතියක් ගොඩනංවමින් වේල්ල ආරක්ෂා කර තිබේ. පරාක්‍රම සමුද්‍රය එකිනෙකින් වෙන් කරන ලද කළිඟු බැමි සහිත වැව් හතරකින් යුතු වේ.




***ඡායාරූපය 02:** හරස් පැතිකඩ සටහන*

උතුරු දෙසින් තෝපා වැවත් දකුණු දෙසින් අඹන් ගඟ ඉවුරේ කොටසක වූ අගු වැවත් වේ. වැවේ මහා බැම්මට ලම්භකව වද්දවමින් වැව ඇතුළේ සිට එහි උස් බිම් යා කරමින් ගොඩනගා ඇති කළිඟු බැමි මඟින් වැව් හතරේ ජල මට්ටම් ස්වාධීනව පවත්වාගෙන තිබේ. අංගමැඩිල්ල දිය හැරවුමෙන් ඇරඹෙන යෝධ ඇල අතීතයේ දී වැව් ඉස්මත්ත දිගේ සුවන්දිරන් ජල මට්ටම් රේඛාවේ ගොස් ඇතුමල්පිටිය වැවට වැටිණි (අව්සදහාමි උ.බ, 1999). මෙම යෝධ ඇල මඟින් සමුද්‍රයේ වැව් හතරට ම අවශ්‍ය තරමට ජලය හරවා ගෙන ඇත. තව ද දිවුලන්කඩවල ඇල පාත්වන නික

වැවත් ඇතුමල්පිටිය වැවත් මෙම යෝධ ඇල මඟින් ගෙනෙන ජලය බෙදන ව්‍යුහයක් වශයෙන් අතීතයේ ක්‍රියාත්මක විය. මේ හරහා තෙතමනය සහිත පසක් නිර්මාණය වීමෙන් පසේ සජීවී බවත් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණයත් සිදුවූ අතර පාංශු තිරසාරත්වයත් පස වනාහි ජල පවිත්‍රාගාරයක් වශයෙන් ක්‍රියාත්මක වීමත් හරහා වගාබිම් සඳහා සාරවත් බිමක් වියළි කලාපයට උරුම කරවීය.

හෙතෙම සමෝච්ච රේඛා ක්‍රමය පදනම්ව අංගමැඩිල්ල ඇල යොදා තිබීමෙන් වර්ෂාවෙන් ලැබෙන ජලය අවම අනුක්‍රමණයක් යටතේ අඩු වේගයකින් ගලා යාමෙන් රොන්මඩ ඇලෙහි වකයන්හි තැන්පත්ව සමුද්‍රය ආරක්ෂා කර තිබේ. මෙනිසා යල, මහ දෙකන්නයේ වගාවන්ට අපද්‍රව්‍යවලින් තොර පිරිසිදු ජල නිකුතුවක් සැපයීමෙන් තවදුරටත් කෘෂිකාර්මික සමාජ තිරසාරත්වය තහවුරු වීය. මෙසේ කුඹුරු වෙත ජලය බෙදාහරින ලද ඉල වැව් සහ දැල වැව් වශයෙන් සඳහන් ප්‍රධාන ඇලවල් වූ බවත් අක්කර 20,000 ඉක්මවන කුඹුරු වපසරියක් හිමි පරාක්‍රම සමුද්‍රයෙහි ද පලින් පල එම වැව් තිබූ බවත් මෙමගින් මනා පාලනයකින් යුතුව ජලය බෙදා හැර කෘෂි අස්වැන්නත් පාංශු තිරසාරත්වයත් තහවුරු කොට තිබෙන බැව් උඩුල බණ්ඩාරයන්ගේ වැව නම් පර්යේෂණ ග්‍රන්ථයෙහි සඳහන් කරයි.

**තිරසාරත්වයට පදනමක් වූ ජෛව පද්ධතිය**

පරාක්‍රම සමුද්‍රය වටා නිර්මාණය වී පවතින ජෛව පද්ධතිය එහි තිරසාරත්වයට තවත් හේතුවක් වී තිබේ. හෙතෙම සමුද්‍රයේ මිරිදිය ජෛව පද්ධතිය තුළ ලංකාවට ම ආවේණික වූ *Labeo heladiva* නම් මත්ස්‍ය විශේෂය හමුවේ. (Sudasinghe H, 2018)




***ඡායාරූපය 03:*** *Labeo heladiva* නම් මත්ස්‍ය විශේෂය

වර්ෂ 2018 දී ශ්‍රී ලාංකික පර්යේෂණ කණ්ඩායමක් විසින් තහවුරුකරණයට පෙර ඉන්දියාවට ආවේණික වූ *Labeo dussumieri* නම් මත්ස්‍ය විශේෂයක් වශයෙන් මෙම මසුන් හඳුනාගෙන තිබිණි. මෙවැනි ලංකාවට ම ආවේණික වූ මත්ස්‍ය විශේෂයන් සඳහා සුදුසු ජෛව පද්ධතියක් වශයෙන් අතීතයේ සිට ම පරාක්‍රම සමුද්‍රය

ක්‍රියාකර තිබේ. තවද පරාක්‍රම සමුද්‍රයේ ප්‍රධාන පරිභෝජන හා ආර්ථික වටිනාකමක් ඇති ජලජ මත්ස්‍ය විශේෂය වන *Sarotherodon mossambicus* නම් තිලාපි විශේෂය (Schiemer, F,1981) මෙකී ජෛව පද්ධතියේ ජෛව ක්‍රියාවලියට ප්‍රධාන ගාමක බලවේගය වශයෙන් ක්‍රියාත්මක වන *Melosira granulata phytoplankton* මඟින් නිපදවෙන ශක්තිය ප්‍රයෝජනයට ගනිමින් සමුද්‍රය වටා බැඳුණු සංවෘත පරිභෝජන රටාවන්ගේ තිරසාරත්වයේ එක් අංගයක් බවට පත්ව තිබේ.

## සාහිත්‍යමය හා අභිලේඛන මුලාශ්‍ර මඟින් අනාවරිත සමුද්‍රීය තිරසාරත්වය

විවිධ සාහිත්‍යමය හා අභිලේඛන මූලාශ්‍ර මඟින් අනාවරණය වන්නා වූ තත්කාලීන තිරසර වාරි පරිපාලන හා සමාජ තොරතුරු මඟින් ද පරාක්‍රම සමුද්‍රයේ වූ තිරසාරාත්මක වාරි දායකත්වය මැනවින් හඳුනාගත හැකිවේ. "....මෙබඳු දේශයෙහි වැස්සෙන් හට ගත් ජලය මදකුත් ලෝකෝපකාරයෙන් වෙන් ව කිසි කලෙකත් මුහුදට නොයේවා...." (මහාවංශය, 297 පිටුව, 68 පරිච්ඡේදය) යන උදාර වාක්‍ය එදා පරාක්‍රමබාහු මහ රජතුමන්ගේ සුවිසල් වාරි දැක්ම මැනවින් පෙන්වයි. වර්ෂාව ඉතාමත් අල්ප කලාපයක් වන මෙම ප්‍රදේශයේ පරාක්‍රම සමුද්‍රය වැනි වාරි දායාදයන් නොතිබෙන්නට තවදුරටත් මිනිස් වාසයෙන් තොර භූමියක් වීමට ඉඩ තිබිණි. චූලවංශයේ සඳහන් පරිදි සමුද්‍රයෙන් නික්මුණාවූ ඇලවල් සතරක් ඇතුළු නුවරට ආසන්නයෙන් විශේෂ ස්ථාන සතරකින් ගලා ගොස් තිබේ. ඉන් එකක් වූ අංගමැඩිල්ල අමුණු බැම්මත් ජලය ගෙනගිය ඇලත් සමුද්‍රයට ජලය ගෙන ආ ප්‍රධාන මාර්ගය බැව් සනාථය. ඒ අනුව පරාක්‍රම සමුද්‍රයේ වාරි පාලනය එකිනෙක ඒකාබද්ධ වූ වාරි පද්ධතියක් හරහා ගොඩනැංවී තිබීමෙන් වැසි ජලය අපතේ යාමකින් තොරව ගබඩා කරගත හැකිව තිබේ. වංශකතාගත තොරතුරු සහ කොඩ්රිංග්ටන් වාර්තා අනුව වෙන් වූ දිශාවන්ට ගලායන වෙන් වෙන් ගංගාහි ජලය කෘත්‍රිම ජල මාර්ග මඟින් එක් කරවීම පුරාණ සිංහල වාරි සුවිශේෂීත්වයකි. ඒ හරහා තත්කාලීන කෘෂි කර්මාන්තගත සමාජයේ තිරසාරත්ව පදනම ගොඩනැංවීය. පරාක්‍රම සමුද්‍ර වැව් කණ්ඩියේ තැනින් තැන ලේඛන කෙටූ ගල් කණු කීපයකි. එම කණු වල දෙපැත්තේ පරාක්‍රමබාහු රජු කරවන ලද බැව් කියන සංස්කෘත හා සිංහල පද්‍යත් අනෙක් පස ඒ ඒ කණු අතර දුර රියන් වලින්ද ඇතැම් සුප්‍රකට වැව් කණ්ඩිවල  දිග හා සසඳා තිබේ.

උදා: දෙවැනි කණුවේ සිට තුන්වැන්නට රියන් 1135

තෙවැනි කණුවේ සිට සිව්වැන්නට රියන් 4300 (ගඟතලා නොහොත් කන්තලේ වැව)

සිව්වැන්නේ සිට පස්වැන්නට රියන් 3200 (පදිවැව නොහොත් පදවිය වැව)

පස්වැනි කණුවේ සිට සයවැන්නට රියන් 1700 (කලාවැව)

සයවැන්නේ සිට සත්වැන්නට රියන් 1600 (කණදියදර නොහොත් කනදරා වැව)


මෙසේ දැක්වීමේ අරමුණ නම් සමුද්‍රයේ වැව් කණ්ඩියේ දිග සුප්‍රකට මහ වැව් කණ්ඩිවල මුළු දිග එකතුවට ද වැඩි බව පෙන්වා දී වංශකතාගත පරිදි "වැව් රජ" යන උප නාමය ඊට යෝග්‍ය බව සනාථ කරවීමටය. මේ හේතුවෙන් අක්කර 25,188 ක් වගාකරමින් 12,137කට ආසන්න ගොවි පවුල් සංඛ්‍යාවක් ජීවත් කරවමින් මෙරට වී නිෂ්පාදනයෙන් 5%ක දායකත්වයක් සැපයීමට සමුද්‍රයට හැකිවිය. තවද ජලය නැවත නැවත පරිහරණය කිරීමත් යම් ප්‍රදේශයකට ලැබෙන වැස්ස උපරිමව භාවිතා කිරීමත් අපගේ සම්ප්‍රදායයි. එහිදී පරාක්‍රම සමුද්‍රයේ අඹන් ගඟ අමුණේ ඉදි වූ රිදී බැඳිල්ල හරහා තිරසර සංවර්ධන එළඹුම යටතේ පාරිසරික සංරක්ෂණයත් සෞඛ්‍ය ගැටලුවලින් තොර මනා ජල කළමනාකරණයත් පාරිසරික බිඳවැටීමෙන් තොර සමාජ සංස්ථාවක් බිහි වීමට හේතුවිය.

හෙතෙම වාරි පදනම මත රැඳුණු ශ්‍රී ලාංකේය ශිෂ්ටාචාරය පිළිබඳවත් ඉන් පරාක්‍රම සමුද්‍රය හරහා එල්ල කරන ලද බලපෑමත් ආර්නෝල්ඩ් ටොයින්බී නම් පර්යේෂකයා විසින් සිය කෘතියේ දී මෙසේ පවසා තිබේ. අපූර්ව දියාලු ක්‍රමය යැයි හඳුන්වමින් ටොයින්බී කඳුවලින් ගලන ජල මංපෙත් බැඳ, ඒ ජලය ඇතැම් ඒවා සරියෙන් අක්කර 4000ක් ඉක්මවූ යෝධ ගබඩා වැව්වලට හරවන හැටිත් ඉන් ඇරඹෙන ඇල මංපෙත් අනෙක් මහ වැව්වලට දුවවන සැටිත්, සෑම මහ වැවක් සහ යෝධ ඇලක් පාමුල විසිරී සිය ගණන් කුඩා වැව් සෑම එකක් ම ගමක න්‍යෂ්ටිය වූ සැටිත් ක්‍රි.ව. 11 වන සියවසේ වූ මහා පරාක්‍රම සමුද්‍රය තුළ ද තවමත් ඒවා භාවිතයේ පවතින බවත් දක්වයි.

### විවිධ යුගයන්හි දී සිදු කරන ලද ප්‍රතිසංස්කරණයන් මඟින් සිදු වූ සමුද්‍රීය තිරසාරත්වය

තවද විවිධ යුගයන්වල දී පරාක්‍රම සමුද්‍රයේ වාරි පද්ධතියට සිදු වූ වෙනස්කම් මඟින් දතිරසාරාත්මක ලක්ෂණ ඉස්මතු වේ. වර්ෂ 1930න් පසු වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සංවර්ධන යෝජනාවක් යටතේ වර්ෂ 1937 දී පරාක්‍රම සමුද්‍ර

යෝජනා ක්‍රමයට ප්‍රථම වතාවට බර යන්ත්‍ර සූත්‍ර යොදා ගැනිණි. මේ හේතුවෙන් ජලාශයේ ජල පෝෂක ධාරිතාව තවදුරටත් වර්ධනය වීමත් එමඟින් අවශ්‍යතාව මත කෘෂි බිම් ක්‍රමානුකූලව සංවර්ධනයටත් ඉඩ ලැබිණි. පරාක්‍රමබාහු රජුගෙන් පසුව වර්ෂ 1948 දී අගමැති ඩී. එස් .සේනානායකයන් යටතේත් වර්ෂ 1979 දී ඉංජිනේරු ඥානවර්ධනයන් යටතේත් වැව් වේල්ල ප්‍රතිසංස්කරණය කෙරීය. එනිසා ශක්තිමත් වේල්ලක රඳා පැවැත්මෙන් විශාල ජල ධාරිතාවක් රැස් කොට අවශ්‍ය වේලාවට මුදා හැරීමටත් හැකිවිය. වර්ෂ 1920 වන තෙක්ම ලොව ලොකුම බැම්ම වූයේ මෙයයි. මීට අමතරව සමුද්‍රයෙහි සිදු කළ වත්මන් ප්‍රතිසංස්කරණ හේතුවෙන් ඒ අවට ප්‍රදේශයේ වැඩි වශයෙන් සංක්‍රමණිකයන් ද ප්‍රධානවම වී වගාකරුවන් හා වඩාත් මෑතකදී ධීවරයන්ගේ ආකර්ෂණයත් ලැබී තිබේ.




***ඡායාරූපය 04:*** 1975 - 1979 අතර මාසික මත්ස්‍ය එලදාව

තවද ජල පෝෂක ප්‍රමාණය වර්ග කිලෝ මීටර් 75කි. වර්ෂ 1978 දී සමුද්‍රයේ කැඩී තිබූ බැම්ම නැවත පිළිසකර කොට එහි කොටසක වූ රළපනාව නැවත සකසා තිබේ. මෙමගින් පොළොන්නරු යුගයෙන් පසුව අභාවයට ගොස් පැවති තිරසාරාත්මක ජලය බෙදාහැරීම නැවත ප්‍රතිසංස්කරණය කොට අනවශ්‍ය සේදී යාම් තුළින් වැව් බැම්ම ආරක්ෂා කර තිබේ. එපමණක් නොව වර්ෂ 1854 දී පරාක්‍රම සමුද්‍රයේ මැද වැව වූ දුබුටුලු වැව කැඩී වල් බිහිවී මඩ ගොහොරුවක් බවට පත්ව තිබූ අතර නැවත වතාවක් වර්ෂ 1945 දී වැව් බැම්ම නැවත ප්‍රතිසංස්කරණය කරමින්

පරාක්‍රම සමුද්‍ර වාරි කර්මාන්තය හා එක්වූ අතර එමඟින් තවදුරටත් ජල පෝෂක ප්‍රදේශයන් වර්ධනය කරමින් වියළි කලාපය ආශ්‍රිතව ජන දිවිය හා සම්බන්ධව තිරසාරාත්මක සමාජයක පදනම දමා තිබේ.

## තිරසාර සංවර්ධනය උදෙසා සංවෘත ආර්ථිකය හා තිරසර ජල කළමනාකරණයේ බලපෑම

තිරසර  ජල කළමනාකරණය සහ සංවෘත ආර්ථික රටාවන් යන ද්විත්ව අංශයන් එකිනෙකට සම්බන්ධ වේ. ඊට හේතුව නම් ජනගහනයේ වර්ධනයත් කාලගුණික විපර්යාසයනුත් නිසාවෙන් ඇතිවන්නා වූ ජල සම්පත් හිඟ වීමට විසඳුමක් වශයෙන් තිරසර ජල කළමනාකරණය සහ සංවෘත ආර්ථිකය යන ද්විත්ව අංගයන්ගේ සම්මිශ්‍රණයක් යොදා ගත යුතුව පවතී. තිරසර ජල කළමනාකරණ අංග මගින් ඇති කරගන්නා වූ ආර්ථික හා පාරිසරික තිරසාරත්වය භාවිතයෙන් වාරි පද්ධතීන් හා බැඳුණු කෘෂිකාර්මික සමාජයන් තුළ සංවෘත ආර්ථික හා චක්‍රීය ජල පරිභෝජන රටාවන් ස්ථාපිත කිරීම මගින් තිරසාර සංවර්ධනයක් ළඟා කරගත හැකි වේ.

## සමාලෝචනය හා නිගමනය

පරාක්‍රම සමුද්‍ර වාරි පද්ධතිය හා සබැඳුණු තත්කාලීන කෘෂිකාර්මික සමාජ ක්‍රමයේ පැවති තිරසාරත්වය ගැන පරාක්‍රම සමුද්‍රයෙහි වූ වාරි තාක්ෂණික අංගයන්ගෙනුත් ඒ වටා බැඳුණු ජෛව පද්ධතියත් සාහිත්‍යමය හා අභිලේඛනගත මූලාශ්‍ර මගින් අනාවරිත තත්කාලීන තිරසාරාත්මක වාරි පරිපාලන හා සමාජයත් විවිධ යුගයන්හි දී සිදු කරන ලද ප්‍රතිසංස්කරණයනුත් යන මෙම අංශයන් ඔස්සේ පර්යේෂණ කෘති, පර්යේෂණ පත්‍රිකා, සාහිත්‍යමය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රත් ජාතික භූ දත්ත කළමනාකරණය යටතේ ඇති Geo portal උපාංගය වැනි මූලාශ්‍ර භාවිතයෙනුත් දැක්වූ කරුණු මගින් පාරිසරික තිරසාරත්වය, සාමාජීය තිරසාරත්වය, ආර්ථිකමය තිරසාරත්වය හා ජල කළමනාකරණය සමඟ බැඳුණු පරිපාලන ක්‍රම විධිවල තිරසාරත්වය යනාදිය තහවුරු වූ බැව් හඳුනාගත හැකිය. හෙතෙම මොරගහකන්ද වැනි නව වාරි ව්‍යාපෘතිත් දැනට පවත්වාගෙන යනු ලබන වාරි ව්‍යාපෘතිත් ප්‍රවර්ධනයේ දී සහ සංවර්ධනයේදීත් අතීතයේ වූ මෙවැනි තිරසාරාත්මක අංගයන් ආරක්ෂා වන පරිදි සංවෘත පරිභෝජන හා ආර්ථික රටාවන් ගොඩනැංවෙන ආකාරයට ක්‍රියාවට නැංවීමෙන් මතු පරපුර උදෙසා සම්පත් ආරක්ෂා වන පරිද්දෙන් අපගේ අවශ්‍යතාවයන් සපුරා ගැනීමට හැකියාව ලැබෙන බැව් නිගමනය කළ හැක.

## ආශ්‍රිත මූලාශ්‍ර

අවුසදහාමි, උ.බ. වැව. (1999). හෝකන්දර. ප්‍රාචී ප්‍රකාශන

බ්‍රෝහියර්, ආර්.එල්. (1999). බ්‍රෝහියර් දුටු ලංකාව. (ඒ. හේවාවසම් පරි). මරදාන. සූරිය ප්‍රකාශකයෝ

උඩවත්ත, ඒ.කේ. (2016). වැකම් පෙළහර, පන්හිඳක අසිරිය

Arumugam, S. (1969). Water Resource of Ceylon Its Utilisation And Development. Colombo. A water resource board publication

Schiemer, F. (1981). Parakrama Samudra (Sri Lanka) Project. a study of a tropical lake ecosystem I. An interim review. Internationale Vereinigung für theoretische undangewandte Limnologie: Verhandlungen. 21:2. 987-993. DOI: 10.1080/03680770.1980.11897121

Sudasinghe, H. Ranasinghe, R.H.T. (2018). A review of the genus Labeo (Teleostei: Cyprinidae) in Sri Lanka. New Zealand. ZOOTAZA

Aluwihare, P.B. Kikuchi, M. (1991). Irrigation Investment Trends in Sri Lanka: New Construction and Beyond. Colombo. International Irrigation Management Institute

National Spatial Data Infrastructure Sri Lanka. (2021, December 22). Retrieved from Sri Lanka NSDI Geoportal: https://geoportal.nsdi.gov.lk

International Lake Environment Committee Foundation. (2021, December 19). Retrieved from PARAKRAMA SAMUDRA (LAKE PARAKRAMA): https://wldb.ilec.or.jp/Display/html/3562

# උරුම සංරක්ෂණය ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා උරුමයට එල්ල වී ඇති කාලීන අභියෝග හා මෙරට පුරාවිද්‍යා ආඥාපනතින් ඒවාට ගලපා ගත හැකි ප්‍රතිපාදන

**එස්. ඩබ්. එස්. ජී. විජේරත්න**

ඉතිහාසය විශේෂවේදී, සිව්වන වසර, ඉතිහාසය අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

gayand02i83@gmail.com

***සංක්ෂේපය***

*මෙරට පුරාවිද්‍යා උරුමයට එල්ල වී ඇති කාලීන අභියෝග හමුවේ 1940 පුරාවිද්‍යා ආඥා පනත මගින් ගෙන ඇති ප්‍රතිපාදන තුළින් මෙරට පුරාවිද්‍යා උරුමය කොතෙක් දුරට සුරක්ෂිත වන්නේ ද? යන්න මෙහි පර්යේෂණ ගැටලුව ලෙස සඳහන් කළ හැක. පුරාවිද්‍යා ආඥා පනතෙහි ඇති ප්‍රතිපාදන මගින් මෙරට පුරාවිද්‍යා උරුමයන් කාලීන අභියෝග හමුවේ යම් තරමක් දුරට සුරක්ෂිත වී ඇති බව පෙනුන ද ගැටලුව වන්නේ ඇතැම් කාලීන අභියෝගයන් සඳහා පුරාවිද්‍යා ආඥාපනතින් ගෙන ඇති ප්‍රතිපාදන ප්‍රමාණවත් නොමැති වීම මෙන්ම ඇතැම් නීති රීතිවල අඩුපාඩු දක්නට ලැබීමයි. මේ නිසා මෙම පර්යේෂණය මගින් 1940 පුරාවිද්‍යා ආඥා පනත පිළිබඳ හැඳින්වීමක් සිදුකිරීම ද, ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා උරුමයට එල්ල වී ඇති කාලීන අභියෝග හා මෙරට පුරාවිද්‍යා ආඥාපනතින් ඒවාට ගලපා ගත හැකි ප්‍රතිපාදන විමසා බැලීමත්, ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා උරුමයට එල්ල වී ඇති කාලීන අභියෝගවලට පිළියම් ලෙස ගත හැකි ක්‍රියාමාර්ග කීපයක් පිළිබඳ යෝජනා කිරීමත් අරමුණු ලෙස සඳහන් කළ හැක. මෙහිදී පුස්තකාල පර්යේෂණ ක්‍රමවේදය සහ ක්ෂේත්‍ර අධ්‍යයන සටහන් භාවිතා කිරීම ප්‍රවේශය යොදා ගැනීමට බලාපොරොත්තු වේ. මෙරට පුරාවිද්‍යා ආඥා පනත මගින් මෙරට පුරාවිද්‍යා උරුමයන් හා පුරාවස්තූන්ට එල්ල වී ඇති කාලීන අභියෝගයන් හමුවේ මෙරට පුරාවස්තූන් යම් තරමක් දුරට සුරක්ෂිත වී ඇති බව පෙනේ. නමුත් තවමත් නොවිසඳුනු, පිළියම් නොයෙදුණු පුරාවිද්‍යා උරුමයන්ට, පුරාවස්තූන්ට එල්ල වු කාලීන අභියෝග කිසියම් ප්‍රමාණයක් පවතින බව පැහැදිලිය. මෙම අභියෝග සාර්ථක ලෙස ජය ගැනීම සඳහා කාලීන වැඩපිළිවෙලක අවශ්‍යතාව දැන් දැන් වැඩි වශයෙන් ඉදිරිපත් වී අති බව පැහැදිලිව ම පෙනේ.*

***මුඛ්‍ය පද:*** *උරුමය, ආඥාපනත, පුරාවස්තු, අභියෝග, යෝජනා*

## හැඳින්වීම

නූතනයේ ලෝක පුරාවිද්‍යාව දෙස අවධානය යොමු කරන විට දැකගත හැකි තත්ත්වයක් නම් පුරාවිද්‍යා උරුමයන්ට හානි පැමිණෙන ආකාරයෙන් විවිධ කටයුතු සිදු වන බවයි. මෙකී තත්ත්වය පුරාවිද්‍යාව සම්බන්ධ කටයුතු මුලින් ම ආරම්භ වූ යුගය දක්වා ම දිවයන බව පෙනේ. මුල් කාලීනව පුරාවිද්‍යාව ආරම්භ වන්නේ පුරාවස්තු එකතු කිරීමේ ක්‍රියාවලියක් ලෙසට ය. කෙසේ වෙතත් පුරාවස්තූන් යන්න ලෝක සංස්කෘතික උරුමයේ ජීවමාන සාධකයෝ වෙති. පුරාවිද්‍යා ශික්ෂණයේ නාමයෙන් මේ දක්වා ලොවට අහිමි වූ පුරාසාධක ඉතා විශාල ප්‍රමාණයක් පවතී. විශේෂයෙන් ම පුරාවිද්‍යාව විද්‍යාවක් ලෙස වර්ධනය වීමෙහිලා පුරාවස්තු සොරකම සහ විනාශය උරුම කරගත් යථාර්ථයකි. විශේෂයෙන් ම ක්‍රි.ව. 15, 16, 17 සහ 18 වන සියවස් දෙස අවධානය යොමු කරන විට පුරාවස්තු නැතහොත් කෞතුක වස්තු රැස්කිරීම පිණිස විවිධ කැණීම් සිදුකරන ආකාරයක් හඳුනාගත හැකි වේ. යුරෝපීය කෞතුකාගාර වන ඇශ්මොලියන්, ලූවර්, බ්‍රිතාන්‍ය වැනි කෞතුකාගාර තුළ මෙලෙස එක්රැස් කරන ලද පුරාවස්තු විශාල සංඛ්‍යාවක් පවතී. එමෙන්ම පුනරුදය ඇති වීමත් සමඟ යුරෝපයේ විවිධ රටවල් තුළ පුරාවස්තු එකතු කිරීම සඳහා තරඟයක් ඇති විය. මේ තරඟයේ ප්‍රතිඵල ලෙසට යුරෝපා ජාතීන් විසින් යටත් කරගෙන තිබූ විවිධ යටත් විජිතයන්හි තිබූ පුරාවස්තු පවා කැණීම් සිදු කොට තම මව්රටට ගෙන ඒමට ක්‍රියා කරන ලදී. මේ ආදී තත්වයන් නිසා ලෝකයේ බොහෝ රටවල පුරාවස්තු ඉතා විශාල ලෙස විනාශයට පත්විය. ඉතිහාසයෙහි පුරාවස්තු මංකොල්ලය මෙහි දී ප්‍රබලතම අවස්ථාවක් ලෙස හඳුනා ගත හැකිය. එකල යුරෝපයේ ඉතිහාසගත පුරාවස්තු මංකොල්ලකරුවන් ලෙස ක්ලෝඩියස් රිච්, එමිල් බොත්තා වැනි පුද්ගලයන්ගේ කටයුතු සිදු වී ඇති ආකාරයක් හඳුනාගත හැකිය.

මෙසේ ආරම්භ වූ පුරාවස්තු සොරකම සහ විනාශය ක්‍රම ක්‍රමයෙන් වර්ධනය වෙමින් වර්තමානය වන විට ලෝක සංස්කෘතික උරුමයට මහත් තර්ජනයක් බවට පත්ව තිබේ. මෙකී තත්ත්වයට එරෙහිව කටයුතු කරමින් පුරාවස්තු ආරක්ෂා කරගැනීම සහ නඩත්තු කරගෙන යෑම සඳහා ලෝකයේ අවධානය යොමු විය. මේ සඳහා ජාත්‍යන්තර වශයෙන් විවිධ සංවිධාන පවා බිහිවන්නට විය. ඒ අතර UNESCO, ICOMOS වැනි සංවිධානයන්ගේ ප්‍රභවයන් ඉතා වැදගත් වේ. මෙලෙස ජාත්‍යන්තර සංවිධාන බිහිවීමත් සමඟ පුරාවස්තු ආරක්ෂා කරගැනීම සඳහා විවිධ ගිවිසුම්, ප්‍රඥප්තීන් ආදීය ඉදිරිපත් විය. ඒ අතර 1964 වැනීසියේ ප්‍රඥප්තිය, 1979 බරා ප්‍රඥප්තිය, 1987 වොෂින්ටන් ප්‍රඥප්තිය, 1990 පුරාවිද්‍යා උරුමය ආරක්ෂාව හා කළමනාකරණය පිළිබඳව වූ ප්‍රඥප්තිය, 1994 නාරා ප්‍රකාශය, 1999 අන්තර්ජාතික උරුමයේ වැදගත් සංස්කෘතික ස්ථාන හා සංචාරක කටයුතු කළමනාකරණය කිරීම

පිළිබඳ ප්‍රඥප්තිය ආදිය ප්‍රමුඛ ඒවා ලෙස හඳුනාගත හැකිය. මෙම අවස්ථාවන් තුළින් පුරාවස්තු විනාශයන් අවම කරලීම සඳහා ප්‍රතිපාදන රාශියක් ගෙන තිබේ.

මෙරට බොහෝ වටිනාකමකින් යුතු පුරාවස්තු යුරෝපා රටවලට යටත් විජිත යුගවල දී අපනයනය විය. මෙම තත්ත්වය වළක්වාලීම සඳහා මුලින් ම ශ්‍රී ලංකා භූමියේ නිධානයන් පිළිබඳ වූ නීතියක් 1887 දී පනවා ඇත. එය නිධානයන් පිළිබඳ පනත (Treasure Trove Act 1887) ලෙස හැඳින්වේ. නමුත් ඒ තුළ පැහැදිලිව පුරාවස්තු සුරැකීම පිළිබඳ අර්ථවත් නොවීම නිසා නැවත ඊට වඩා බලවත් නීතියක අවශ්‍යතාවය මතුවිය. මේ නිසා 1940 දී පුරාවස්තු ආරක්ෂා කිරීම සඳහා වූ ප්‍රථම පනත එළිදකී. එය පුරාවිද්‍යා ආඥා පනත (Antiquities ordinance) ලෙස හැඳින්වේ. මෙම පනත මගින් ශ්‍රී ලංකාවේ පවතින පුරාවිද්‍යාත්මක උරුමයන් සුරක්ෂිත කරලීම සඳහා ප්‍රතිපාදනයන් රාශියක් ගෙන තිබේ. ඒ නිසා 1956, 1963, 1998 හා 2005 යන වසරවල දී මෙම පුරාවිද්‍යා ආඥා පනතට විවිධ සංශෝධනයන් සිදු වී තිබේ. කෙසේ වෙතත් වර්තමානයේ ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා උරුමයට එල්ල වී ඇති කාලීන අභියෝග හමුවේ 1940 පුරාවිද්‍යා ආඥා පනත මඟින් ගෙන ඇති ප්‍රතිපාදන තුළින් මෙරට පුරාවිද්‍යා උරුමය කොතෙක් දුරට සුරක්ෂිත වන්නේ දැයි විශ්ලේෂණාත්මකව විග්‍රහයක් සිදු කිරීම වැදගත්ය. මෙහි දී 1940 පුරාවිද්‍යා ආඥා පනත පිළිබඳ හැඳින්වීමක් සිදුකිරීම ද, ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා උරුමයට එල්ල වී ඇති කාලීන අභියෝග හා මෙරට පුරාවිද්‍යා ආඥාපනතින් ඒවාට ගලපා ගත හැකි ප්‍රතිපාදන විමසා බැලීමත්, ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා උරුමයට එල්ල වී ඇති කාලීන අභියෝගවලට පිළියම් ලෙස ගත හැකි ක්‍රියාමාර්ග කීපයක් පිළිබඳ යෝජනා කිරීමත් අරමුණු ලෙස සඳහන් කළ හැක.

**ක්‍රමවේදය**

මෙහිදී පුස්තකාල පර්යේෂණ ක්‍රමවේදය මඟින් දත්ත රැස්කිරීමත්, පුරාවිද්‍යා ක්ෂේත්‍ර ආශ්‍රයෙන් රචනා වී ඇති කෘති ආශ්‍රයෙන් තොරතුරු රැස්කිරීමත්, කාලීන තොරතුරු ඉදිරිපත් වන පුවත්පත්හි සඳහන් පුරාවස්තු විනාශයන් පිළිබඳ තොරතුරු රැස්කිරීමත්, අන්තර්ජාලය භාවිතා කර අදාල තොරතුරු රැස්කිරීමත් ආදී ක්‍රම මඟින් දත්ත රැස්කර, එම දත්ත විශ්ලේෂණය කර, ප්‍රතිඵල විමසා, යෝජනා ඉදිරිපත් කිරීමේ ප්‍රවේශය භාවිතා කිරීමට බලාපොරොත්තු වේ.

**ප්‍රතිඵල**

පුරාවිද්‍යා උරුම කළමනාකරණය යටතේ පනතක් යනු කුමක්ද යන්න හඳුනාගත හැකි වීම, 1940 පුරාවිද්‍යා ආඥා පනත පිළිබඳ හොඳින් අවබෝධ කරගත හැකි වීම, ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා උරුමයට එල්ල වී ඇති කාලීන අභියෝග හා මෙරට පුරාවිද්‍යා ආඥාපනතින් ඒවාට ගලපා ගත හැකි ප්‍රතිපාදන මොනවාද යන්න හඳුනාගැනීම, ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා උරුමයට එල්ල වී ඇති කාලීන අභියෝගවලට පිළියම් ලෙස ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ යෝජනා සකස් කිරීම ආදිය මඟින් උරුම ආරක්ෂා කරගැනීමට යොමුකරවීම වැදගත්ය.

**සාකච්ඡාව**

මෑතකාලීනව ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා උරුමයට එල්ලවී ඇති අභියෝග දෙස බලන විට ප්‍රධාන වශයෙන් අභියෝගයන් කීපයක් පහත පරිදි හඳුනාගත හැකි වේ.

**නිධන් වස්තු සෙවීමට පුරාවස්තු විනාශ කිරීම**

පසුගිය කාලවල දී මෙන්ම මෑතකාලීනව ද පුරාවිද්‍යා උරුමයට එල්ල වී ඇති ප්‍රබල අභියෝගයක් ලෙසට මෙය හඳුනාගත හැකි වේ. මෙහිදී ප්‍රධාන වශයෙන් ම නිධන් සෙවීම සඳහා බුදු පිළිමවලට හානි කිරීම, දාගැබ්වලට හානි කිරීම සිදු කර ඇති ආකාරයක් හඳුනාගත හැකිය. බුදු පිළිමවලට සිදු කරන හානි දෙස අවධානය යොමු කරන විට බුදු පිළිමවල හිස හා පපු ප්‍රදේශය හැරීමට ලක්කර නිධන් වස්තු සෙවීම සිදු කර තිබෙන බව පෙනේ.



***ඡායාරූපය 01:** බුදු පිළිමවලට සිදුකරන හානි*

පුරාවිද්‍යා ආඥාපනතේ 31 වන වගන්තිය යටතේ මේ සඳහා ප්‍රතිපාදන සකස් කර තිබෙන බව පෙනේ. රජයේ ඉඩමක පිහිටි යම් ආරක්ෂිත ස්මාරකයක් හෝ පැරණි ස්මාරකයක් හෝ සිතාමතා ම විනාශ කරන, එයට හානිකරන, එය විරූපී කරන හෝ අයුතු ලෙස වෙනස් කරන හෝ යම් තැනැත්තන් පන්තියක් විසින් පූජනීය ලෙස හෝ ගෞරවාදරයෙන් හෝ සලකනු ලබන යම් පැරණි ස්මාරකයක් මත යම් ක්‍රියාවක් කරනු ලබන යම් තැනැත්තෙකු වරදකට වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු ඔහු වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසකට වඩා වැඩි නොවන දඩයකට හෝ දෙයාකාරයෙන් එක් ආකාරයකට එක අවුරුද්දකට නොවැඩි කාලයකට බන්ධනාගාර ගත කිරීම හෝ දඬුවම් දෙකටම ඔහු යටත් වන්නේය (31, 9 of 1940). යනුවෙන් එහි සඳහන් විය. 1998 සංශෝධනයෙන් දඩ මුදල රුපියල් 50,000 ක් දක්වා ද සිරගත කරන කාලය වසර දෙකකට නොඅඩු වසර පහකට නොවැඩි ද ලෙසට වෙනස් කළේය (6, 24 of 1998). 2005 වසරේ දී සිදුකරන සංශෝධනයෙන් මෙය දඩ මුදල රැපියල් 250,000 දක්වා වැඩි වූ අතර සිරගත කාලයේ වසර පහකට නොවැඩි ලෙස දක්වා තිබේ (5, 12 of 2005).

මෙම ප්‍රතිපාදනය එතරම් සාර්ථක වූ බවක් දැකගත නොහැකිය. ඒ නිසා පුරාවස්තු සොරකම මෙන්ම විනාශයන් රාශියක් සිදු වී ඇත. නමුත් වර්තමානය වන විට රුපියල් 250,000 යනු එතරම් විශාල මුදලක් නොවේ. අනෙක් අතට පුරාවස්තුවල වටිනාකම ඉතා ඉහළ නිසාවෙන් පුරාවස්තු සොරකම වැනි ක්‍රියාවලට යොමු වී නීතියේ රැහැනට හසු වුවහොත් එයට මුහුණ දීමට කැමති මිනිසුන් ද සිටී. මේ නිසා මෙම ප්‍රතිපාදනය තරමක් දුරට පුරාවස්තු විනාශය අවම කරලීමට සමත් වුව ද පුරාවස්තු විනාශය සම්පූර්ණයෙන් ම වළක්වා ගැනීමට තරම් ප්‍රමාණවත් නොවී ඇති බව පැහැදිලිව පෙනේ.

**පුරාවස්තු අනවසරයෙන් අපනයනය කිරීම**

මෙය ද මුල්කාලීනව සිටම මෙරට පුරාවිද්‍යා උරුමයට එල්ල වුන දැවැන්ත අභියෝගයකි. යටත් විජිත යුගයේ සිට ම මෙරට විවිධ පුරාවිද්‍යා උරුමයන්, පුරාවස්තූන් විදේශගත වී තිබේ. සාමාන්‍යයෙන් මෙරටින් හොර රහසේ ම විදේශ ගත වූවා යැයි සැලකිය හැකි පුරාවස්තු කීපයක් හඳුනාගෙන තිබේ.


පුරාවිද්‍යා ආඥා පනතේ 36 වන වගන්තියේ සඳහන් වන්නේ බලපත්‍රයක් රහිතව පුරාවස්තු අපනයනය කිරීම තහනම් බවයි. එමෙන්ම 37 වන වගන්තියේ 1 වන අනුවගන්තියට අනුව පුරාවස්තු අපනයනයේ දී පුරාවිද්‍යා කොමසාරිස්වරයාට

නියමිත වූ ආකෘති පත්‍රයක් මඟින් ඉදිරිපත් කළ යුතු අතර අපනයනය කිරීමට බලාපොරොත්තු වන පුරාවස්තු ලයිස්තුව ද එහි ඇතුළත් විය යුතු වන්නේය (37, 9 of 1940). 37 වන වගන්තියේ 2වන අනු වගන්තියට අනුව යම් ලෙසකට අපනයනය කිරීමට බලාපොරොත්තු වන යම් පුරාවස්තුවක් කොළඹ කෞතුකාගාරය සඳහා හෝ ශ්‍රී ලංකාවේ වෙනත් කෞතුකාගාරයක් සඳහා අත්කර ගත යුතුයි හෝ එම පුරා වස්තුව අන් කරුණක් නිසා අපනයනය සුදුසු නොවේ යයි පුරාවිද්‍යා කොමසාරිස්වරයා තීරණය කළහොත් ඒ අනුව 36 වන වගන්තියට අනුව බලපත්‍ර ප්‍රතික්ෂේප කිරීමට හැකිය. (37, 9 of 1940)

මේ ආකාරයට පුරාවස්තු අපනයනය කිරීම සම්බන්ධයෙන් පුරාවස්තු අපනයන සීමා කරලීමට නීති රීති, ප්‍රතිපාදන සලසා තිබුණ ද පුරාවස්තු හොර රහසේ විදේශගත වන බව දක්නට ලැබේ. මෙහිදී අපට දක්නට ලැබෙන්නේ පුරාවස්තු අනවසරයෙන් අපනයනය සීමා කරලීමට නීති තිබුණත් එය සිදුවන බවයි. එසේ නම් සිදුවී ඇත්තේ කුමක් ද යන්න සොයා බැලිය යුතුය. පුරාවස්තු අපනයන සීමා කිරීම සම්බන්ධයෙන් නීතිරීති පනවා තිබුණ ද මෙය සිදුවන්නේ රේගුව හරහා විය හැක. ඇතැම්විට රේගු නිලධාරීන්ගේ අතපසුවීමෙන් පුරාවස්තු රහසේ ම විදේශගත වීමට ඉඩ තිබේ. එමෙන්ම පුරාවිද්‍යා කොමසාරිස්වරයාගේ අතපසුවීමකින් වුව ද, ඉදිරිපත් කරන පුරාවස්තු ලැයිස්තුවලට අනුමැතිය ලබාදීම පුරාවස්තු විදේශගත වීමට ඉඩ තිබේ. මීට අමතරව 38 වන වගන්තියට අනුව පුරාවිද්‍යා කොමසාරිස්වරයා යම් බලපත්‍රයක් ප්‍රතික්ෂේප කළහොත් අගතියට පත් පාර්ශවයට පුරාවිද්‍යා කොමසාරිස්වරයාට විරුද්ධව අමාත්‍යවරයාට අභියාචනා කළ හැකිය (38, 9 of 1940). අමාත්‍යවරයාගේ තීරණය අවසාන හා තීරණාත්මක විය යුතු බව පුරාවිද්‍යා ආඥා පනතේ සඳහන් වේ. මේ නිසා අමාත්‍යවරයාගේ අතපසු වීම තුළින් ද පුරාවස්තු විදේශගත වීමට ඉඩ තිබේ. වර්තමානයේ සියල්ල මුදලට යටවී තිබෙන සමාජයක ඕනෑම දෙයක් සිදුවීමට ඉඩකඩ තිබෙන බව අපට පැහැදිලිව ම පෙනේ.

**පුරාවිද්‍යා ස්මාරක, පුරාවස්තු ආදියට හානි වන පරිදි සිදුවන මානව ක්‍රියාකාරකම්**

වර්තමානය වනවිට පුරාවිද්‍යා උරුමයට එල්ල වන ප්‍රබල තර්ජනයක් ලෙසට පුරාවිද්‍යා ස්මාරක, පුරාවස්තු ආදියට හානි වන පරිදි සිදුකරන ඉදිකිරීම්, සංවර්ධන ව්‍යාපෘති, පතල් කැණීම්, ගල් කැඩීම, ප්‍රතිසංස්කරණයන්, අලුත්වැඩියාවන් ආදිය හඳුනාගත හැකිය. මෙවැනි තත්ත්වයන් නිසාවෙන් ඓතිහාසික වටිනාකමකින් යුත් පුරාවිද්‍යාත්මක උරුමයන්ට, පුරාවස්තූන් ප්‍රබල ලෙස හානි සිදු වේ.



***ඡායාරූපය 02:** පුරාවස්තු වෙත හානි සිදුකළ අවස්ථාවකි.*

පුරාවිද්‍යා ආඥා පනතේ 43 වන වගන්තියේ (ආ) කොටසට අනුව යම් ඉදිකිරීමක් සිදු කිරීමට ප්‍රථමයෙන් පුරාවිද්‍යා කොමසාරිස්වරයාගේ අවසරය ඒ සඳහා ලබාගත යුතුය. එම ඉදිකිරීම සිදු කිරීමට පෙර පුරාවිද්‍යාත්මක තක්සේරුවක් සිදු කළ යුතු බව ද දැක්වේ. ඒ සඳහා අදාල සංවර්ධන ව්‍යාපෘතියට අනුග්‍රහයකයා විසින් එම ව්‍යාපෘති සඳහා යොදන මුදලින් 1% ක් වෙන් කළ යුතු බව දක්වා තිබේ (43A, 9 of 1940). මෙම තත්වය ඉතාමත් යහපත්ය. මේ නීතිය තුළ නව ව්‍යාපෘතියක් ඇරඹීමට පෙර අනිවාර්යෙන් ම පුරාවිද්‍යාත්මක බලපෑම් තක්සේරුවක් සිදු කිරීමට සිදුවේ. මෙය ශ්‍රී ලංකා පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ විශාල ජයග්‍රහණයක් ලෙස දැක්විය හැකි අතර පුරාවිද්‍යා ව්‍යාපෘති හරහා සිදුවන විනාශකාරී කටයුතු විධිමත් පාලනයක් සිදු වීමට ද මඟ පෑදෙන්නේ ය. මෙය පුරාවිද්‍යා උරුමයේ ආරක්ෂාව සඳහා ඉතාමත් යහපත් තත්ත්වයකි.

එසේම 32 වන වගන්තියේ (අ) කොටසේ දැක්වෙන පරිදි පුරාවිද්‍යා කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලැබූ අවසර පත්‍රයක අධිකාරිය යටතේ ඇතුළත් වූ ගිවිසුමක් අනුව හැර යම් යම් ආරක්ෂිත ස්මාරකයක් ප්‍රතිසංස්කරණය කිරීමේ, අලුත්වැඩියා කිරීමේ, වෙනස් කිරීමේ හෝ අතිරේකව ඉදිකිරීමේ යම් කාර්යයක් කිසිම තැනැත්තකු විසින් ආරම්භ කිරීම හෝ කරගෙන යෑම නොකළ යුතුය (32, 9 of 1940). මේ නිසා ප්‍රතිසංස්කරණ හා අළුත්වැඩියා මඟින් පුරාවිද්‍යා ස්මාරක වලට හෝ පුරාවස්තු වලට සිදුවන විනාශය යම් තරමක් දුරට අහෝසි වීම සිදුවේ. තවද මෙහි ප්‍රතිපාදන අනුව රජයේ ඉඩමක පිහිටි පැරණි ස්මාරකයක් හෝ

යම් ආරක්ෂිත ස්මාරකයක් ඔබ්බෙහි නියමිත දුර ප්‍රමාණයක් ඇතුළත යම් ගොඩනැගිලි ඉදිකිරීමේ, පතල් කැණීමේ, ගල් කැඩීමේ හෝ පිරවීමේ කටයුතු නොකළ යුතු බව දක්වා ඇති අතර එම නියෝග කඩ කරන්නන් හට සංශෝධිත දඩයත්, සිරදඬුවමත් අයත් වන බව දක්වා තිබේ. මේ නිසාවෙන් පුරාවිද්‍යා ස්ථාන ආශ්‍රිතව ගල් කොරි පවත්වා ගෙන යාම, පතල් කැණීම, ඉදිකිරීම් සිදු කිරීම ආදිය තහනම් කර තිබේ. මෙය ද කාලීන වශයෙන් පැන නැගී ඇති මෙම අභියෝගය උදෙසා එය වැළැක්වීමට ගනු ලැබූ වැදගත් ක්‍රියාමාර්ගයකි.

33 වන වගන්තියට අනුව පුරාවිද්‍යාත්මක ප්‍රදේශ පිළිබඳව දක්වා තිබේ. ඉඩම් කොමසාරිස්ගේ හෝ ඉඩම්භාර විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය යටතේ පුරාවිද්‍යා කොමසාරිස්ට යම් ඉඩමක් පුරාවිද්‍යා ප්‍රදේශ ලෙස ගැසට් කළ හැක (33, 9 of 1940). එම ප්‍රදේශයේ පුරාවස්තුන්ට හානි වන ලෙස කිසිදු ක්‍රියාවක් කළ නොහැකි බව 34 වන වගන්තියේ දැක්වේ. මෙහිදී දක්වා ඇති වැරදි කඩ කරන්නෙකුට 31 වන වගන්තියට අනුව දඩය හා දඬුවම් විඳීමට සිදුවේ (34, 9 of 1940).

**නීති රීතිවල අඩුපාඩු**

ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා උරුමයට එල්ල වී තිබෙන තවත් කාලීන අභියෝගයක් ලෙසට නීති රීතිවල තිබෙන අඩුපාඩු, දුර්වලතා ප්‍රයෝජනයට ගෙන නීති රීතිවල හිඩැස්වලින් රිංගා යෑම දැකගත හැකිය.

විශේෂයෙන් ම පුරාවිද්‍යා ආඥා පනත තුළ පුරාවස්තුවලට සමාන ආදේශක භාණ්ඩ නිපදවීම තහනම් කර ඇති බව පෙනේ. ඒ පුරාවස්තු වලට 100%ක් ම සමාන ආදේශක භාණ්ඩයන් ය. නමුත් 100% ක් සමාන නොවන ආදේශක භාණ්ඩ නිපදවීම තහනම් කර නැත. මේ නිසා වර්තමානයේ තාක්ෂණයේ දියුණුවත් සමඟ පුරාවස්තුවලට සමාන ලෙස ආදේශක භාණ්ඩ නිර්මාණය කර ආදේශක භාණ්ඩ වලට මුවාවී පුරාවස්තු සොරකම් කිරීම මෙන්ම ආදේශක භාණ්ඩ සහ පුරා වස්තු මාරු කිරීම සිදුවන ආකාරයක ප්‍රවණතාවක් වර්තමානයේ දී හඳුනාගත හැකිවේ. මේ සඳහා ගත හැකි ක්‍රියාමාර්ග කිසිවක් පුරාවිද්‍යා ආඥා පනත තුළ දක්නට නොමැති වීම කණගාටුවට කරුණකි. ඒ නිසා කෙතරම් නීති රීති, ප්‍රතිපාදන තිබුණ ද අඩුපාඩු ඇති අවස්ථා වලින් රිංගා යෑමට හැකියාවක් තිබේ.

තවද ඇතැම් නීති රීති වලට අවසාන බලයක් නොපැවරෙන තවත් නීති රීති පුරාවිද්‍යා ආඥා පනත තුළ ම දැකගත හැකිවීම ද නීති රීතිවල දක්නට ලැබෙන ප්‍රබල අඩුපාඩුවකි. 37 වන වගන්තියේ 2 වන අනුවගන්තියට අනුව යම්

පුරාවස්තුවක් අපනයනය කිරීම යෝග්‍ය නොවේ යැයි පුරාවිද්‍යා කොමසාරිස්වරයා අදහස් කරන්නේ නම් එම පුරාවස්තුව අපනයනය කිරීමට අදාල බලපත්‍රය ප්‍රතික්ෂේප කළ හැකිය (37, 9 of 1940). නමුත් 38 වන වගන්තියට අනුව මෙසේ ප්‍රතික්ෂේප කිරීමෙන් අගතියට පත් පාර්ශවයට අදාල විෂයභාර අමාත්‍යවරයා වෙත පුරාවිද්‍යා කොමසාරිස්ට එරෙහිව අභියාචනය කළ හැකි අතර අමාත්‍යවරයාගේ තීරණය අවසාන හා තීරණාත්මක බව දක්වා තිබේ (38, 9 of 1940). මේ තුළ සිදුවන්නේ ගැටලුවක් නිර්මාණය වීමයි. එනම් පුරාවිද්‍යා කොමසාරිස්වරයා සතු තීරණ ගැනීමේ බලයට අමාත්‍යවරයාගේ තීරණ ගැනීමේ හැකියාව තුළ බලපෑමක් එල්ල වී තිබීමයි. මෙසේ නීති රීති වල ඇති අඩුපාඩු තුළින් පුරාවස්තූන් ට එල්ල වන කාලීන අභියෝගයන් තුළ එම අභියෝගවලට නිසි පිළියමක් නොලැබී ඇති බව පෙනේ.

**වාර්තාකරණයේ දුර්වලතා**

වර්තමානයේ දැකගත හැකි පුරාවිද්‍යා උරුමයට එල්ල වී ඇති තවත් කාලීන අභියෝගයක් ලෙසට වාර්තා කිරීමේ දුර්වලතාව හඳුනාගත හැකිය. සාමාන්‍යයෙන් මෙරට තුළ පුරාවිද්‍යාත්මක ස්ථාන ලක්ෂයකට ආසන්න ප්‍රමාණයක් ඇතැයි සලකනු ලැබේ. නමුත් මේ වන විට ඒවායින් වාර්තාගත වී ඇති 25,000 තරම් අඩු සංඛ්‍යාවකි. ඒ වාර්තාකරණයේ දුර්වලතාවය නිසාය. මේ නිසාවෙන් සිදු වන්නේ මෙරට වාර්තා නොවූ පුරාවිද්‍යා ස්ථාන අභාවයට යාම හා විනාශයට පත් වීමයි. ඒවා වාර්තාගත වී තිබුණේ නම් එම ස්ථාන පිළිබඳ සොයා බැලීමට හෝ තිබුණි.

නමුත් මෙරට පුරාවිද්‍යා ආඥා පනත දෙස අවධානය යොමු කරන විට 40 වන වගන්තියේ 2 වන අනුවගන්තියට අනුව පැරණි ස්මාරක වල ලේඛණයක් සකස් කිරීම පුරාවිද්‍යා කොමසාරිස්වරයාගේ ප්‍රමුඛ කාර්යභාරයක් වේ. 40 වන වගන්තියේ 3 වන අනුවගන්තියට අනුව මෙසේ ලේඛණයක් සකස් කරනු ලබන්නේ පුරාවස්තුවල ආරක්ෂාව හා නඩත්තුව උදෙසාය (40, 9 of 1940). පුරාවිද්‍යා ස්ථාන, පුරාවස්තු ආදිය පිළිබඳ ලේඛණයක් තිබේ නම් යම් ඉදිකිරීමක් සිදුකිරීමට යන ප්‍රදේශයේ යම් පුරාවස්තුවක් තිබේ නම් එම පුරාවස්තුවට නව ඉදිකිරීමෙන් හානි සිදුවන්නේ දැයි සොයා බලා එම ඉදිකිරීම නැවැත්විය හැකිය. තව ද නොදැනුවත්කමින් හෝ සිදුවන පුරාවස්තු විනාශයන් අවම කර ගත හැකිය. එමෙන්ම පුරාවස්තු නිසි ලෙස නඩත්තු කිරීමට ද හැකිය. නමුත් ගැටලුව වන්නේ මේ වන තෙක් ම එවැනි ලැයිස්තුවක් නිර්මාණය වී නොතිබීමයි. 2012 වසරේ දෙසැම්බර් මාසයේ දී පුරාවස්තු ආරක්ෂිත ස්මාරක ලේඛනයක් සකස් කර ඇති බව

පෙනේ. නමුත් මෙම ලේඛනය තුළ ද ශ්‍රී ලංකාවේ සියළුම පුරාවිද්‍යාත්මක ස්ථාන පිළිබඳ අන්තර්ගත වී නොමැත.

තවද කැණීමක් සිදු කිරීමේ දී හමුවන පුරාවස්තු ආදිය පිළිබඳව වාර්තා කිරීම ඉතා වැදගත්ය. ජාත්‍යන්තරය පිළිගත් ක්‍රමවේදයට අනුව ද කැණීමකින් හමුවූ දත්ත සියල්ල වාර්තාගත කළ යුතුය. නමුත් මෙරට කැණීම් කිරීමේ දී හමුවන සියලුම දත්ත, පුරාවස්තු ආදිය පිළිබඳව නිසි පරිදි වාර්තා කරනවා ද යන්න සැක සහිතය. මෙය ද කාලීන වශයෙන් එල්ල වී ඇති ප්‍රබල අභියෝගයකි. පුරාවිද්‍යා ආඥා පනතේ 10 වන වගන්තියට අනුව කැණීම්වල දී හමු වූ පුරාවස්තු පිළිබඳ පුරාවිද්‍යා කොමසාරිස්ට ඉක්මණින් වාර්තා සහිත ව දැනුවත් කළ යුත්තා සේම කැණීමේ දී හමුවූ සියළුම පුරාවස්තු පිළිබඳ නියමිත වූ වාර්තාමය ආකෘතියක් තිබිය යුතුය (10, 9 of 1940). නමුත් මෙය සත්‍ය වශයෙන් 100% ක්ම ඒ ආකාරයෙන් සිදු වන්නේ නැත. බොහෝවිට පුරාවස්තු අස්ථානගත වීම සිදුවේ.

කෙසේ වෙතත් මේ ආකාරයට පුරාවස්තු හා පුරාවිද්‍යාත්මක ස්ථාන පිළිබඳ ලේඛණයක් සකස් කර නොමැති වීම ප්‍රබල කාලීන අභියෝගයක් ලෙස හඳුනා ගත හැකි වුව ද පුරාවිද්‍යා කැණීමකින් හමුවුනු දත්ත, පුරාවස්තු ආදිය පිළිබඳව වාර්තාගත කිරීමට ප්‍රතිපාදන නීතිරීති පනවා ඇති හෙයින් පුරාවස්තුවල සුරක්ෂිතභාවය යම් තරමක් දුරට තහවුරු වී ඇති බව පෙනේ. පුරාවස්තු හා පුරාවිද්‍යා ස්ථාන පිළිබඳව නිසි පරිදි ලේඛණයක් පිළියෙල වී පවතින්නේ නම් එය ඉදිරි අනාගතයට ඉතා වැදගත් වනු නොඅනුමානය.

**දේශපාලන අතපෙවීම්**

මෙරට තුළ පුරාවිද්‍යා උරුමයට එල්ලවී තිබෙන තවත් කාලීන අභියෝගයක් ලෙස හඳුනාගත හැකි තත්ත්වයක් නම් දේශපාලන හස්තයන්ගේ ක්‍රියාකාරිත්වයයි. බොහෝ පුරාවස්තු මංකොල්ලයන් පිටුපස සිටින්නේ දේශපාලන බලවතුන් බවට බොහෝ දෙනාගේ අදහස වේ. ඔවුන්ගේ ධනය මෙන්ම බලය ද යොදවා මෙම ක්‍රියාවන්හි නිරත වන ආකාරයක් හඳුනාගත හැකිය. ඇතැම් දේශපාලන හස්තයන් මගින් අදිසි බලවේග ලෙස සංවර්ධන කාර්යයන්ට මුවා වෙමින් පුරාවස්තු සොරකමෙහි නිරත වී තිබේ. පසුගිය වසර කිහිපය දෙස අවධානය යොමු කරන විට මෙම තත්වය පැහැදිලිව ම හඳුනාගත හැකිය. ධන නිධානයන් පවතී යැයි අනුමාන කරන ස්ථානයන් ඉලක්කගත කර ගනිමින් සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කිරීමද සිදු කරයි. මෙවැනි අවස්ථා රැසක් පිළිබඳව තොරතුරු රාශියක් ජාතික පුවත්පත් වල බොහෝ අවස්ථාවල දී ඉදිරිපත් වන ආකාරයක් හඳුනාගත හැකි වේ.

මෙකී තත්ත්වය සම්බන්ධයෙන් පුරාවිද්‍යා ආඥාපනත දෙස අවධානය යොමු කරන විට 12 වන වගන්තියේ දැක්වෙන ලෙසට කිසිවෙකුට පුරාවස්තු කැණීම ආදිය පුරාවිද්‍යා කොමසාරිස්වරයාගේ අවසරයකින් තොරව සිදු කල නොහැකිය (12, 9 of 1940). යම්කිසි කැණීමක් සිදු කිරීමට නම් පුරාවිද්‍යා කොමසාරිස්වරයාගේ අවසරය අනිවාර්යයෙන් ම අවශ්‍ය වේ. නමුත් දේශපාලන හස්තයන්ගේ බලපෑම මත පුරාවිද්‍යා කොමසාරිස්වරයාගේ අවසරය ලබාගෙන පුරාවස්තු කැණීම් ආදී කටයුතුවල නිරත විය හැකි බව පෙනේ. කෙසේ වෙතත් 12 වන වගන්තියේ 2 වන අනුවගන්තියට අනුව ද අමාත්‍යවරයාගේ තීරණය අවසාන හා තීරණාත්මක විය යුතුය (40, 9 of 1940). මින් සිදුවන්නේ පුරාවිද්‍යා කොමසාරිස්වරයාගේ තීරණයට දේශපාලන ක්ෂේත්‍රය තුළින් අභියෝගයක් එල්ල වී තිබීම බව පැහැදිලිය.

තවද 36 වන වගන්තියට අනුව බලපත්‍රයකින් තොරව පුරාවස්තු අපනයනය තහනම් වේ. මෙම බලපත්‍රය ලබාදෙන්නේ පුරාවිද්‍යා කොමසාරිස්වරයාය (36, 9 of 1940). 37 වගන්තියේ 2 වන අනුවගන්තියට අනුව අපනයනය කිරීමට බලාපොරොත්තු වන පුරාවස්තු ලැයිස්තුව දෙස අධීක්ෂණය කිරීමෙන් අනතුරුව මෙම පුරාවස්තු කොළඹ කෞතුකාගාරයට හෝ ශ්‍රී ලංකාවේ වෙනත් කෞතුකාගාරයකට අත් කරගත යුතු බව හෝ වෙනත් හේතුවක් නිසා අපනයනය කිරීම සඳහා යෝග්‍ය නොවේ යයි පුරාවිද්‍යා කොසාරිස්වරයාට හැඟී යන්නේ නම් එම බලපත්‍රය ප්‍රතික්ෂේප කළ හැකිය (37, 9 of 1940). නමුත් 38 වගන්තියේ 1 වන අනුවගන්තිය අනුව මෙම ප්‍රතික්ෂේප කිරීමෙන් අගතියට පත් පාර්ශ්වයට පුරාවිද්‍යා කොමසාරිස්වරයාට එරෙහිව අමාත්‍යවරයාට අභියාචනා කළ හැකිය. 38 වගන්තියේ 2 වන අනුවගන්තියට අනුව අභියාචනයක් මත අමාත්‍යවරයාගේ තීරණය අවසාන හා තීරණාත්මක විය යුතුය (38, 9 of 1940). මෙහිදී ද සිදුවී ඇත්තේ පුරාවස්තු අපනයනය සම්බන්ධව පුරාවිද්‍යා කොමසාරිස්වරයාට ස්වාධීන තීරණයක් ගත නොහැකි වී තිබීමයි. එනම් අමාත්‍යවරයාගේ තීරණය අවසාන හා තීරණාත්මක වන නිසාය.

### පැරණි භාණ්ඩ අලෙවි කරන මුවාවෙන් පුරාවස්තු අලෙවිය

වර්තමානය වන විට හඳුනාගත හැකි තවත් කාලීන ගැටලුවක් ලෙස පැරණි භාණ්ඩ අලෙවි කරන මුවාවෙන් පුරාවස්තු අලෙවි කිරීම හඳුනාගත හැකිය. මෙරට නීතියට අනුව පැරණි භාණ්ඩ අලෙවි කිරීම තහනම් නැත. ශ්‍රී ලංකාව තුළ වැඩිම සංචාරක ආකර්ශනයක් දිනාගෙන ඇති මෙන්ම වැඩිම සංස්කෘතික උරුමයන් හා පුරාවස්තු ප්‍රමාණයක් දක්නට ලැබෙන අනුරාධපුරය, පොළොන්නරුව වැනි නගර මෙන්ම

මහනුවර වැනි ප්‍රධාන නගරවල පැරණි භාණ්ඩ අලෙවිසැල් මහා පරිමාණයෙන් ක්‍රියාත්මක වන බව පෙනේ. ඒවා තුළ පැරණි භාණ්ඩ සමඟ පුරාවස්තු ද අලෙවි වීමට බොහෝ දුරට ඉඩකඩ තිබේ.

මේ ගැටලුව දෙස අවධානය යොමු කරන විට ශ්‍රී ලංකාවේ පුරාවස්තු ආඥාපනත තුළ මේ සඳහා ප්‍රතිපාදන නොමැති බව පෙනේ. පැරණි භාණ්ඩ අලෙවිසැල් පරීක්ෂා කිරීම වැනි තත්වයන් සඳහා ප්‍රතිපාදන ද දක්නට නැත. දේශීය වශයෙන් පැරණි භාණ්ඩ අලෙවි සැල් පවත්වාගෙන යන්නේ බොහෝවිට දේශපාලන බලයත් සමඟ සහයෝගයෙනි. ඉතා ප්‍රසිද්ධියක් මේ වෙළෙඳසල් සඳහා හිමි වී තිබේ. දේශපාලන හස්තයන්ගේ ප්‍රබලතාවය කෙතරම් ද කිවහොත් පොලීසියේ හෝ පුරාවිද්‍යා දෙපාර්තමේන්තු නිලධාරීන්ට මෙම අලෙවිසැල් පිරික්සීමට තරම් ප්‍රායෝගික බලයක් නොමැති තරම්ය. මෙකී තත්ත්වය හමුවේ කෙතරම් නීති රීති තිබුණ ද පුරාවිද්‍යා උරුමයට මෙවැනි අංශවලින් අභියෝග එල්ල වී ඇති බව පෙනේ. මේ නිසා පැරණි භාණ්ඩ අලෙවි කිරීමේ මුවාවෙන් පුරාවස්තු අලෙවි කිරීම යන කාලීන අභියෝගයට පුරාවිද්‍යා ආඥා පනතේ ඇති ප්‍රතිපාදන මඟින් මෙරට පුරාවිද්‍යා උරුමය සුරක්ෂිත වී නොමැති බව පෙනේ.

**විවිධ ආගමික අන්තවාදීන් නිසා පුරා වස්තූන් වලට හානි සිදුවීම**

විශේෂයෙන් ම මෙරට පවතින බෞද්ධ සංස්කෘතියට අයත් පුරාවිද්‍යාත්මක උරුමවලට හානි පමුණුවන වෙනත් ආගම්වලට අයත් අන්තවාදීන්ගේ ක්‍රියාකාරකම් ද වර්තමානය වන විට කාලීන අභියෝගයක් බවට පත්ව තිබේ. විශේෂයෙන් ම සංවිධානාත්මක ලෙසින් ඔවුන් ක්‍රියාත්මක වන බව දැකගත හැකිය. මෙම තත්වය 90 දශකයේ පමණ සිට පැවත ගෙන එන්නක් බව දක්නට හැක.

තවත් බොහෝ අයගේ විශ්වාසයට අනුව මේවා ක්‍රියාත්මක වන්නේ මේ රටේ සිංහල බෞද්ධයන්ට එරෙහිව සංවිධානාත්මක ව්‍යාපාරයක් ලෙසින් බවයි. මෙම සැකයට හේතු සාධාරණය. 1992 දී හෙළ බොදු උරුමය නමින් ග්‍රන්ථයක් ප්‍රකාශයට පත්කළ එල්ලාවල මේධානන්ද හිමියෝ උතුරු-නැගෙනහිර පළාත් වල පමණක් පැරණි බෞද්ධ සිද්ධස්ථාන 296 තිබුණු බව සඳහන් කරන අතර ඉන් 90% ක් මේ වන විට විනාශ පවතී (හැන්සාඩ් වාර්තාව 1998 සැප් 22). මෙම තත්වය වර්තමානය වන විට යම් ලෙසකින් වර්ධනය වී ඇති බව පෙනේ. විශේෂයෙන් ම උතුරු නැගෙනහිර දෙමළ ත්‍රස්තවාදය පැවැති සමයේ බොහෝ සංස්කෘතික උරුම විනාශයට පත්ව තිබේ. මෙකී තත්වයන්ට එරෙහිව පුරාවිද්‍යා ආඥා පනතේ ප්‍රතිපාදනයන් අන්තර්ගත වුවද එම කාලය තුළ පැවැති තර්ජන හමුවේ ඒවා එම ප්‍රදේශවල ක්‍රියාත්මක කරලීම ප්‍රායෝගික නොවීය.




*ඡායාරූපය 03: සංස්කෘතික උරුම විනාශය*

ඇෆ්ගනිස්තානය, පාකිස්තානය, ඉන්දුනීසියාව ආදී රටවල්වල බෞද්ධ සංකේතයන් සංවිධානාත්මකව වැනසීමේ ව්‍යාපාර ක්‍රියාත්මක වේ. මෙවැනි ව්‍යාපාර මෙරට තුළ ද ක්‍රියාත්මක වනනේ නැතැයි කිව නොහැකිය. මෙම තත්ත්වය හමුවේ මෙරට පුරාවිද්‍යා උරුමයට තර්ජනයක් එල්ල වී තිබෙන අතර එම අභියෝගයට මුහුණ දී පුරාවිද්‍යා උරුමයන් සුරක්ෂිත කරගැනීමේ කාර්ය තවමත් ප්‍රමාද වී තිබේ.

**රාජ්‍ය සේවයේ නිරත ඇතැම් නිලධාරීන්ගේ දූෂණ හා අක්‍රමිකතා**

මෙරට පුරාවිද්‍යා උරුමයට එල්ල වී තිබෙන තවත් කාලීන අභියෝගයක් නම් රාජ්‍ය සේවයේ නිරත ඇතැම් නිලධාරීන්ගේ වංචා හා දූෂණ ක්‍රියාවන්ය. මේ පිළිබඳ නිදසුන් ඕනෑ තරම් පුවත්පත් හා මාධ්‍ය මගින් පළවනු දැකගත හැකි වේ,

මෙම තත්වය දෙස අවධානය යොමු කරන විට පුරාවිද්‍යා ආඥා පනත මගින් යොදා ඇති විධිවිධාන දෙස අවධානය යොමු කරන විට  පනතේ 31 වන වගන්තියට අනුව මෙම වැරදි සඳහා දඬුවම් ආදිය දක්වා තිබෙන ආකාරය ඉහත දී පෙන්වා දුනි. නමුත් රාජ්‍ය සේවකයින් මෙවැනි පුරාවස්තු විනාශයන් වල නිරත වූ විට රාජ්‍ය සේවකයින් ලෙස ඔවුන්ගේ සේවය අත්හිටුවීම වැනි ප්‍රතිපාදන මෙම පුරාවිද්‍යා ආඥා පනත මඟින් යොදා නැති බව පෙනේ. තවද පුරාවස්තු සොරකම් හා විනාශයන්වල නිරත වූ පුද්ගලයින් නීතියේ රැහැනට හසු වූ විට ඒ පුද්ගලයන් පිළිබඳව රාජ්‍ය නිළධාරීන්ගේ ක්‍රියාකාරීත්වය කෙතරම් දුරට නීතියට අනුකූලව සිදු වන්නේද යන්න පිළිබඳව 100% ක් සහතික විය නොහැකිය. මෙම තත්වයන් දෙස අවධානය යොමු කරන විට රාජ්‍ය සේවයේ නිරත ඇතැම් නිලධාරීන්ගේ දූෂණ හා

අක්‍රමිකතා හමුවේ පුරාවිද්‍යා ආඥා පනත මගින් යොදා ඇති විධිවිධාන මඟින් මෙරට පුරාවිද්‍යා උරුමයේ සුරක්ෂිතභාවයට යම් තර්ජනයක් එල්ල වී ඇති බව පෙනේ.

මේ ආදී ලෙසට ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා උරුමය ට එල්ල වී ඇති කාලීන අභියෝග හා 1940 පුරාවිද්‍යා ආඥාපනතින් ඒවාට ගලපා ගත හැකි ප්‍රතිපාදන මොනවාද යන්න හඳුනාගත හැකිය.

## නිගමනය

ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා උරුමයේ විනාශය පිළිබඳ අතීතය දෙස අවධානය යොමු කරන විට එම කටයුතු වැළැක්වීම සඳහා මුලින්ම නීතියක් 1887 දී මෙරට නිධන් වස්තු සම්බන්ධව ගෙනැවිත් තිබේ. නමුත් ඒ තුළ මෙරට පුරා වස්තු සුරක්ෂිත කිරීම පිළිබඳ අර්ථ විග්‍රහයක් සිදු නොවුන නිසා මෙම නීතිය එතරම් වැදගත් එකක් නොවුණි. ඉන් අනතුරුව පුරාවස්තු ආරක්ෂා කිරීම සඳහා මුල් කාලීන අභියෝගය මත ක්‍රි.ව 1940 දී පුරාවිද්‍යා ආඥා පනත ගෙන එන ලදී. මෙයින් පුරාවිද්‍යා උරුමයන් හා පුරාවස්තු වලට එල්ල වී ඇති අභියෝගයන් වලට මුහුණ දීම සඳහා ද අකටයුතුකම් වැළැක්වීම සඳහා ද ප්‍රතිපාදනයන් රාශියක් ගෙනැවිත් තිබේ. එම ප්‍රතිපාදනයන් යම් යම් කාල වල වැදගත් වුවද ඇතැම් කාලෙකට මේවා බලාත්මකභාවය ප්‍රමාණවත් නොවුනු බව පෙනේ. ශ්‍රී ලංකාවේ වර්තමාන පුරාවිද්‍යා භූමිය දෙස අවධානය යොමු කරන විට කාලීන අභියෝගයන් රාශියක් එයට එල්ල වී ඇති බව පෙනේ. ඒ අතර ධන නිධානයන් සෙවීම සඳහා පුරාවස්තු වලට හානි කිරීම, පුරාවස්තු අනවසරයෙන් අපනයනය කිරීම, විවිධ සංවර්ධන ව්‍යාපෘති හරහා පුරාවිද්‍යා ස්මාරක පුරාවස්තු ආදියට හානි වන පරිදි කටයුතු සිදුවීම, නීති රීතිවල අඩුපාඩු, වාර්තාකරණයේ දුර්වලතා, දේශපාලන අතපෙවීම්, ආදිය ප්‍රධාන වශයෙන් හඳුනාගත හැකිය. මෙම තත්වයන් දෙස අවධානය යොමු කිරීමේ දී මෙයට පිළියම් වශයෙන් පුරාවිද්‍යා ආඥාපනතින් ගෙන ඇති ප්‍රතිපාදනයන් මොනවාදැයි විමසා බැලිය හැකිය.

එසේ විමසා බැලීමේදී අපට පැහැදිලිවම දිස්වන්නේ පුරාවිද්‍යා ආඥා පනතෙහි ඇති ප්‍රතිපාදන මගින් මෙරට පුරාවිද්‍යා උරුමයන් කාලීන අභියෝග හමුවේ යම් තරමක් දුරට සුරක්ෂිත වී ඇති බවයි. නමුත් ගැටලුව වන්නේ ඇතැම් කාලීන අභියෝගයන් සඳහා පුරාවිද්‍යා ආඥාපනතින් ඇති ප්‍රතිපාදන ප්‍රමාණවත් නොමැත. එමෙන්ම ඇතැම් නීති රීතිවල අඩුපාඩුත් දක්නට ලැබේ. ඒ නිසා එම පුරාවිද්‍යා උරුමයන්ට සහ පුරාවස්තුන් ට යම් යම් හානි සිදුවේ. කෙසේ වෙතත් මෙරට පුරාවිද්‍යා ආඥා පනත මගින් මෙරට පුරාවිද්‍යා උරුමයන් හා පුරාවස්තුන්ට එල්ල වී ඇති කාලීන

අභියෝගයන් හමුවේ මෙරට පුරා වස්තූන් යම් තරමක් දුරට සුරක්ෂිත වී ඇති බව පෙනේ. මෙහිදී පුරාවිද්‍යා ආඥා පනත පමණක් නොව සංස්කෘතික දේපළ පනත, නාගරික සංවර්ධන පනත ආදී වෙනත් අවස්ථා තුළින් ද මෙකී කර්තව්‍යයට සහයක් ලැබී ඇති බව පෙනේ. නමුත් තවමත් නොවිසඳුනු, පිළියම් නොයෙදුණු පුරාවිද්‍යා උරුමයන්ට එල්ල වූ කාලීන අභියෝග කිසියම් ප්‍රමාණයක් පවතින බව පැහැදිලිය. මෙම අභියෝග සාර්ථක ලෙස ජයගැනීම සඳහා කාලීන වැඩපිළිවෙලක අවශ්‍යතාව නූතනය වන විට වැඩි වශයෙන් ඉදිරිපත් වී අති බව පැහැදිලිව ම පෙනේ.

**නිර්දේශ**

- වටිනා පුරාවස්තු අතපසුවීමකින් හෝ විදේශගතවීම වළක්වා ගැනීමට පියවර යෙදීම.
- අදාළ ආයතන විසින් සිදුකරන පරීක්ෂණයන්හි වාර්තාවන් ඉතා ඉක්මණින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට වාර්තාගත කිරීම සඳහා ප්‍රතිපාදන සකස් කරලීම.
- පුරාවස්තුවලට ආදේශක නිපදවීම සීමා කිරීම.
- පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හා පොලීසිය නිරන්තරව පැරණි භාණ්ඩ අලෙවි කරන වෙළෙඳසැල් පරික්ෂා කිරීම.
- පුරාවස්තු සොරකම හා විනාශයට අදාල දඩුවම් තවත් වැඩි කිරීම.
- මෙරට පුරාවිද්‍යාත්මක ස්මාරක හා ස්ථාන වාර්තාගත කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කිරීම.
- පුරාවස්තුවල ඇති වැදගත්කම, ඒවා රැකගත යුත්තේ ඇයි ආදිය පිළිබඳව මෙන්ම පුරාවිද්‍යා ආඥා පනතෙහි ප්‍රතිපාදන ආදිය පිළිබඳව ද ප්‍රාදේශීය මට්ටමේ සිට ජනතාව දැනුවත් කර ඔවුන් තුළ ධනාත්මක ආකල්පයක් ගොඩනැගීමට විධිමත් වැඩපිලිවෙලක් ඇරඹීම.
- පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තීරණවලට බලපෑමක් කිරීමට අමාත්‍යවරයාට ඇති බලය සීමා කළ යුතු අතර පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයාට උපදෙස් දීම සඳහා උපදේශක මණ්ඩලයක් පිහිටුවීම.
- පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව කිසිවෙකුගේ බලපෑමට යටත් නොවන ස්වාධීන දෙපාර්තමේන්තුවක් ලෙස පිහිටුවීම.

- පුරාවස්තු විනාශය අවම කිරීමට සහය වන්නන් හට තෑගි ලබා දීමට පුරාවස්තු ආඥා පනත මඟින් පිහිටුවා තිබෙන අරමුදල පිළිබඳවත්, අරමුදලින් ලබා දෙන තෑගි පිළිබඳවත් ජනතාව දැනුවත් කරමින් පුරාවස්තු විනාශයන් අවම කර ගැනීම සඳහා ජනතාවගේ සහභාගීත්වය ලබා ගැනීම.
- පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව තුළ තිබෙන පොලිස් ඒකකය හා ඔවුන්ගේ සේවාව විධිමත් කිරීම සහ එම ග්‍රාමීය පන්සල් සමග සම්බන්ධතාවක් ඇති කිරීමට කටයුතු කිරීම.
- ගමක පවතින ස්වේච්ඡා සංවිධාන සමිති සමාගම්වල සහය ලබාගනිමින් ගම් මට්ටමින් එහි ජාතික උරුමය රැකගැනීම සඳහා අවධානය යොමු කිරීම.
- පුරාවිද්‍යා දැනුමක් තිබෙන උපාධිධාරීන්ගේ සේවාව රේගුවට ලබාගැනීම.
- සංස්කෘතික ස්ථාන මාර්ගෝපදේශයට ඉතිහාස, පුරාවිද්‍යා, සංචාරක හා සංස්කෘතික සම්පත් කළමනාකරණ වැනි උපාධිධාරීන් බඳවා ගැනීම.
- පාසල්වල ඉතිහාසය විෂය විධිමත් කර පුරාවස්තු කළමනාකරණය නමින් පාඨමාලාවක් හඳුන්වා දීම.

## ස්තුතිය

මෙම ලිපිය සම්පාදනය කිරීමට උපකාර කළ සියලු දෙනාටමත්, මා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දී අධ්‍යයනය කළ පුරාවිද්‍යා අධ්‍යයන අංශයේ උරුම කළමනාකරණය පාඨමාලවේ දේශක ආචාර්ය අරුණ රාජපක්ෂ මහතාටත්, දැනට මා අධ්‍යයන කටයුතුවල යෙදෙන පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉතිහාස අධ්‍යයන අංශයේ සියලුම ආචාර්ය මණ්ඩලයටත්, කැළණිය විශ්වවිද්‍යාලයේ උරුම අධ්‍යයන කේන්ද්‍රයෙහි ආචාර්ය මණ්ඩලයටත්, යුගතර ශාස්ත්‍රීය සංග්‍රහය තෙවන වෙළුමෙහි සංස්කාරක මණ්ඩලයටත් මාගේ කෘතඥතාවය පිරිනමමි.

## ආශ්‍රිත ග්‍රන්ථ

රාජපක්ෂ, අරුණ. (2000). "අනාගත පරපුරින් අතීත උරුමය සොරා ගැනීමේ ප්‍රවණතාව : ගැටළු සහ අභියෝග (90 දශකයේ පුරාවස්තු විනාශය හා සොරකම් ඇසුරින් කෙරෙන විමසුමකි.)" **වැලිපිළ පුරාවිද්‍යාව සගරාව : සිව්වැනි කලාපය**, සංස්. අරුණ රාජපක්ෂ සහ පී. පී සමින්ද කුමාර, කොළඹ : ඒකාබද්ධ උපාධිධාරී සංගමය, මධ්‍යම සංස්කතික අරමුදල.

චන්ද්‍රපාල, වසන්ත. ‘‘නැගෙනහිර පළාතේ පුරාවස්තු විනාශය’’,
https://www.lankadeepa.lk/thaksalawa/%E0%B6%B1%E0%B7%90%E0%B6%9C
%E0%B7%99%E0%B6%B1%E0%B7%84%E0%B7%92%E0%B6%BB-
%E0%B6%B4%E0%B7%85%E0%B7%8F%E0%B6%AD%E0%B7%9A-
%E0%B6%B4%E0%B7%94%E0%B6%BB%E0%B7%8F%E0%B7%80%E0%B7
%83%E0%B7%8A%E0%B6%AD%E0%B7%94-
%E0%B7%80%E0%B7%92%E0%B6%B1%E0%B7%8F%E0%B7%81%E0%B6
%BA/55-526629

ජයසිංහ, සමන් ඉන්දික. ‘‘පුරාකෘති විනාශය පිටු දකිමු’’, ශිෂ්‍ය ලිපි, ශ්‍රී ලංකා පුරාවිද්‍යාව, 2015-12-02,
https://www.google.com/amp/s/www.archaeology.lk/sinhala/%25E0%25B6%25B4
%25E0%25B7%2594%25E0%25B6%25BB%25E0%25B7%258F%25E0%25B6%
259A%25E0%25B7%2598%25E0%25B6 25AD%25E0%25B7%2592-
%25E0%25B7%2580%25E0%25B7%2592%25E0%25B6%25B1%25E0%25B7%
258F%25E0%25B7%2581%25E0%25B6%25BA-
%25E0%25B6%25B4%25E0%25B7%2592%25E0%25B6%25A7%25E0%25B7%
2594-%25E0%25B6%25AF%25E0%25B6%259A%25E0%25B7%2592/amp/

ජිනවංස හිමි, බුදුගල. ‘‘ආගමික සංහිදියාවට බෞද්ධ පුරාවස්තු විනාශය ගැන කතා කිරීම අකැපද’’, 2017-12-20,
https://lankacnews.com/%E0%B6%86%E0%B6%9C%E0%B6%B8%E0%B7%92
%E0%B6%9A-
%E0%B7%83%E0%B6%82%E0%B7%84%E0%B7%92%E0%B6%B3%E0%B7
%92%E0%B6%BA%E0%B7%8F%E0%B7%80%E0%B6%A7-
%E0%B6%B6%E0%B7%9E%E0%B6%AF%E0%B7%8A%E0%B6%B0-
%E0%B6%B4/

Antiquities Ordinance. No.09 of 1940

Antiquities Ordinance. No.24 of 1998

Antiquities Ordinance. 2005

Central Cultural Fund Act. No.57 of 1980

# පානම උප සංස්කෘතික ඒකකය ආශ්‍රිත අස්පෘෂ සංස්කෘතික උරුමයන් හා ඒවායෙහි වර්තමාන අනාගත ප්‍රවණතාවන් පිරික්සීමක්

**කුමාරි අයි.ඒ.වී.පී.කේ.[1], කුමාරි බී.එස්.පී.[2], සෙව්වන්දි කේ.ඩී.සී. [3]**

[1-3]පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය, සමාජීය හා මානවශාත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

priyamalikalani@gmail.com

***සාරාංශය***

*ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කයේ පානම්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් පානම ග්‍රාමය තවමත් භාවිතයේ ඇති ප්‍රාදේශීය වූ ලාක්ෂණික ව්‍යවහාරයන් සහිත ප්‍රදේශයකි. උපතේ සිට මරණය දක්වා විවිධ අවස්ථාවන්හි දී අනුගමනය කරනු ලබන සිරිත්-විරිත්, සම්ප්‍රදායන් මෙන්ම කෙම්ක්‍රම, සාම්ප්‍රදායික වෙදකම ආදිය ද, පානම වැසියන්ට ම ආවේණික වූ උප භාෂා ලක්ෂණ ද, පානම ග්‍රාමයේ ව්‍යවහාරික අස්පෘෂ උරුමයන්ය. ඉහත ව්‍යවහාරයන් අතරින් උප භාෂා ලක්ෂණ ද අභිචාර හා බැඳී ඇති වාග්විද්‍යාත්මක ලක්ෂණ හැදෑරීම ද, එම ව්‍යාවහාරයන්ගේ වර්තමාන සහ අනාගත පැවැත්මේ ප්‍රවණතා හැදෑරීම ද මෙම පර්යේෂණයේ අරමුණ වේ. සහභාගීත්ව නිරීක්ෂණය, සම්මුඛ සාකච්ඡා ඔස්සේ මේ සඳහා දත්ත රැස්කර ගන්නා ලදී. සක්කර දානය, අලුත් දෙවියන් මඩුව, මඩේ නැටීම වැනි ශාන්තිකර්ම තවමත් භාවිතයේ ඇති අස්පෘෂ උරුමයන් වශයෙනුත් ඒ ඒ ශාන්තිකර්මවල දී ගයනු ලබන ජන ගී ආදියත් පොදු භාෂාවෙන් වෙනස් වූ උප භාෂා ලක්ෂණ සහිත මොවුන්ටම ආවේණික වූ භාෂාවත්, වාග්විද්‍යාත්මක අස්පෘෂ උරුමයන් ලෙසත් වර්ගීකරණය කොට හඳුනාගත හැකිය. සමාජ ආර්ථික පරිවර්තනයන් හමුවේ වෙනස්වීම්වලට ලක්වෙමින් පවතින පානම ග්‍රාමය තුලින් මෙම අස්පෘෂ උරුමයන් ගිලිහීයාමේ ලක්ෂණ වර්තමානය වන විට පෙන්නුම් කරයි. පිටත සමාජය සමඟ ගනුදෙනු කිරීමේ දී ඇතිවන අපහසුතා හේතුවෙන් මොවුහු සිය භාෂාව භාවිතය අවම කරමින් සිටිති. ඇතැම් සංස්කෘතිකමය උරුමයන් පාරම්පරිකව පවත්වාගෙන එනු ලැබූ පරම්පරාවන්හි නිමාව හෝ එම පරම්පරාවන්හි ඉතිරිව ඇති වර්තමාන පරපුර එම පුද සිරිත් පවත්වාගෙන ඒමට  පොදු සමාජ ආකල්ප මත දක්වනු ලබන අකමැත්ත හේතුවෙන් අභාවයට යමින් පවතී. සාම්ප්‍රදායික සිරිත්-විරිත්, කෙම්ක්‍රම, ඇදහිලි විශ්වාස පිළිබඳව වර්තමාන තරුණ පරපුර අතර වැඩි දැනුමක්, අවබෝධයක් හෝ අවදානයක් නොමැති බව හඳුනාගත හැකි කාරණයකි. ඔවුන් සාම්ප්‍රදායික විස්තෘත පවුල් සංස්ථාවෙන් මිදී න්‍යශ්ටික පවුල් ඒකක තුළට සීමා වීම තුළින් පාරම්පරික දැනුම උකහා ගැනීමට බාධා ඇති වීම හේතු වී තිබේ. ආරම්භයේ දී එකම සමාජ මට්ටමක සිටින සමාජ වටපිටාවක් පැවතිය ද සමාජ ආර්ථික පරිවර්තනය සමඟ පංති භේදය වැනි සංකල්ප සමාජය තුළ ස්ථාපනය වීමත් මෙම උරුමයන් ගිලිහී යාමට හේතු කාරණා වී ඇති බව මෙම විමර්ශණයේ දී හඳුනාගත හැකි විය.*

***මූඛ්‍ය පද :*** *පානම ප්‍රාදේශිය ඒකකය, අස්පෘෂ, සංස්කෘතික, උරුමය, ප්‍රවණතා*

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කයේ "පානම්පත්තුව" නම් ප්‍රාදේශීය ඒකකයේ ජීවත්වන්නා වූ ජන කණ්ඩායම මූලික කරගනිමින් ඔවුන්ගේ වාග්විද්‍යාත්මක හා සංස්කෘතිකමය ලක්ෂණ මත පොදු සමාජයෙන් වෙනස් වන්නා වූ පානම උප සංස්කෘතිය පිළිබඳව මෙහිදී සාකච්ඡාවට බඳුන් වේ. පානම වැසියා සතුව ඇති උප සංස්කෘතිකාංග අතර පොදු සමාජයෙන් වෙන්ව හඳුනාගත හැකි ඔවුන්ට ම ආවේණික වූ ජීවන රටාවන් මෙන්ම ඒ හා බැඳුනු ඇදහිලි විශ්වාස, අභිචාර විධි ආදිය ද සුවිශේෂී ලෙස හඳුනාගත හැකිය. පත්තිනි දේව සංකල්පය හා කතරගම දේව සංකල්පය මූලික වශයෙන් විශ්වාස කරනු ලබන පානම්පත්තුවේ ජනතාව ඒ හා බැඳුණු සිරිත්-විරිත්, විවිධ සංස්කෘතිකාංග ආදිය අනුගමනය කරන්නාවූ පිරිසකි. මෙහි ජීවත්වන ජනයා භාවිත කරන භාෂාව සිංහල භාෂාවේ උප භාෂාවක් ලෙස සැලකිය හැකි භාෂාවකි.

සංස්කෘතිකමය වශයෙන් පොදු සමාජයෙන් හුදෙක් වෙනස් ලක්ෂණ පෙන්වන පානම ප්‍රාදේශීය ඒකකයේ සංස්කෘතිකමය ලක්ෂණ අධ්‍යනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණයි. එම අරමුණ වෙත යොමු වීමට ප්‍රධානතම හේතුව වන්නේ ඔවුන්ගේ සංස්කෘතිය පිළිබඳව අසා ඇති මෙන්ම අත්දැක තිබෙන්නා වූ ඇතැම් කරුණු කාරණාවන් ය. ඒ හේතුවෙන් මෙම සංස්කෘතියට අදාලව සුවිශේෂී වන්නා වූ වාග්විද්‍යාත්මක ලක්ෂණ, ඇදහිලි විශ්වාස මෙන්ම සංස්කෘතිකමය උත්සව ආදිය පිළිබඳව මනා අවබොධයක් ලැබීම කෙරෙහි වැඩි අවදානයක් යොමු කරන ලදී. ශ්‍රී ලාංකීය සමාජයේ උප ජන කොට්ඨාසයක් වශයෙන් හඳුනාගත හැකි පානම ජන කොට්ඨාසය පිළිබඳව ඉහත අරමුණු ඉටු කර ගැනීමෙන් අනතුරුව ළඟා කර ගැනීමට බලාපොරොත්තු වන අවසන් අරමුණ වන්නේ පානම උප සංස්කෘතිය පිළිබඳ ප්‍රාමාණික අවබෝධයක් ලැබීමත් ඒ තුළින් පානම සංස්කෘතිය පිළිබඳ පුළුල් සමාජගත කිරීමක් සිදු කිරීමය.

## ක්‍රමවේදය

පානම්පත්තු වාසීන්ගේ උප සංස්කෘතික ලක්ෂණ යන මැයෙන් ක්‍රියාත්මක කරනු ලැබූ මෙම පර්යේශණය සඳහා අවශ්‍ය තොරතුරු සපයා ගැනීම වෙනුවෙන් ප්‍රධාන වශයෙන් ම ක්ෂේත්‍ර අධ්‍යනයේ යෙදීම හා සම්මුඛ සාකච්ඡාවන්හි යෙදීම සිදු කරන ලදී. උක්ත පර්යේෂණය සිදු කිරීම වෙනුවෙන් ක්ෂේත්‍ර අධ්‍යයනය තුළින් දත්ත රැස් කිරීමට යොමු වීමට ප්‍රධානත ම කාරණය වූයේ පානම උප සංස්කෘතිය පිළිබඳව ගැඹුරින් අධ්‍යයනය කිරීම මූලික අරමුණක් වීම හේතුවෙනි.

පානම වාසීන්ගේ සංස්කෘතිය පිටස්තර සමාජයට නුහුරු නුපුරුදු වෙනස් ලක්ෂණ සහිත වන්නක් වුවත් එය පානම ජනයාට හුරු පුරුදු ඔවුන්ගේ ම ආවේණිකත්වයයි. ඒ හේතුවෙන් උක්ත පර්යේෂණයට අදාල දත්ත රැස් කිරීම වෙනුවෙන් අනුගමනය කරන ලද ප්‍රධානතම ක්‍රමවේදය වූයේ සම්මුඛ සාකච්ඡාවන්ය. එහි දී මෙම පර්යේෂණයට අදාලව තොරතුරු සාර්ථකව සපයා ගැනීමට හැකි වෙතැයි අපේක්ෂිත පිරිසකගෙන් යුත් නියදියක් සරල සසම්භාවී ක්‍රමවේදය යටතේ තෝරා ගන්නා ලදී. එහිදී වයස, වෘත්තිය යන කාරණා මෙන්ම පානම ප්‍රදේශයේ පදිංචි වූ කාලය යනාදිය පිළිබඳව අවදානය යොමු විය.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

පානම උප සංස්කෘතියේ හඳුනාත හැකි වූ සුවිශේෂී ලක්ෂණ ප්‍රධාන වශයෙන් ඇදහිලි හා විශ්වාස, සංස්කෘතිකමය උත්සව, සිරිත්- විරිත් හා වාග් විද්‍යාත්මක ලක්ෂණ යන මාතයන් ඔස්සේ විස්තර කළ හැකිය. මෙහිදී වැඩි අවදානය යොමු කරනු ලබන්නේ සිරිත්-විරිත් හා වාග් විද්‍යාත්මක ලක්ෂණ කෙරෙහිය.

**සිරිත්-විරිත්**

පාන්මපත්තු වාසීන් සිය ජීවිතයේ පසුකරනු ලබන සුවිශේෂී අවස්ථාවල දී අනුගමනය කරනු ලබන සිරිත්විරිත් බොහොමයක් ඔවුන්ට ම ආවේණික ලක්ෂණවලින් යුක්තය. එවැනි සුවිශේෂී අවස්ථා වශයෙන් නව නිවසක් තැනවීම, ගැහැණු දරුවෙකුගේ වැඩිවිය පැමිණීම, මරණය යනාදිය දැක්විය හැකිය. එම අවස්ථාවන්හි සිදුකරනු ලබන චාරිත්‍ර විධි පිළිබඳ විස්තර මෙලෙස දැක්විය හැකිය.

නව නිවසක් තැනවීමේ දී මුල්ගල් තැබීම නැකතකට අනුව සිදුකරනු ලබන අතර පවුලේ ගැබ්ගත් අයෙක් වන්නේ නම් නිවස තැනීම කල් දමයි. එය නැවත සිදු කරනු ලබන්නේ දරුවා ලැබුණු පසුවය. නිවස් සෑදීමේ සැලැස්මෙහි විශේෂතා මෙම සමාජයේ හදුනාගත හැකිය. නිවසේ මුලුතැන්ගෙය නැගෙනහිරට මුහුණලා ඉදිකරනු ලබයි. ළිඳ ඉදිකරනු ලබන්නේ නැනෙහිර දිශාවෙනි.

ගැහැණු දරුවන් වැඩිවියට පත්වීම මොවුන් විසින් සිදු කරනු ලබන සිරිත් විරිත් පිළිබඳ අවබෝධයක් ලබාදෙන තවත් එක් අවස්ථාවකි. ගැහැණු දරුවා වැඩිවිය පත්වූ බව දැනගැත් සැනින් ඇය රෙද්දකින් වසා පිරිමි පාර්ශ්වයේ ඇස නොගැටෙන සේ වෙන්කර තබයි. එහිදී එය දැනගත් දින සවස අහසේ තරුවක් දිස්වන තුරු ඇය වෙන්කර තබා ගැනීම මොවුන්ගේ සිරිතයි. තම නිවසේ බාහිර තැනක දුරිවිය රඳවා සිටියි. ඇයගේ තනියට තවත් ගැහැණු දරුවෙකු රඳවා තබයි. නිවසට යාවන සේ නිවසට පිටතින් කුඩා මඩුවක් සාදවන්නේ දුරියගේ පියාගේ මූලිකත්වයෙනි. මෙහි

දී සාදන ප්‍රධානතම කැවිලි වර්ගය වන්නේ හැඳි කැවුම්ය. සාදාගත් පැල එක් පැත්තක දොරට මුහුණලා රෙද්දක් අතුරයි. උඩුවියන් ද බැඳ, පැල වටා පිරුවට අදියි. අතුරන ලද රෙද්දෙහි වී දමා වී ගොඩ මත පුන්කලසක් තබයි. සහල්, බුලත්, පුවක්, කෙසෙල්ගෙඩි ආදිය ද තැබීම සිරිතයි. පොල්මලක් කපා එය කළයකට දමා ඒ මැද පොල් ගෙඩියක් තැනීම ද, කළයේ හුණු මඟින් රටා තැබීම ද කරනු ලබයි. ගෙවත්තේ නිවසට යාබද කෙලවරක වතුර භාජන තබා දූරිය නැවීමට සූදානම් කර ගනියි. දූරිය නැවීම සිදු කරනුයේ රෙදි නැන්දා ලෙස හඳුන්වනු ලබන රදා කුලයේ කාන්තාවක විසිණි. ඇය දූරිය වෙනුවෙන් ඇඳුම් සූදානම් කරගෙන සිටින්නීය. අහසේ තරුවක් පායා තිබෙනු දුටු සැනින් දූරිවිය නැවීම අරඹයි. දූරිය නාවා පිරිසිදු කර රෙදි නැන්දා ගෙනවිත් ඇති පිරිසිදු ඇඳුම් අන්දවා, තවත් රෙද්දකින් ඇයගේ හිස ද ආවරණය කොට රෙදි නැන්දා විසින් ම ඇයව අලුතින් ඉදිකරන ලද පැල තුළට කැදවාගෙන එයි. හිස හා මුහුණ ආවරණය කර ඇති රෙදි කඩ ඉවත් කරනුයේ පැල තුළදීය. එහිදී ඇය පළමුව බැලිය යුත්තතේ දැල්වෙන පහන දෙසය. දූරිය නහවන උත්සවය වනතුරු ඇය ආච්චී අම්මා හෝ ඥාතිවරියක සමඟ ඉදිකළ පැල තුළ රදවා සිටියි. පසුව නැකැත් බලා දූරිය නැහැවීමේ උත්සවය දෙමාපියන් විසින් සංවිධානය කරනු ලැබේ. මෙම නැකැත් දින නහවන උත්සවය සඳහා ගෙට ඇතුල්වන ඉදිරි දොරටුව ද යා කොට වට තිර ඇද මඩුවක් වැනි ස්ථානයක් සකස් කරනු ලබයි. මෙම නැකැත් දිනයේ දී සකසාගත් මඩුවෙහි ඇතුලත කහ දමා අනාගත් හාල් පිටිවලින් ආවරණය කර, ඒ මත ඔලිඳ ඇට ඔබ්බමින් අලංකාර කරගත බඳුන් මත ඉරටුවල ඔතන ලද පහන්තිර රදවා දල්වා ගනු ලබයි. දූරිය නැහැවීමේ දී මුලින් ම මුහුදු වතුරින් ද පසුව පිරිසිදු වතුරින් ද නැහැවීම පානම වැසියන්ගේ සිරිතයි. නහවාගත් දූරිය රෙද්දකින් මුහුණ ආවරණය කරගෙන මඩුව වෙතට කැටුව එනු ලබන්නේ රෙදි නැන්දා විසිණි. පසුව පෙර සකසාගෙන තිබූ පහන් තිර සහිත බඳුන දූරිවියගේ හිසේ සිට දෙපතුල දක්වා පහළට ඉදිරිපසින් සහ පසුපසින් තෙවරක් සිදු කර දූරියට එයට කෙළ ගැසීමට සලස්වයි. එයින් මොවුන් අපේක්ෂා කරනුයේ වස් දොස් කැපීම, ඇස්වහ කටවහ දුරු වීම යනාදියයි. මෙය ආලන්ති ගන්නවා යැයි පානම වැසියන් හඳුන්වයි. මෙම සිරිත් අනුගමනයෙන් පසුව දූරියට අලුත් ඇඳුම් අන්දවා, ආභරණ පළඳවා දෙමාපිය වැඩිහිටියන්ට වැඳ ආශිර්වාද ලැබිමට ඉඩ සලසා දෙනු ලබයි. මෙම සිරිත්වලින් අනතුරුව දහවල් ආහාරයෙන් පසුව පවුලේ පිරිස් එකතු වී සතුටු වීම සිරිතයි. වර්තමානය වන විට යම්යම් වෙනස්කම් ඇති වී ඇති බව හඳුනාගත හැකිය.

පානම වාසීන්ගේ මරණයක් සිදු වූ විට එහි අවසන් කටයුතු සිදු කරන්නේ ඔවුන්ට ම ආවේණික ආකාරයකට ය. මරණයක් සිදු වූ විට මරණය සිදු වූ නිවසේ ලිප

නොදැල්වීම මොවුන්ගේ සිරිතකි. ආදාහන කටයුතු සිදු කිරීමට පෙර ගිලන්පස පූජා කොට පන්සලේ හාමුදුරුවන් වහන්සේට පාංශුකූලයට ආරාධනය කරනු ලැබේ. ඒ අනුව එම කටයුතු සවස්යාමයේ දී සිදු කරයි. පාංශුකූල කටයුතු අවසානයේ මිනිය සොහෙනට ගෙන යනු ලබයි. එහිදී කුරුම්බා ගෙඩි 2ක් කපා වල දෙපැත්තතේ තබා පහන් දෙකක් දල්වා, බුලත් විට දෙකක් ද, වතුර වීදුරු දෙකක් ද තබයි. ගස්වල අතු කිහිපයක් කඩා වල මත දැමීම ද මොවුන්ගේ සිරිතකි. නිවසේ මිනිය තබා තිබූ ස්ථානය කොහොඹ කොළ කොටා, කහ මිශ්‍ර කරගත් ජලයෙන් සෝදා නිවසේ සියලු දෙන ද කහ මිශ්‍ර ජලයෙන් සෝදා ස්නානය කිරීම සිදු කරයි. එදින රාත්‍රියේ සිට දින 7ක් යන තුරු නිවසේ එක් මුල්ලක පහනක් දල්වා පැන් වීදුරුවක් සහ බුලත් විටක් තැබීම පානම වාසීන්ගේ සිරිතයි. එදින සිට ගිහියෙක් ලවා බණ කියවා හයවන දිනයේ භික්ෂූන්වහන්සේ නමක් ලවා බණක් කියවා හත් දවසේ දානය සුදානම් කරයි. පානම වැසියන් තුළ පවතින මරණය ආශ්‍රිත සිරිත් විරිත් අතර ඇති පරාණ බත ඉවීම වැදගත් චාරිත්‍රයකි. ඒ සඳහා අවශ්‍ය ද 6වෙන දින සූදානම් කරනු ලබන අතර මෙහි දී හත් මාලුව පිසීම සුවිශේෂීය. මේ සඳහා බටු යොදා නොගැනීම ඔවුන්ගේ සිරිතයි. මෙම මාලුව සඳහා අලු කිතල ගෙඩියක්, මෑ කරලක්, අල ගෙඩියක්, තම්පලා ගහක්, බොංචි කරලක්, කැරට් අලයක් වැනි දේ යොදාගනු ලබයි. නැවුම් මුට්ටිය, හට්ටිය, හැන්ද, නැඹිලිය, උල් මූඩිය ආදිය අනිවාර්ය උපකරණ වේ. පරාණ බත ඉවීම සිදුකරන්නේ ඒ පිළිබඳව මනා දැනුම ඇති කාන්තාවක් විසිණි. පාන්දර කුරුල්ලන් හැඩීමට පෙර පරාණ බත ඉවීම සිරිතක් වන අතර මෙහි දී කතාබහ කිරීම තහංචි වේ. මෙලෙස උයන පරාණ බත එක මුට්ටියක හාල් පෙරා සෝදා නිවස තුළ දී ම සකස් කරනු ලබයි. එම බත හැන්දෙන් දෙකට බෙදා එක් පැත්තක බත කිරිබත් ලෙස සකසා ගනියි. කිරිබතට තැඹිළි ගෙඩියක්, කෙසෙල් ගෙඩියක්, සූකිරි, හකුරු, වියළි මිදි, රටඉඳි, මී කිරි ආදිය දමා සකසා ගනියි. වෙනම ම කිරිබතක් උයා ගැනීම ද මේ අවස්ථාවේ සිදු කරයි. එක මුට්ටියේ පිසගත් කිරිබත පාන්දර කුරුල්ලන් හැඬලීමට පෙර මළගෙදර කඩුල්ලේ මැස්සක් තනා එහි එලූ කෙසෙල් කොළයකට බෙදයි. එළඟිතෙලෙන් පහනක් ද කුරුම්බා ගෙඩියක් ද, බුලත් විටක් හා වතුර වීදුරුවක් ද එහි තබයි. මුට්ටියේ බත ද හත් මාලුව ද, වෙනම ම සාදාගත් කිරිබත ද, පාන්දරින් ම පන්සල වෙත රැගෙන යනු ලබයි. කිරිබත් ගුලි තුනක් කොට බත් ද හත්මාලුව ද එයට බෙදා කිරිබත් ගුලි ද තබා දැල්වූ හඳුන්කූරු ද එහි ම රඳවා පිළියෙල කිරීමෙන් පසු ඒවා භික්ෂූන්වහන්සේ වෙත පූජා කරනු ලබයි. මෙයින් ඔවුනගේ අවමංගල්‍ය චාරිත්‍ර අවසන් වේ.

**පානම වාග් විද්‍යාත්මක ලක්ෂණ**

පානම් පත්තුවේ වාසය කරන ජනයාගේ වාග් මාලාවේ මෙන් ම වාග් විලාසයේ ද වෙනස්කම් රාශියක් හඳුනාගැනීමට හැකි විය. මෙම පර්යේෂණයේ දී රැස්කර ගැනීමට හැකි වූ දත්ත අනුව පානම වැසියා ගේ භාෂාව පොදු සමාජයෙන් වෙනස් ආරක් ගන්නා බව ද ඇතැම් ඒවා හි සමානතා ද හඳුනාගත හැකිය. පානම වැසියාගේ භාෂාව පළාතට අයත් තවත් ප්‍රාදේශීය භාෂා වලින් ද වෙනස්කම් සහිත වන බව පෙනී යන කරුණකි. පානම භාෂාවේ ඇතැම් වචන උඩරට සිංහල භාෂාවේ ඇතැම් වචන සමඟ සමානතා ඇති බව පෙනුන ද ඒවා වර්තමානය සමඟ වෙනස්කම් වී ඇති බවකුත් හඳුනාගත හැකිවිය. මොවුන්ගේ භාෂාවෙහි උඩරට භාෂාවට අයත් වචන මෙන්ම දකුණු පළාතේ භාෂාවේ ඇතැම් පද ද දෙමළ භාෂාවේ ඇතැම් පද ද ව්‍යවහාර වන බව ද හඳුනාගැනීමට හැකි විය. එලෙස දකුණු පළාතේ භාෂාවෙන් පානම භාෂාව වෙත ඒකරාශී වූ වචන ලෙස,

- දොඩවනවා - කතා කරනවා
- දීකිරි - මීකිරි
- පොල් ඔයනවා - පොල් ලෙලි ගසනවා
- සම්බල් - සම්බෝලය
- ජූල් - දිවුල්
- වන්ගිය - වාරය
- හීන් එකී - බාල එකී

දමිළ භාෂාවෙන් පානම භාෂාව වෙත ඒකරාශී වූ වචන ලෙස,

- අප්පා
- කොඩියාර්
- සොන්ද
- කානි
- කාවල්
- කාවල්කාරයා
- කොඩාවි
- මුට්ටාසි

යන ආදී පද දැක්විය හැකිය. මොවුන්ගේ භාෂාවේ මොවුන්ට ම ආවේණික වූ පද මාලවක් ද හඳුනාගත හැකිය.

- ඒලයියා - හිරු
- තෙයියා - කුරුල්ලා
- කුට්ටාලි - යහලුවා
- හරන්කුට්ටියා - අවජාතකයා
- හුන්දැම - සුසුම්ලෑම
- විපිරියාස - නිශ්ඵල දේවල්
- කඩ ගැනීම - අතරමං වීම
- අඩයාලම - ලකුණ
- පන්ජි ඇදීම - උගුල් ඇටවීම
- උඩුක්කුවා - කපටියා
- විලපම - පණිවිඩය
- අන්කොල මිටියා - වලහා

- මරෙක් වීම - මඟහැරීම
- දොබ්බ - විශාල
- හාටෙන් ගෑම - ඉබාගාතේ යාමක්
- කුරමෙ - ක්‍රමය
- තෙරික්කාටු - වෙහෙසීම
- මුම්මාරි - මහ කන්නය
- විසපතලයා - මෝඩයා
- සන්ගදොරුව - පලහිලවුව
- තිහරන් දැමීම - හාමත්වීම
- උෟසල් - හුන් සහල්
- පන්ජම - සාගතය
- උහන්දිරම - ගංවතුර
- පිම්මාරි - යල කන්නය
- සිහිපරාද - අමතක වීම

මේ ආදී වචන මාලවන්ට අමතරව මොවුන්ගේ භාෂාවෙහි සුලභව හමුවන අඩා, බොටා, මුනා වැනි පද ද සුවිශේෂීය. මොවුන් ඒවායින් සිය ලෙන්ගතුකම පෙන්නුම් කරයි. වාග් මාලාව එලෙස වෙනස් වන්නා සේ ම පානම වැසියන්ගෙ වාග් විලාශය ද වෙනස්කම් පොදු සමාජයෙන් මෙන්ම අනෙකුත් උප භාෂා තුළින් ද හඳුනාගත හැකිය. පානමවාසීන් කතා බහ කිරීමේ දී බොහෝ විට වැකියේ අවසානය තරමක් දීර්ඝව පැවසීම සිදු කරයි. එමෙන්ම මොවුන්ගේ භාෂාව පිටස්තර පුද්ගලයන් හට කලහකාරී ස්වභාවයක් පෙන්නුව ද එහි ඔවුන්ගේ ලෙන්ගතුබව රඳා පවතී. මෙහි ජනයා කතබස් කරන් විට යම් තරමක උස් හඬක් සහිතව කතා කිරීම ද මොවුන්ගේ වාග් විද්‍යාත්මක ලක්ෂණ අතර හඳුනාගත හැකි ලක්ෂණයකි.

පානම සංස්කෘතිය පිළිබඳව සිදු කරනු ලැබූ මෙම පර්යේෂණයේ දී රැස් කරගත් දත්ත ඇසුරින් පානම සංස්කෘතියේ සුවිශේෂීතා බොහෝමයක් පවතින බව හඳුනාගත හැකි විය.

සිරිත් විරිත් පාරම්පරිකව පවත්වාගෙන ඒමට ද යම් යම් බාධාකාරී තත්වයන් උත්ගත වී පවතින්නේ සමාජමය දුරස්ථභාවයත් බොහෝ විට මෙහි වැසියා පොදු සමාජය සමඟ කරනු ලබන ගනුදෙනු කිරීම්හි දී උකහා ගනු ලබන පොදු සමාජමය සිරිත් විරිත් වෙත අනුගත වෙමින් සිය සිරිත් විරිත් බැහැර කිරීමට යොමු වීමයි. එයින්

සාම්ප්‍රදායික සිරිත් විරිත් වෙත ද බාහිර ආටෝප එක් වීම නිසා පානම සංස්කෘතියට යම් යම් බලපෑම් ඇතිවන බව පෙනීයයි.

පානම භාෂාවේ වාග් මාලාවේ භාවිත වන උඩරට උප භාෂාත්මක යෙදුම් සඳහා මොවුන්ගේ පැරණි මුතුන් මිත්තන් පිළිබඳව වන කතා පුවතේ යම් සම්බන්ධයක් ඇතැයි නිගමනය කළ හැකිය. වෙළඳ කටයුතු වෙනුවෙන් පානම ප්‍රදේශයට පැමිණි ද්‍රවිඩ ජනයාගෙන් හා පසුව එහි පදිංචි වූ ද්‍රවිඩ ජනයාගෙන් ලද වාග් මාලාවන් ද මොවුන්ගේ භාෂාව පෝෂණය කර ඇති බව පෙනීයයි. පානම භාෂාව වෙත දකුණු පළාතේ භාෂාවෙන් ඇතැම් පද ඒකරාශී වීමට බලපා ඇත්තේ ධීවර කටයුතු වෙනුවෙන් මෙම ප්‍රදේශයට පැමිණෙන දකුණු ප්‍රදේශයේ ජනයාගෙන් බව උපකල්පනය කළ හැකිය. වර්තමානය වන විට මොවුන්ට ආවේණිකව පැවති පානම භාෂාව ක්‍රම ක්‍රමයෙන් වෙනස් වෙමින් යන බව ද හඳුනාගත හැකි ලක්ෂණයකි. එලෙස භාෂාව වෙනස් වීම සඳහා බාහිර සමාජමය බලපෑම ද හේතු වී තිබෙයි. පිටත සමාජයෙන් එල්ල වන බලපෑමත් මොවුන් පිටත සමාජය සමඟ කරනු ලබන ගනුදෙනු ප්‍රමාණය වැඩි වීමත් ඊට බෙහෙවින් බලපා තිබෙයි.

**නිගමනය**

පානම්පත්තු සංස්කෘතිය පොදු සමාජයෙන් ඇදහිලි හා විශ්වාස, සංස්කෘතිකමය උත්සව, සිරිත් විරිත්, භාෂාව යන මානයන් ඔස්සේ වෙනස්කම් පෙන්වන බව මෙම පර්යේෂණයේ දී නිගමනය කළ හැකි විය. නමුත් වර්තමානය වන විට මෙහි ජනයා තුළින් එම සංස්කෘතිකමය ලක්ෂණ බොහෝ විට ගිලිහී යන වග හඳුනාගැනීමට හැකි විය. එලෙස වෙනස්කම් ඇති වීමට බලපා තිබෙනුයේ සමාජමය හා ආර්ථික වශයෙන් වන බලපෑම බව අවසාන වශයෙන් නිගමනය කළ හැකිය.

**ස්තුතිය**

පානම උප සංස්කෘතිය පිළිබඳව සිදු කරන ලද මෙම පර්යේෂණයේ ක්ෂේත්‍ර ගවේෂණයේ දී සහය වූ ඒ. කේ. ඉන්දිකා දිල්රුක්ෂි වන මාගේ පුංචි අම්මාටත්, දත්ත රැස් කිරීමේ දී මා හට සහය වූ පී. නදුනි නවෝද්‍යා සොයුරියටත් මාගේ හදපිරි ප්‍රණාමය.

**සම්මුඛ සාකච්ඡා**

1) මැණිකේ,ලීලාවතී, අවුරුදු79, ගම්වාසී, පී/11, RDAමාර්ගය, වැටියවෙල, පොතුවිල් 2020/09/25

2) ප්‍රේමතිලක, එච්.ඩී, අවුරුදු 54, පොලිස් සැරයන්, පානම පොලිස් ස්ථානය, පී/11, මොණරාගල පාර, පොතුවිල් 2020/09/25

3) ප්‍රියංගිකා,රුක්මණී, අවරුදු 54, ගම්වාසී පානම, පොතුවිල් 2020/09/26

4) විනීත හිමි, හල්වතුරේ, අවුරුදු 40, පො/ ජයමග මහපිරිවෙන් නියෝජ්‍ය පරිවෙණාධිපති.

# කෞතුක වස්තු සංරක්ෂණ ක්‍රියාවලියේ දී මහජනතාවගේ දායකත්වය

**ජේ. ඩී. සී ජිනසේන[1], ඩබ්ලිව්. ජේ. කේ. වී සතුශ්ක[2]**

[1]සහකාර කථිකාචාර්ය, කැලණිය විශ්වවිද්‍යාලය

[2]සහකාර කථිකාචාර්ය, කැලණිය විශ්වවිද්‍යාලය

dimuthujinasena@gmail.com

sjayawardana53060@gmail.com

***සංක්ෂේපය***

*පුරාවිද්‍යා ක්ෂේත්‍රයකින් හෝ වෙනයම් ආකාරයකින් ලබා ගන්නා පුරාවස්තුවල භෞතිකමය ඒකාග්‍රතාවය ආරක්ෂා කරමින් එහි ආයු කාලය හැකිතාක් වර්ධනය කිරීම සංරක්ෂණය මඟින් සිදු කරයි. කෞතුක වස්තු ලෙස කෞතුකාගාර තුළ ප්‍රදර්ශනය වන්නේ එලෙස සංරක්ෂිත පුරාවස්තු අතරින් තෝරාගත් කොටසකි. මෙලෙස ප්‍රදර්ශනය සඳහා යොමුවන කෞතුක වස්තු දීර්ඝ කාලීන සංරක්ෂණ ක්‍රියාවලියට යටත් වේ. කෞතුක වස්තු සංරක්ෂණ ක්‍රියාවලියට මහජනතාවගේ දායකත්වය වක්‍රාකාරව සිදුවන්නකි. එනම් නරඹන්නන් ලෙස ඔවුන්ගේ හැසිරීම් හා ක්‍රියාකාරකම් කෞතුක වස්තු වල පැවැත්ම කෙරෙහි සිදු කරනු ලබන සෘජු හා වක්‍ර බලපෑම  වේ. කෞතුක වස්තු සංරක්ෂණ ක්‍රියාවලිය සඳහා මහජන දායකත්වය සිදු වන්නේ කෙසේ ද යන්න මෙම පර්යේෂණයෙහි ගැටළුව ලෙස දැක්විය හැකිය. නොනවතින ක්‍රියාවලියක් වන කෞතුක වස්තු සංරක්ෂණයට මහජනතාවගේ දායකත්වය විවිධ ක්ෂේත්‍ර ඔස්සේ කිරීම අධ්‍යයන කිරීම අරමුණ වේ. මෙම පර්යේෂණය සිදු කිරීම සඳහා ප්‍රථමික දත්ත හා ද්විතීක දත්ත උපයෝගි කර ගත් අතර දත්ත විශ්ලේෂණය සඳහා ස්වයං දත්ත විශ්ලේෂණ ක්‍රමවේදය උපයෝගි කර ගන්නා ලදී. මෙම අධ්‍යයනයේ ප්‍රතිඵලය වන්නේ කෞතුකාගාර කෞතුක වස්තු ආශ්‍රිත නරඹන්නන්ගේ හැසිරීම සොයා ගැනීමයි. මෙම සංරක්ෂණය නොනවතින ක්‍රියාවලියක් වන අතර නරඹන්නාගේ හැසිරීම සංරක්ෂණ ක්‍රියාවලියේම කොටසක් බව තහවුරු වේ.*

***මුඛ්‍ය පද :*** *කෞතුක වස්තු, කෞතුකාගාර, සංරක්ෂණ ක්‍රියාවලිය, කෞතුකාගාර පරිහරණය, මහජන දායකත්වය*

**හැඳින්වීම**

ලෝකයේ විවිධ ජන කණ්ඩායම්වලට අයත් සංස්කෘතිකමය හා ඓතිහාසික වටිනාකමකින් යුතු උරුමයන් කාලයත් සමඟ විවිධාකාර විනාශයන්ට මුහුණ පා තිබේ. කෞතුකාගාරයක ආරක්ෂාව සහිතව හෝ එළිමහනේ පවතින මෙම පෞරාණික වස්තූන් යම් ක්‍රමවේදයක් යටතේ ආරක්ෂා කර ගැනීමේ අවශ්‍යතාවයක් ලෝක මට්ටමෙන් ඉස්මතු විය. විශේෂයෙන් පළමු හා දෙවන ලෝක යුධවල අතුරු ප්‍රතිඵලයක් වශයෙන් වටිනා උරුමයන් රැසක් විනාශයට පත් විය. මෙම කරුණු පාදක කර ගනිමින් කෞතුක වස්තු සංරක්ෂණය කිරීමේ වැඩපිළිවෙල පුළුල් ක්ෂේත්‍රයක් පුරා ව්‍යාප්ත විය.

"සංරක්ෂණය යනු ඕනෑම වර්ගයක සංස්කෘතික භාණ්ඩ කොටසක් සඳහා යොදාගෙන ඇති ද්‍රව්‍යවල ස්වභාවය හෝ වර්ගය නිර්ණය කිරීමට ගනු ලබන ඕනෑම ක්‍රියාවක් හෝ හායනකාරක අවබෝධ කර ගැනීමට ගනු ලබන ඕනෑම ක්‍රියාවක් හෝ එබඳු භාණ්ඩ සංයුතීන්ගේ තත්ත්වය යහපත් කිරීමට ගනු ලබන ඕනෑම ක්‍රියාවකි." (ලද්දුසිංහ, ස,)

සරලව ගතහොත් සංරක්ෂණය මඟින් සිදු කරනුයේ පුරාවස්තුවක භෞතිකමය ඒකාග්‍රතාව ආරක්ෂා කරමින් එහි ආයු කාලය හැකිතාක් වර්ධනය කිරීමට කටයුතු කිරීමයි. ඒ සඳහා නිසි දැනුම සහිත පිරිස් භෞතික හා රසායනික ක්‍රමවේද භාවිත කරයි. සංරක්ෂණ ක්‍රියාවලිය කෞතුක වස්තු ජනතාව සඳහා ප්‍රදර්ශනය කිරීමෙන් අවසන් නොවන්නකි. දීර්ඝ කාලීනව සිදු කරන මෙම ක්‍රියාවලිය තුළ මහජනතාව ද කොටස්කරුවන් වේ. සංරක්ෂණය කළ හෝ නොකළ පුරා වස්තුවකට හානි නොවන ලෙස පරිහරණය කිරීම මහජනතාව සතු වගකීමක් වන අතර ඔවුන්ගේ නොසැළකිලිමත් පරිහරණය හේතුවෙන් ප්‍රබල සංරක්ෂණයක අවසන් ප්‍රතිඵලය ලෙස ඉස්මතු කළ වටිනා උරුමය නැවත විනාශ මුඛයට යනු ඇත. ඒ අනුව සැලකීමේ දී සංරක්ෂණ ක්‍රියාවලිය භාණ්ඩයකට පිළියම් යෙදීමෙන් අවසන් නොවන්නකි.

මහජනයා අතින් දැනුවත්ව හෝ නොදැනුවත්ව උරුමයන්ට හානි සිදුවනවා සේ ම මඟ පෙන්වීමක් සහිතව හෝ රහිතව මහජනයා උරුමය ආරක්ෂා කරනු ද දැක තිබේ. කෞතුකාගාරය තුළ හෝ ඉන් පරිබාහිරව පවතින උරුමය ආරක්ෂා කර ගැනීම නැතිනම් සංරක්ෂණ ක්‍රියාවලිය තුළ මහජනතාවගේ දායකත්වය කෙබඳු වේද යන්න පිළිබඳ මෙහිලා පර්යේෂණයට බඳුන් කරනු ලබයි.

මෙම පර්යේෂණ ලිපියෙහි මූලික අරමුණ බවට පත් වන්නේ, කෞතුක වස්තු සංරක්ෂණ ක්‍රියාවලියේ දී මහජනතාවගේ දායකත්වය විවිධ ක්ෂේත්‍ර ඔස්සේ අධ්‍යයන කිරීමයි. මෙහි අන්තර්ගත වෙනත් අරමුණු වන්නේ සමාජීය වශයෙන් කෞතුක වස්තු සංරක්ෂණයේ වැදගත්කම හඳුනා ගැනීම, සමාජය තුළින් කෞතුක වස්තු වලට වන බලපෑම හඳුනා ගැනීම, කෞතුක වස්තු සංරක්ෂණ ක්‍රියාවලිය තුළ මහජනතාවගේ අතීත හා වර්තමාන තත්ත්වය අවබෝධ කර ගැනීම, පවතින ක්‍රියාවලිය තුළ මහජනතාවගේ අනුගත වීම කෙබඳු මට්ටමක පවතී ද යන්න හඳුනා ගැනීම, උරුමය රැක ගැනීම පිළිබඳ මහජන මතය හඳුනා ගැනීම, සමාජීය බලපෑම සඳහා වූ ආරක්ෂණ ක්‍රමවේද හඳුනා ගැනීම, නීතිමය පැතිකඩ පිළිබඳ ජනතාව තුළ ඇති දැනුවත් බව කෙබඳු මට්ටමක පවතී ද යන්න හඳුනා ගැනීම හා දැනට කෞතුකාගාර ආශ්‍රිතව පවතින තත්ත්වය විමසීම ආදියයි.

එසේම මෙම පර්යේෂණයෙහි මූලික ගැටලුව බවට පත් වන්නේ, කෞතුක වස්තු සංරක්ෂණ ක්‍රියාවලිය සඳහා මහජන දායකත්වය සිදු වන්නේ කෙසේ ද? යන්න විමර්ශනය කිරීමයි.

**කෞතුක වස්තු**

කෞතුක වස්තු මගින් මානව ශිෂ්ටාචාරයේ විවිධ අවස්ථාවන් පිළිබඳව තොරතුරු ඉදිරිපත් කරයි. එසේම ස්වභාවය හා අනාවරණය වන තොරතුරු අනුව කෞතුක වස්තු විවිධාකාර වේ.

"ආරක්ෂා කරගත යුතු මානව සංස්කෘතික වස්තු, චංචල සංස්කෘතික හා නිශ්චල සංස්කෘතික වස්තු යනුවෙන් කොටස් කළ හැකිය. මානව නිර්මාණ කාර්යයේ හා ස්වභාව ධර්මයෙහි විකාශනයේ සාධක හැටියට ගත හැකි පුරාවිද්‍යාත්මක හෝ ඓතිහාසික හෝ කලාත්මක හෝ විද්‍යාත්මක හා තාක්ෂණික වැදගත්කමකින් යුත් එහා මෙහා ගෙන යා හැකි ඕනෑම භාණ්ඩයක් චංචල සංස්කෘතික වස්තු ගණයට වැටේ. කෞතුකාගාරවල තැන්පත් කරනුයේ එවැනි දේය." (ලද්දුසිංහ, ස,)

සෞන්දර්ය අපූර්වත්වය, කලාත්මක දුර්ලභත්වය, පුරාවිද්‍යාත්මක, ඓතිහාසික සහ විද්‍යාත්මක වටිනාකම්කින් යුතු ස්වභාවික වස්තු හා මානව නිර්මාණ කෞතුක වස්තු ලෙස සරලව හඳුනාගනී. ඉතිහාසයේ වැදගත් සිද්ධියකට හෝ ප්‍රසිද්ධියට පත් පුද්ගලයෙකුට සම්බන්ධ උපකරණ ද කෞතුක වස්තු බවට පත් කිරීමට හැකියාව පවතියි. ආගමික වශයෙන් පූජනීය වූ භාණ්ඩ ද කෞතුක වස්තු ලෙස සැලකිය හැකි වේ. ඒ කුමන ආකාරයේ කෞතුක වස්තුවක් වුවත් එයට කෞතුක වටිනාකමක් ඇති වන්නේ එකී වස්තුව මගින් කියාපාන අරුත පදනම් කොට ගනිමිනි. එහි ඇති තොරතුරු නිසා වස්තුවට වටිනාකමක් ඇති වේ.

**කෞතුකාගාර**

පුරාවිද්‍යා ක්ෂේත්‍රයකින් හෝ වෙනයම් ආකාරයකින් ලබාගන්නා වස්තූන් සංරක්ෂණය කර ආරක්ෂිතව තැන්පත් කරනු ලබන අතර කොටසක් ප්‍රදර්ශනය සඳහා ද තවත් කොටසක් ගබඩා තුළ ද තැන්පත් කිරීම සිදු කරයි. නිසි පරිදි සංරක්ෂණ ක්‍රමවේදයන් යෙදූ කෞතුක වස්තු නිවැරදි තොරතුරු සමඟ සුදුසු පරිසරයක් තුළ (කෘතිමව සකස් කළ ගොඩනැගිල්ලක හෝ එළිමහනේ) මහජනයාට ප්‍රදර්ශනය කරනු ලබයි. ජාත්‍යන්තර කෞතුකාගාර නිර්වචනයට අනුව,

"මිනිසා සහ ඔහුගේ පරිසරය පිළිබඳව ද්‍රව්‍යමය සාක්ෂි අත්පත් කරගන්නා වූ සංරක්ෂණය කරගන්නා වූ පර්යේෂණ පවත්වන්නා වූ හා ප්‍රදර්ශන කරන්නාවූ ද මහජනයාගේ අධ්‍යයනයට අධ්‍යාපනය සන්තෘෂ්ඨිය සඳහා විවෘතව පවත්නා වූ සමාජ සේවයට හා දියුණුවට පවත්වාගෙන යනු ලබන ලාභ නොලබන ස්ථිර ආයතනය කෞතුකාගාරයක් වශයෙන් හැඳින්වේ."

සරලව කෞතුකාගාරයක් යනු ඉතිහාසය ප්‍රකාශය කරනු ලබන මාධ්‍යයක් වන අතර එය සක්‍රීය තත්ත්වයට පත්වන්නේ මහජනයා නැතහොත් නරඹන්නන් පදනම් කොටගනිමිනි. එබැවින් මහජනතාව උදෙසා කෞතුකාගාර සිය කෞතුක වස්තු ප්‍රදර්ශනය කරනු ලබයි.

**සංරක්ෂණ ක්‍රියාවලිය**

ස්වභාවයෙන් හා ස්වරූපයෙන් කෞතුක වස්තු විවිධාකාර වේ. එහෙත් ඒ සියල්ලටම පොදු වූ එක් කරුණක් වේ. එනම් ඒවා තනා ඇති ද්‍රව්‍යයන් ස්වභාවික හායනයටත්, විනාශයටත් ගොදුරු වන බැවිණි. මේ නිසා කෞතුකාගාර කෞතුක වස්තු සංරක්ෂණය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරයි. නිෂ්පාදනය, භාවිතය හා කෞතුක භාණ්ඩයක් වී සංරක්ෂණය කරන මොහොත දක්වා ඒවා විවිධ විපර්යාස වලට ලක්වේ. යම් පුරාවස්තුවක් කෞතුකාගාරයක් විසින් අත්පත් කර ගන්නේ නම් එම භාණ්ඩය මතු පරපුර සඳහා ආරක්ෂා කළ යුතුය. මෙම ක්‍රියාවලිය සංරක්ෂණය නම් වේ. කෞතුක වස්තු සංරක්ෂණය මඟින් කෞතුක භාණ්ඩයක් යහපත් තත්ත්වයක තබා ගැනීමට භාණ්ඩය මූලින් පැවැතුන ස්වරූපයට කිසිඳු හානියක් නොවන අයුරින් පවත්වා ගැනීම සිදුකරනු ලබයි.

"ඕනෑම භාණ්ඩයක කොටසක් සඳහා යොදාගෙන ඇති ද්‍රව්‍යවල ස්වභාවය, ලක්ෂණ, ගබඩාකරණය, පරිහරණය හා ප්‍රතිකර්ම නිශ්චය කර ගැනීම සඳහා කෞතුක භාණ්ඩ වලට හානි ඇති කරන සාධක හා ඒවා පාලනය ගැන අවබෝධයක් ලබා ගැනීම සඳහා ද එම භාණ්ඩවල තත්වත්වය යහපත් කිරීමට

ගන්නා ඕනෑම ක්‍රියාවක් මේ සංරක්ෂණ ක්‍රියාවලියට ඇතුළත් වේ. ප්‍රලේඛනය, පර්යේෂණ ව්‍යාපෘති, ශිල්ප ක්‍රම වරින් වර විග්‍රහ කිරීම හා නව ශිල්ප ක්‍රම යොදා ගැනීම, පර්යේෂණ හා විද්‍යාත්මක ලිපි සකස් කිරීම මේ ක්‍රියාවලියට ඇතුළත් වන සෙසු කාර්යයන් වේ" (ඕ.පී. අග්‍රවල්).

**කෞතුකාගාර පරිහරණය**

කෞතුකාගාර වෙත පැමිණෙන නරඹන්නන් නිසා කෞතුක වස්තුවලට යම් බලපෑම් සිදුවන ආකාරය විමසීමේ දී ප්‍රධාන වශයෙන් එය ආකාර දෙකක් ඔස්සේ විග්‍රහ කළ හැකි වේ. එනම් දැනුවත්ව සිදු කරන හානි හා නොදැනුවත්ව සිදුවන හානි වශයෙනි. කෞතුකාගාර නරඹන්නන් ලෙස පැමිණ යම් ද්වේශ සහගත අරමුණු වලින් කෞතුක වස්තු විනාශ කිරීම මෙන්ම කෞතුක වස්තු සොරකම් කිරීම, ජාවාරම් කිරීම වැනි දේ හිතාමතා සිදු කරනු ලබන හානි ලෙස හඳුනා ගනු ලබයි.

කෞතුක වස්තු නරඹන්නන් ඒවා ස්පර්ශ කිරීම, ඡායාරූප හා වීඩියෝගත කිරීම් වලදී අධි සැර විදුලි ආලෝක භාවිතා කිරීම වැනි අවස්ථා බොහෝ විට නොදැනුවත්කම නිසා කෞතුක වස්තු හානි සිදුවන අවස්ථා වේ. මීට අමතරව භාවිතය හේතුවෙන් පරිහානියට පත්වීමේ අවදානම සහිත ස්වීඩනයේ වසා නෞකාව වැනි කෞතුකාගාර හා කෞතුක වස්තු ද හඳුනාගත හැකිය. කෞතුකාගාරයක සිදු වන සියලු ක්‍රියාකාරකම් එහි කාර්ය මණ්ඩලයට අභියෝගයකි. කෞතුකාගාරයක තැන්පත් වනුයේ එම රටේ මානව ප්‍රජාවට අයත් සංස්කෘතික ස්වභාවික විද්‍යාත්මක කාර්මික විද්‍යා හා තාක්ෂණ උරුමයට අදාළ මිල කළ නොහැකි අද්විතීය ගණයේ වස්තු වේ. කෞතුක වස්තු වල තිබෙන එකී ආවේණික ගුණාංගය ම ඒවායේ ආරක්ෂාවට තර්ජනයක්ව පවතී. කෞතුකාගාර භාරකාරත්වය විසින් සියලු ම හායනකාරක හඳුනාගෙන ඒ සඳහා නිසි ආරක්ෂක ක්‍රමවේදයක් යෙදිය යුතුය.

කෞතුකාගාරයක ඇති කෞතුක වස්තු එකතුවේ යථා භාරකාරත්වය දරන්නේ කෞතුකාගාර අධිකාරි හෝ ආරක්ෂක ධූරයන්හි කටයුතු කරන නිලධාරීන් වේ. එපමණක් ද නොව කෞතුකාගාරයක සිදු කරන ප්‍රදර්ශන, අධ්‍යාපන, ප්‍රලේඛන ආදී කටයුතු පිළිබඳ වගකීම් දරන්නේ ද කෞතුකාගාර භාරකරුවන් විසිණි. කෞතුකාගාරය තුල ඇති සියලුම කෞතුක වස්තු වල ප්‍රමුඛතම වගකීම රැඳී තිබෙන්නේ කෞතුකාගාර භාරකරුවන් අත වන හෙයින් එකී වගකීම් නිසි පරිදි ඉටු කිරීම සඳහා කෞතුකාගාරයේ සමස්ත කාර්ය මණ්ඩලය කළමනාකරණය කිරීමේ කටයුතු පැවරෙන්නේ ද කෞතුකාගාර භාරකරුවන්ට වේ.

**මහජන දායකත්වය**

කෞතුකාගාරයක් විසින් අත්පත් කර ගන්නා කෞතුක වස්තු සංරක්ෂණය කිරීම ලෙස හඳුනාගන්නේ යාන්ත්‍රික රසායනික සංරක්ෂණය හා නිවාරණ සංරක්ෂණයට ලක්කර කෞතුක වස්තුවක් ආරක්ෂා කිරීම හා කෞතුක වස්තවේ පැවැත්මට උචිත පරිදි කෞතුකාගාර පරිසරය සකස් කිරීමයි. මෙම සංරක්ෂණ කටයුතු කෞතුකාගාර භාරකාරත්වය විසින් ඊට අදාළ නිලධාරීන් යොදවා සිදුකරන ලබන්නක් වන අතර මහජනතාව නැතහොත් නරඹන්නන්ට ඒ සඳහා මැදිහත් විය නොහැක. එසේනම් කෞතුක වස්තු සංරක්ෂණ ක්‍රියාවලිය සඳහා මහජන දායකත්වය සිදු වන්නේ කෙසෙද? නරඹන්නන් වශයෙන් කෞතුකාගාර වෙත පැමිණෙන මහජනතාවට කෞතුකාගාර පද්ධතිය තුළ පවතින නීතිරීති වලට යටත් වෙමින් ස්වයං පාලනය හා සාමාන්‍ය සමාජ දැනුම පදනම් කොට ගනිමින් තම හැසිරීම් පවත්වා ගැනීම මූලික කර ගනිමින් මෙම සංරක්ෂණයට කාර්යයට වක්‍රව දායකත්වය සැපයිය හැකි වේ. මන්දයත් කෞතුකාගාරයක් තුළ දී අනුගමනය කරනු ලබන විශේෂ හැසිරීම් ක්‍රමවේදය මඟින් වක්‍රව සිදුවන්නේ කෞතුක වස්තු සංරක්ෂණය කිරීමට දායක වීමකි. තවදුරටත් එය පැහැදිලි කරන්නේ නම් නිහඬතාව, තදබදයකින් තොරව ගමන් කිරීම, කෞතුක වස්තු ස්පර්ශ නොකිරීම, කෞතුකාගාරය තුළ ආහාර පාන ආදීය නොගැනීම හා දුම් පානය නොකිරීම වැනි නරඹන්නන් විසින් අනුගමනය කරනු ලබන උපදෙස් ආදිය කෞතුක වස්තුවල පැවැත්ම සහ ආරක්ෂාව වෙනුවෙන් උපකාරී වන බැවිණි.

කෞතුක වස්තුවක් ස්පර්ශ නොකරන ලෙසට දන්වා ඇත්තේ එය ස්පර්ශ කිරීම මඟින් අතේ ඇති දහදිය තෙල් වැනි දේ සංරක්ෂණය කළ කෞතුක වස්තුව මත තැන්පත් වී ඒ මත හායන කාරක ඇති වීම මඟින් එහි භෞතික ස්වභාවයට හානි සිදුවන බැවිනි. බොහෝ විට එම ක්‍රියාවලිය පිළිබඳ කෞතුකාගාරය නැරඹීමට පැමිණෙන බහුතරයක් නරඹන්නන් තුළ අවබෝධයක් නොමැත. නමුත් ඔවුන් නොදැනුවත්ව හෝ එම උපදෙස් අනුගමනය කරයි නම් වක්‍රාකාරව ඔවුන් කෞතුක වස්තු සංරක්ෂණ ක්‍රියාවලියට දායක වී තිබේ. නමුත් බහුතරයක් නරඹන්නන් කෞතුක වස්තුවලට මෙවන් ආරක්ෂාවක් සපයා තිබීම වටහා ගන්නේ ඒවායේ ඉපැරණි බව නිසා ඒවාට ඇති මූල්‍යමය වටිනාකම මත මිනිසුන් විසින් සොරකම් කරාවි යැයි බියෙන් ඒවා ආරක්ෂා කරන බවයි. නරඹන්නන් තුළ හායනකාරකයන්ගේ බලපෑම පිළිබඳ දැනුවත්භාවයක් නොමැත. ඒ බව කෞතුකාගාර භාරකරුවන් වටහාගෙන තිබෙන බැවින් ඔවුන් නිරන්තරව සිය

කෞතුක වස්තු එකතුව ආරක්ෂා කර ගැනීම සඳහා ක්‍රමවේද යොදනු ලබයි. දිනපතා කෞතුකාගාරය නරඹන්නට පැමිණෙන විවිධ තරාතිරම්වල මහජනයාට කෞතුක වස්තුවල භෞතික රසායනික තත්ත්වයන් හෝ හායනකාරක පිළිබඳ පැහැදිලි කිරීම සාර්ථක නොවේ. එබැවින් පොදුවේ කෞතුක වස්තුවලට අවශ්‍ය ආරක්ෂාව සපයා දී හායනකාරක වලින් ආරක්ෂා වන පරිදි ප්‍රදර්ශන සකස් කිරීමට කෞතුකාගාර භාරකාරත්වය විසින් ක්‍රමවේද සකස් කරනු ලැබේ.

ඒ අනුව කෞතුක වස්තු සංරක්ෂණ ක්‍රියාවලිය සඳහා මහජනතාව නොදැනුවත්ව හෝ දායක වීම මෙන්ම කෞතුකාගාර විසින් මහජනතාව ඊට දායක කර ගැනීම මෙහිදී සිදු වේ.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණය සිදු කිරීමේ දී ප්‍රාථමික දත්ත හා ද්විතීක දත්ත උපයෝගි කර ගත් අතර දත්ත විශ්ලේෂණය සඳහා ස්වයං දත්ත විශ්ලේෂණ ක්‍රමවේදය උපයෝගි කර ගන්නා ලදී.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

කෞතුක වස්තු සංරක්ෂණ ක්‍රියාවලියේ දී මහජනතාවගේ දායකත්වය මෙම අධ්‍යයන ක්ෂේත්‍රය ඇසුරෙන් විග්‍රහ කර බැලීම සිදු කරන ලදී. එහි කෞතුක වස්තු සංරක්ෂණ ක්‍රියාවලිය සඳහා මහජන දායකත්වය සිදු වන්නේ කෙසේ ද යන්න අධ්‍යයන කර විග්‍රහ කර තිබේ. එසේම මෙම ක්ෂේත්‍රයෙහි ප්‍රවීණයන්ගේන් ලබාගත් සම්මුඛ සාකච්ඡාවල තොරතුරු විශ්ලේෂණය ද සිදු කර ඇත.

පර්යේෂණයට අදාල දත්ත විශ්ලේෂණයේ දී පුරාවිද්‍යා ක්ෂේත්‍රයට අදාල කෘති, පර්යේෂණ පත්‍රිකා හා වෙබ් පිටු අධ්‍යයන කරමින් ස්වයං විශ්ලේෂණයක් සිදු කරනු ලැබීය. එහි දී කෞතුකාගාර නීති, මහජන හැසිරීම සඳහා උපදෙස්, පොදු උපදෙස්, ස්වයං පාලනය, සංඥා පද්ධති, මහජනතාවගෙන් කෞතුක වස්තුවලට වන බලපෑම්, කෞතුක වස්තු සොරකම් කිරීම, කෞතුක වස්තු විනාශ කිරීම, ඡායාරූප ගත කිරීමේ ඇති වූ හානි, කෞතුක වස්තුවලට ආරක්ෂාව සැපයීම, ඡායාරූප ගැනීමේ තහනම, කෞතුකාගාර භාරකාරත්වයේ වගකීම, නරඹන්නා නිරීක්ෂණය කිරීම ආදී තොරතුරු විමර්ශනය කරන ලදී.

එසේ ම මෙම ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් ලෙස රංජිත් හේවගේ මහතා (කෞතුකාගාර අධිකාරි - ජාතික කෞතුකාගාරය), කුසුම්සිරි කොඩිතුවක්කු මහතා (කෞතුකාගාර පරිපාලක - ජේතවන කෞතුකාගාරය) තෝරාගෙන අධ්‍යයනයට අදාල ගැටලුව

සම්බන්ධයෙන් තොරතුරු විමසීය. එහි දී ඔවුන්ගේ අදහස වූයේ කෞතුකාගාරයක් මහජන සේවය සඳහා විවෘත වුව ද ඇතැම් මහජනයාගේ හැසිරීම් හේතුවෙන් කෞතුක වස්තු විවිධ තර්ජනවලට මුහුණ පෑමේ අවධානමකට ලක්ව තිබෙන බවයි. නරඹන්නාගේ නොදැනුවත්කම නිසාවෙන් හෝ ද්වේශ සහගත අරමුණු මත පදනම්ව හා කෞතුක වස්තු කෙරෙහි ඇති අධික ගෞරවය නිසා ද මෙවැනි විනාශයන් සිදු වන බවයි. ලොව පුරා කෞතුකාගාර ආශ්‍රිතව සිදු වී ඇති එවැනි සිදුවීම් රැසක් ඇති බවත් මේ හේතුවෙන් වර්තමානය වන විට කෞතුකාගාර භාරකාරත්වයට කෞතුක වස්තු හායනකාරක වලින් ආරක්ෂා කිරීමට වැඩි ප්‍රයත්නයක් යොදන බවයි. ඒ අනුව කෞතුකාගාර විසින් සිය එකතුව ආරක්ෂා කිරීම හා මහජන ප්‍රදර්ශනය සමබරව පවත්වා ගැනීමට උත්සාහ දරයි. මහජනතාව කෞතුකාගාර අචාර ධර්ම අනුගමනය කිරීම මඟින් වක්‍රාකාරව කෞතුක වස්තු සංරක්‍ෂණය සඳහා දායකත්වය ලබා දීමක් සිදුවන බව සමස්ථ අදහසයි.

## නිගමනය හා නිර්දේශ

මෙම පර්යේෂණය මඟින් නරඹන්නන් ලෙස කෞතුකාගාර හා සම්බන්ධ වන මහජනයා කෞතුක වස්තු සංරක්ෂණ ක්‍රියාවලිය සඳහා දායක වන ආකාරය පිළිබඳව විමසනු ලැබීය. අධ්‍යයන සීමාව ලෙස තෝරා ගනු ලැබුවේ කෞතුකාගාර තුළ මහජන ප්‍රදර්ශනය සඳහා තබා ඇති කෞතුක වස්තු වේ. ප්‍රාථමික වශයෙන් නිරීක්ෂණ හා සිද්ධි අධ්‍යයනයත් ද්විතීයික වශයෙන් සාහිත්‍ය මූලාශ්‍ර අධ්‍යයනය හා වෙබ් අඩවි දත්ත මත පදනම්ව පර්යේෂණය සිදු කරනු ලැබීය. කෞතුකාගාර නරඹන්නන් විසින් දැනුවත්ව හෝ නොදැනුවත්ව කෞතුක වස්තුවලට හෝ ඒවායේ පැවැත්මට සිදු කරනු ලබන බලපෑම් හඳුනාගනිමින් ඒවා කළමනාකරණය කිරීම කෞතුකාගාර භාරකාරත්වය විසින් සිදු කරයි. ආරක්ෂක වැඩ පිළිවෙල, නීතිරීති, ආචාර ධර්ම, උපදෙස් මඟින් නරඹන්නා ඊට අනුගත කර ගනී. ඒ ඔස්සේ දැනුවත්ව හෝ නොදැනුවත්ව කෞතුක වස්තු සංරක්ෂණ ක්‍රියාවලියට මහජනතාව වක්‍රාකාරව දායක වේ. ඒ අනුව කෞතුක වස්තු සංරක්ෂණය නොනවතින ක්‍රියාවලියක් වේ. ප්‍රදර්ශනය මත පදනම්ව යහපත් හා අයහපත් ලෙස ඒ සඳහා මහජන දායකත්වය සිදු වන බව නිගමනය කළ හැකිය. මෙම පර්යේෂණයේ දී ලොව ප්‍රකට කෞතුකාගාර ආශ්‍රිතව සිදු වූ සොරකම් හා විනාශ වීම් සැළකීමේ දී කෞතුක වස්තු වල ආරක්ෂාව පිළිබඳ ගැටළුකාරී තත්ත්වයක් පවතින බැව් හඳුනා ගත හැකිය. ඒ අනුව කෞතුකාගාර වෙත ඇතුලු වීමේ හා පිටවීමේ අනන්‍යතාවය තහවුරු කිරීම දැඩිව ක්‍රියාත්මක විය යුතුය. තවද කෞතුක වස්තුවේ ප්‍රමාණය නොසලකා, හැකිතාක් ආරක්ෂක කුටි තුළ ප්‍රදර්ශනය කිරීම මඟින් ඒවාට සමීප වීම හැකිතාක් අවම කළ යුතු වේ. කෞතුකාගාර විසින් ඉදිරිපත් කර ඇති නීති රීති, ආචාර ධර්ම

පද්ධතිය තුළින් ඒවා එලෙස ආරක්ෂා කිරීමට හේතු ඉදිරිපත් කර නොමැත. ඒ හේතුවෙන් කෞතුක වස්තුවක් ස්පර්ෂ නොකළ යුත්තේ ඇයි ද යන්න පිළිබඳ පොදු මහජනතාවට අවබෝධයක් නැත. එබැවින් ඒ පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමේ නිසි ක්‍රමවේදයක් සකස් කිරීම ද වැදගත් වේ. ඒ අතර කෞතුකාගාර නැරඹීමට පැමිණෙන පුද්ගලියින්ගේ දුරකතනයට කෙටි පණිවුඩයක් යොමු කළ හැකිය. විශේෂයෙන් නරඹන්නා පිළිබඳ විමසිලිමත් වීම සඳහා වන ආරක්ෂණ ක්‍රමවේද නිසි පරිදි ක්‍රියාත්මක කිරීම ඉතා වැදගත් වේ. ඒ මඟින් කෞතුක වස්තුවලට සිදු විය හැකි හානි රැසක් වළක්වා ගත හැකි වේ.

**ආශ්‍රිත මූලාශ්‍ර**


Harinarayana, N., 1995. *Care of Mueum Objects*, 1 වෙළුම.

Jayaraj, D., 2002. *Care of Paintings*, 8 වෙළුම.

Viduka, A. J., 2012. *Conservation and Finds Handing.* bangkok: UNESCO.

අබේසේකර, ච., 2009. ආරක්ෂණ ක්‍රියාවලිය සහ කෞතුකාගාර. *කෞතුකාගාර*, pp. 38-48.

කුමාරසිරි, ප., 1991. *ප්‍රකෘතිකරණය සහ සංරක්ෂණය.* කොළඹ: ශ්‍රීදේවි ප්‍රින්ටර්ස්.

ගම්ලත්,ඩ., 2009. කෞතුකාගාර ප්‍රදර්ශනය හා භාරකරුවකුගේ කාර්ය භාර්ය. *කෞතුකාගාර*, pp.25-32.

ලද්දූසිංහ, ස., n.d. කෞතුකාගාර වෘත්තියෙහි අභියෝග. *කෞතුකාගාර*, p. 19.

සිල්වා, ප., 1996. *කෞතුකාගාර විද්‍යා මූලධර්ම.* කොළඹ: s.n.

හැන්නේගෙදර, ක., 2009. කෞතුක වස්තු පරිහරණය. *කෞතුකාගාර*, pp. 1-6.

හේවගේ, ර., 2006. කෞතුකාගාර විද්‍යාව හා ශ්‍රී ලංකාවේ කෞතුකාගාර. *කෞතුකාගාර*, pp. 1-9.

හේවගේ, ර., 2007. කෞතුක වස්තු එකතුව ආරක්ෂා කිරීමේ වැඩපිළිවෙල. *කෞතුකාගාර*, pp. 1-9.

හේවගේ, ර., 2009. ආපදා කළමනාකරණය සහ කෞතුකාගාර. *කෞතුකාගාර*, pp. 7-18.

Anon., 2021. *OK Museum.org.* [Online] Available at: https://www.okmuseums.org/faqs/museum-etiquette/ [Accessed 20 01 2022].

Anon., n.d. *SGF Museum.org.* [Online] Available at: https://www.sgfmuseum.org/169/Museum-Dos-Donts [Accessed 19 01 2022].

*http://www.museum.gov.lk.* [Online] Available at: http://www.museum.gov.lk/web/index.php?lang=si [Accessed 20 01 2022].

උරුම අධ්‍යයන කේන්ද්‍රය

කැලණිය විශ්වවිද්‍යාලය

ISSN 2827-7430

9 772827 743002